# පෙරදිග සංගීතය

## ගුරු මාර්ගෝපදේශය

## 9 වන ශ්‍රේණිය

(2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk විද්‍යුත් තැපැල : info@nie.lk

**පෙරදිග සංගීතය**

**9වන ශ්‍රේණිය**

**ගුරු අත්පොත**

**ප්‍රථම මුද්‍රණය 2018**

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN

සෞන්දර්ය දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය** : www.nie.lk
**විද්‍යුත් තැපැල** : info@nie.lk

*මුද්‍රණය* : මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය

# අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි, යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**

**අධ්‍යක්ෂ ජනරාල්**

**ජාතික අධ්‍යාපන ආයතනය**

**මහරගම**

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් මඟින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක් වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය මඟින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදවු වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැකි ය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මඟ පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**ආචාර්ය මාබුල්ගොඩ සුමනරතන හිමි**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

## විෂයමාලා කමිටුව

| | |
|---|---|
| **උපදේශකත්වය හා අනුමතිය** | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| විෂය උපදේශනය | සුදත් සමරසිංහ අධ්‍යක්ෂ, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව. |
| **විෂය සම්බන්ධීකරණය** | ජානකී පතිරණගේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |

**බාහිර සම්පත් දායකත්වය**

| | |
|---|---|
| ඩබ්. වී. ජී. විතානගේ | අතිරේක කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, (විශ්‍රාමික),<br>කලාප අධ්‍යාපන කාර්යාලය, රත්නපුර. |
| කපිල මැද්දෙගොඩ | මධ්‍යස්ථානාධිපති,<br>සම්පත් මධ්‍යස්ථානය, මීගොඩ |
| කේ. කේ. එස්. ජයවික්‍රම | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (විශ්‍රාමික),<br>කලාප අධ්‍යාපන කාර්යාලය, පිළියන්දල. |
| රංජිත් ප්‍රියන්ත සිල්වා | කථිකාචාර්ය, ගුරු විද්‍යාලය, ගිරාගම. |
| ආර්. ඩී. පෙරේරා | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, මහනුවර. |
| ඊ. ඒ. ප්‍රේමසිරි | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, කළුතර. |
| නිහාරි සමන් කුමාරි මුණසිංහ | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, ශ්‍රී ජයවර්ධනපුර |
| ටී. එච්. එම්. ශාන්ත | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, මුලටියන |

**අභ්‍යන්තර සම්පත් දායකත්වය**

| | |
|---|---|
| ජානකී පතිරණගේ | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව. |

**භාෂා සංස්කරණය**

| | |
|---|---|
| අමරසිරි වික්‍රමරත්න මයා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>භාෂා අධ්‍යයන අංශය,<br>ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය,<br>ඔළුවිල්. |
| ශ්‍රීනාත් ගණේවත්ත | භාෂා සංස්කාරක. |

| | |
|---|---|
| **පරිගණක යතුරු ලියනය** | එම්. ඒ. ජේ. මංචනායක, කුඹුක්ගැටේ ම.ම.වි.<br>ජයරාණි ගුණතිලක |
| **පිටකවර නිර්මාණය** | රවීන්ද්‍ර තේනුවර |
| **විවිධ සහාය** | ප්‍රේමරත්න පෙරේරා<br>එන්. දීපා ශිරෝමණී |

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

සෞන්දර්ය අධ්‍යාපනය යටතේ පෙරදිග සංගීතය විෂයයක් වශයෙන් හැදෑරීමෙන් දරුවාට පාසල් ජීවිතය තුළ පමණක් නො ව පසු කාලීන ව ද තම ජීවිත පැවැත්ම සඳහා අවශ්‍ය වන සංවේදී අධ්‍යාත්මයක් හා නිපුණතා වර්ධනය කර ගැනීමට හැකි වනු ඇත. උක්ත කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙවර ප්‍රධාන නිපුණතා 9ක් හඳුන්වා දී ඇති අතර එම නිපුණතා කරා ළඟා වීමට අත්‍යවශ්‍ය නිපුණතා මට්ටම් පෙළක් ද හඳුන්වා දී ඇත. එම නිපුණතා මට්ටම්වල ඉහළ නිපුණතා මට්ටම් කරා සිසුවා ළඟා කරවීම 11වන ශ්‍රේණියේ දී අපේක්ෂිත ය.

මෙම නව විෂය නිර්දේශය සැකසීමේ දී, පෙරදිග සංගීත ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලවලින් ලබා ගත් දත්ත, ජාතික මට්ටමේ විභාග පරීක්ෂකවරුන්ගේ වාර්තා ඇසුරෙන් සිසුන් තුළ විශේෂයෙන් සංවර්ධනය විය යුතු විෂය කොටස් පිළිබඳ තොරතුරු පාදක කර ගන්නා ලදි. එසේ ම පළාත් බද සේවාස්ථ අධ්‍යයන සැසි, විෂය නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ පාසල් නියාමන පර්යේෂණ වාර්තා, කලාප මට්ටමෙන් පවත්වන ලද කාර්ය බද්ධ පරීක්ෂණ දත්ත, විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්ගේ හා විද්‍යාර්ථීන්ගේ අදහස්, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයන්හි තූර්ය වාදක කණ්ඩායම්වල අදහස්, සංගීත විෂය හදාරන ලද විද්වතුන්ගේ අදහස්, විද්‍යුත් මාධ්‍යයන්හි විකාශය වූ සාකච්ඡා හා වැඩසටහන් ඇසුරෙන් ලබා ගත් තොරතුරු මෙන් ම පාසල් පද්ධතියේ පෙරදිග සංගීත විෂය ඉගැන්වීම් කරන ගුරුභවතුන්ගේ හා දෙමවුපියන්ගේ අදහස් ද විෂය නිර්දේශ සම්පාදනයේ දී විශේෂයෙන් අවධානයට ලක් කරන ලදි.

විෂය නිර්දේශය ප්‍රායෝගික නැඹුරුතාවකින් යුතු ව ගොඩනඟා ඇති අතර ක්‍රියාකාරකම් සඳහා හඳුන්වා දී ඇති ගුණාත්මක යෙදවුම් හැකිතාක් යොදා ගනිමින් පාඩම සංවර්ධනය කිරීම ගුරුභවතාගේ වගකීම යි. පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළ යටතේ හඳුන්වා දී ඇති නිදර්ශක ඇගයීම් උපකරණ ග්‍රන්ථය ඇසුරු කර ගනිමින් දරුවන්ගේ ඇගයීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට ඔබට සක්‍රිය ව දායක වීමට සිදු වේ. එසේ ම ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසු වන ආකාරයට ඉතා දක්ෂ ලෙස ප්‍රායෝගික කොටස්වල නිපුණත්වයට දරුවා ළඟා කරවීම ද, පෙලඹවීම ද ගුරුභවතාගේ වගකීම වේ.

ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේ දී හඳුන්වා දී ඇති ප්‍රවේශවලට අමතර ව වෙනත් සුදුසු ක්‍රමවේද නිර්මාණශීලී ව යොදා ගැනීමේ හැකියාව හා නිදහස ඔබට ඇත. ක්‍රියාකාරකමෙහි දක්වා ඇති ඉගෙනුම් පල ළඟා කර ගත හැකි වන අයුරින් වඩාත් ඵලදායි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සැලසුම් කර ගැනීම තුළින් සාර්ථක ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට ඔබට හැකි වනු ඇත.

# පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | iv |
| විෂයමාලා කමිටුව | v |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vi |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | viii-xx |
| වාර සටහන | xxi-xxiii |
| ක්‍රියාකාරකම් සන්තතිය | 1-126 |

# විෂය නිර්දේශයේ අන්තර්ගතය

# හැඳින්වීම

ජාතික අධ්‍යාපන ආයතනය දේශයේ සමස්ත දරු කැල වෙනුවෙන් පාසල් පද්ධතිය වෙත 2015 සිට නිර්දේශ කරන ලද නව විෂයමාලා ප්‍රතිසංස්කරණයෙහි දෙවන පියවර 2017 ක්‍රියාවට නැංවේ. ඒ අනුව මෙම වසරේ 9 ශ්‍රේණිය සඳහා වූ නව විෂය නිර්දේශයන් නව්‍යකරණයන් සහිත ව හඳුන්වා දෙමින්, එහි ක්‍රියාත්මක භූමිකාව හිමි ගුරුවරයාට නිසි මඟ පෙන්වීම් ලබා දීම පිණිස මෙම ගුරු මාර්ගෝදේශය සකස් කොට ඇත.

විෂයමාලා ප්‍රතිපත්තිය අනුව වසර 8කට වරක් එළැඹෙන මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය විසින් ජාතික ආධ්‍යාපනික අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහි ලා පාසල් පද්ධතියට ඒ ඒ විෂයයන් සඳහා නව ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රම ශිල්ප, සංකල්ප හඳුන්වා දෙනු ලබන අතර, සෞන්දර්ය විෂයයන්හි මෙතෙක් නිර්දේශිත ගී, කවි, කතා, සංස්කෘතිකමය කරුණු, තේමා, සම්ප්‍රදායයන්හි විවිධත්ව, ඈ සම කාලීන අවශ්‍යතා මත නව දේශීය දර්ශනයට අනුකූල ව අනාගතයට ගැළපෙන පරිදි ඉදිරිපත් කර ඇත.

අප විසින් විෂයමාලා සැලසුම්කරණයේ දී පළමු කොට ම හඳුනා ගන්නා ලද 6-13 තෙක් පුළුල් වූ විෂය සන්ධාරය (Curriculum Grid) නිපුණතා හා නිපුණතා මට්ටම් ලෙස දරුවාගේ වර්ධන හා චින්තන අවධීන්ට අනුව ක්‍රමික ව පෙළගස්වා ඇත. ඒ අනුව 6 හා 10 ශ්‍රේණි සඳහා නිර්දේශිත විෂය කරුණු සමඟ අවියෝජනීය සබඳතාවක් මෙන් ම ක්‍රමික වර්ධනයක් සිදු වන පරිදි 7 සහ 11 ශ්‍රේණි විෂය නිර්දේශ සැලසුම් කොට ඊට අනුකූල ව මෙම 9 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය රචනා කොට ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශය හරහා විෂය නිර්දේශ තුලනාත්මක ව දක්වා ඇති විෂය කරුණු පිළිබඳ සීමා නිර්ණයන් නිවැරැදි ව තෝරා බේරා ගැනීම, දරුවා තුළ සංකල්ප සාධනයෙහි ලා විෂය කරුණු ඉදිරිපත් කිරීමේ අනුපිළිවෙළ හඳුනා ගැනීම, පාඩම දරුවාට පිළිගැන්වීමෙහි ලා යෝජිත සුවිශේෂ ක්‍රම ශිල්ප හඳුනා ගැනීම යන ශක්‍යතා ප්‍රමාණාත්මක ව ගුරුවරයා වෙත ලැබෙනු ඇත.

අප විෂයමාලා කමිටුව විසින් රචිත මෙම පොත පරිහරණය කරමින් ඔබ, විෂය කරුණුවල අවශ්‍ය මූලික දැනුම අත්පත් කර ගත්ත ද, යෝජිත විෂය කරුණුවල සමාජ භාවිතය පිළිබඳ ඔබගේ අවදිමත් බව වැදගත් ය. ඒ සඳහා විෂය භේදයකින් තොර ව සංගීත කෘතිවලට සවන් දීම, නර්තන, නාට්‍ය ප්‍රසංග හා චිත්‍රපට නැරඹීම, චිත්‍ර ප්‍රදර්ශන නැරඹීම ආදිය ඉතා හොඳ ප්‍රබෝධවත් බවක් හා පෙළඹවීමක් ඔබ තුළ ජනිත කරනු ඇත.

ඒ අනුව ගුරු මාර්ගෝපදේශය ද, උදවු අත්පොත ද ඒවායේ ඇතුළත් පණිවිඩ, හැඳින්වීම් ඇතුළු සියල්ල සහිත ව පූර්ණ වශයෙන් ම කියවන්න. ඉන් ගුරුවරයකු ලෙස ඔබ සතු විය යුතු අත්‍යවශ්‍ය ගුණයක් වූ ''කියවීමේ පුරුද්ද'' ඔබට ලැබ ගන්නට හැකි වනු ඇත.

මේ සියලු ව්‍යායාමයන්හි, කර්තව්‍යයන්හි අග්‍ර ඵලය අපගේ දරු පරපුර වෙත ලබා දෙන්නට ඔබගේ ගුරු භූමිකාව ශක්තිමත් වේ වා! යන්න මාගේ ඒකායන පැතුම යි.

ශාස්ත්‍රපති සුදත් සමරසිංහ,
අධ්‍යක්ෂ (සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව),
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.

# ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කර ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහය විය යුතුය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරණු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික සෘජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ ගැනීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාවය තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැගි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුලු වෙනත් ධනාත්මක අංගලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපන තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්පහා කුසලතා පෝෂණය කිරීම

(උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු කර ගැනීමට දායක වනු ඇත

## (I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය මත තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාවය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් කර ගනී.

**සාක්ෂරතාව** : සාවධානව ඇහුම්කන් දීම පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල්ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගලපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාවය** : පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද සේවා පරිශ්‍රයක් තුළදී ද පෞද්ගලික ජීවිතයේදී ද තොරතුරු

සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

## (II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයන්
- චිත්තවේගී බුද්ධිය

## (III) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, තීන්ද්‍ර, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

## (IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
- හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
- වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම

යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

## (V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

## (VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

## (VII) 'ඉගෙනීමට ඉගෙනුම' පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

(උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

# පෙරදිග සංගීත විෂයයේ අරමුණු

1. රාගධාරී සංගීතාංග සහ සිද්ධාන්ත ඇසුරින් ශික්ෂණය ලබා ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

2. ශ්‍රී ලාංකේය සංස්කෘතික උරුමය හා බැඳි ජනගායන, වාදන පිළිබඳ විමර්ශනාත්මක අත්දැකීම් ලබා එහි අගය විශ්ව සංගීතය කරා රැගෙන යාමට පෙළඹෙයි.

3. ශ්‍රී ලාංකේය, භාරතීය සහ බටහිර සම්භාව්‍ය සංගීතඥයින්ගේ නිර්මාණ පරිශීලනය කරමින් සම්භාව්‍ය සංගීත රසාස්වාදයේ හුරුව ලබයි.

4. ශ්‍රී ලාංකේය ව්‍යවහාරික සංගීත ක්ෂේත්‍රයේ ප්‍රබලතම අංගය ලෙසට අගය කරමින් සරල ගී සංකල්පයේ විකාශය සහ නූතන ස්වභාවය පිළිබඳ ව ප්‍රායෝගික සංවාදයේ යෙදෙයි.

5. ශ්‍රී ලංකාවේ සහ උත්තර භාරතයේ වඩාත් ජනප්‍රිය වූ සම්භාව්‍ය ගණයේ ලා සැළකෙන තෝරාගත් චිත්‍රපට ගීත ප්‍රායෝගිකව අධ්‍යයනය කරයි.

6. දේශීය රංග සම්ප්‍රදායන් හා බැඳි රංග ශෛලීන් සහ සංගීත ශෛලීන් පිළිබඳ අධ්‍යයනය කරමින් නූතන ප්‍රසංග වේදිකාවට ගැළපෙන ලෙස නිර්මාණ කරණයේ යෙදෙයි.

7. බටහිර සංගීත නිර්මාණ විමර්ශනය කර විශ්ව සංගීත නිර්මාණ අගයයි.

8. විශ්ව සංගීතාංග ඇසුරු කිරීමටත් දේශීය සංගීතාංග විශ්වයට මුදා හැරීමටත් අවශ්‍ය මට්ටමට සංගීත ප්‍රස්තාකරණයේ බටහිර ක්‍රමවේද පිළිබඳ අභ්‍යාසයේ යෙදෙයි.

9. සංගීතයේ ජීව විද්‍යාත්මක, භෞතික විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක පදනම විග්‍රහ කරමින් නව තාක්ෂණ විධි සංගීත නිර්මාණකරණයේ දී යොදා ගැනීම පිළිබඳ අත්හදා බැලීම් කරයි.

10. සංගීත විෂය ඉගෙනීමට, සංරක්ෂණය සහ නිර්මාණකරණයට අන්තර් ජාලය සහ පරිගණකය යොදා ගන්නා අයුරු ප්‍රායෝගිකව හඳුනා ගනියි.

11. නූතන වෙළඳපොළට ගැලපෙන පරිදි සංගීත භාණ්ඩ නිෂ්පාදනයට පෙළඹෙයි.

## පාසල් ප්‍රතිපත්ති සහ වැඩසටහන්

ශිෂ්‍යයාගේ විචාර ශක්තිය වර්ධනය කිරීම සඳහා ගණිතය, විද්‍යාව, භාෂාව ආදි විෂයයන් අවශ්‍ය වන්නා සේම ඔවුන්ගේ වින්දන හා නිර්මාණාත්මක හැකියා වර්ධනය කිරීම සඳහා සෞන්දර්ය විෂයයන් ඉගැන්වීම අත්‍යවශ්‍ය වේ. නිපුණතා පාදක ක්‍රියාකාරකම් පන්ති කාමරය තුළ ක්‍රියාත්මක කිරීමෙන් ශිෂ්‍යයාගේ සංගීත විෂය හා බැඳි ප්‍රායෝගික කුසලතා වර්ධනය කිරීම මෙන් ම යහපත් ආකල්ප වර්ධනයෙන් සුසමාහිත පෞරුෂයක් ගොඩනැගීම අපේක්ෂා කෙරේ.

මෙම කාර්යයෙහිලා විවිධ ප්‍රායෝගික අත්දැකීම් ලැබිය හැකි පහත සඳහන් විෂය සමගාමී ක්‍රියාකාරකම්හි සිසුන්ට යෙදීමට අවශ්‍ය අවකාශ සැලසීම ඉතා වැදගත් වේ.

1. ළමා ගීත ගායන වාදන තරග
2. ළමා නාට්‍ය තරග
3. ගායන, වාදන ප්‍රදර්ශන
4. සෞන්දර්ය කලා සංගම් පිහිටුවීම
5. පන්ති මට්ටමේ කෙටි විවිධ ප්‍රසංග
6. වාර්ෂික විවිධ ප්‍රසංග
7. නව නිර්මාණාත්මක ක්‍රියාකාරකම් මගින් ආදේශ භාණ්ඩ නිර්මාණ
8. බැති ගී ප්‍රසංග
9. පරිගණක තාක්ෂණය ඇසුරෙන් නිර්මාණ
10. උදෑසන රැස්වීම ආශ්‍රිතව කරනු ලබන ගායන වාදන ක්‍රියාකාරකම්
11. පාසල අවට ප්‍රදේශයේ පැවැත්වෙන විශේෂ සංගීත උත්සව හා ශාන්තිකර්ම
12. රාජ්‍ය උත්සව හා බැඳි ගායන වාදන අංග
13. පාසල් තූර්ය වාදන කණ්ඩායම්

මෙම ක්‍රියාකාරකම් නිර්දේශිත විෂය කරුණු හා බද්ධ කිරීම තුළින් පන්තිකාමරය තුළ ලද නොහැකි සුවිශේෂ ඉගෙනුම් අත්දැකීම් ලැබීමට සිසුන්ට ඉඩකඩ ලැබේ. එම නිසා සිසුන්ගේ සාමාන්‍ය අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය ක්‍රියාකාරිත්වය හා විශේෂයෙන්ම ඉගෙනුමට අවශ්‍ය මානසික සූදානම ප්‍රවර්ධනය කර ගැනීමට හැකි වේ.

# තක්සේරුව හා ඇගයීම

පෙරදිග සංගීත විෂය තක්සේරුව හා ඇගයීම සිදුවන්නේ පන්තිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් සිදුවන අවස්ථාවේදීම ය. අදාළ ක්‍රියාකාරකමට සුදුසු නිර්ණායක භාවිත කරමින් සිසුන් ඇගයීමට ලක් කළ යුතු ය. සිසුන්ගේ දක්ෂතා හඳුනාගෙන ඒවාට අවශ්‍ය උපස්ථම්භන ලබාදීමත් සුදුසු ප්‍රතිපෝෂණ ලබාදීමත් මෙහි දී සිදු විය යුතු ය.

සිසුන්ට ඉදිරිපත් කරනු ලබන සෑම ක්‍රියාකාරකමක දී ම තක්සේරුව හා ඇගයීම සිදුකිරීමට අවස්ථා තිබේ. සිසුන් කණ්ඩායම් වශයෙන් ගවේෂණයේ යෙදෙන අවස්ථා, තක්සේරවටත් කණ්ඩායම් අනාවරණ ඉදිරිපත් කෙරෙන හා අදහස් විස්තාරණය කෙරෙන අවස්ථා ඇගයීමටත් යොදා ගත හැකි වේ.

සිසුන් ක්‍රියාකරකම්වල යෙදෙන අවස්ථාවල දී ඔවුන්ට සමීපව නිරීක්ෂණය කිරීමෙන් ඔවුන්ගේ හැකියා, නොහැකියා, ශක්තීන් හා දුර්වලතා හඳුනාගනිමින් පන්තියේ සෑම ශිෂ්‍යයෙකුම අවම ප්‍රවීණතා මට්ටමට ගෙන ඒමට ගුරුවරයා කටයුතු කළ යුතු වේ. මේ ක්‍රියාවලිය තක්සේරුව නම් වේ. එසේම සිසුන් ස්වයං අනාවරණ ඉදිරිපත් කරන හා අදහස් විස්තාරණය කරන අවස්ථාවලදී ඔවුන් ළඟා කරගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කරමින් හා විශ්ලේෂණය කරමින් ඇගයීම ක්‍රියාත්මක කළ හැකි වේ.

සිසුන් කණ්ඩායම් සමස්ත පන්තිය හමුවේ සාමූහික ව ඉදිරිපත් කරන අදහස්, ඇගයීම සඳහා යොදාගත හැකි පළමු අංශය බව මේ අනුව පැහැදිලි වේ. එම අදහස් නිවැරදි කිරීමට, වැඩි දියුණු කිරීමට හා විස්තාරණය කිරීමටත් කරණු ලබන ප්‍රයත්න ඇගයීම සඳහා පාදක වන දෙවන අංගය වේ.

රාගධාරී සංගීතයට අයත් සුවිශේෂ ශාස්ත්‍රීය කොටස් හා රාග අධ්‍යයනය පාසල් අධ්‍යාපනයේදී ආරම්භ කරනුයේ 9 ශ්‍රේණියේ සිට ය. මේ නිසා සිසුන්ගේ ප්‍රායෝගික හැකියාව පිළිබඳ තක්සේරුවක් හෝ ඇගයීමක් වාර තුනේදී ම නිමකල යුතුවේ. මේ සඳහා පහත දැක්වෙන ලෙස මග පෙන්වනු ලැබේ.

01. ලිඛිත ඇගයීම.

| | | | |
|---|---|---|---|
| I කොටස - බහුවරණ ප්‍රශ්න 20 | (විනාඩි 20) | - ලකුණු | 20 |
| II කොටස - ව්‍යුහගත රචනා ප්‍රශ්න 03 | (විනාඩි 60) | - ලකුණු | 30 |
| | | මුළු ලකුණු | 50 |

02. ප්‍රායෝගික ඇගයීම. (ගායනය/වාදනය)

1. පහත දැක්වෙන අංග සහිතව නිර්දේශිත රාගය ගායනය/වාදනය කරන්න.

| | ලකුණු |
|---|---|
| 1.1 රාගයේ ස්වර අභ්‍යාසයක් | 04 |
| 1.2 රාගයේ සර්ගම් ගීතයක් | 04 |
| 1.3 රාගයේ මධ්‍යලය ගීතය | 04 |
| 1.4 රාගයේ සංගති ඇතුළත් කෙටි ස්වර ඛණ්ඩයක් | 04 |
| 1.5 ලක්ෂණ ගීතයේ ස්ථායි/අන්තරා | 04 |
| | 20 |

2. නිර්දේශිත තූර්ති ගීතයක් ගායනය/වාදනය

ලකුණු
20

3. ව්‍යවහාරික සංගීතයේ ගීතයක් ගායනය/වාදනය. ලකුණු 20
(කණ්ඩායම් ගීතයක්/නව නාට්‍ය ගීතයක්
ගීත නාට්‍ය ගීතයක්/ජන ගී ආශ්‍රිත සරල
ගීතයක්/ඉංග්‍රීසි ගීතයක්)

4. ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයක් ගායනය/වාදනය
(විදුලි ඕගන්/එකෝඩියන්/සර්පිනා) ලකුණු 20

5. වාදනය

| | | |
|---|---|---|
| I | ස්වර වාද්‍ය භාණ්ඩයක් වාදනය (වයලින්/බටනළා/එස්රාජ්/දිල්රුබා/ සිතාර්/සන්තූර්/සරෝද්/මැන්ඩලීන්/ගිටාර්) | 12 |
| II | රිද්ම රටාවක්/තාලයක් භාණ්ඩ මගින් වාදනය | 08 |
| | | 20 |

මෙහිදී ඉහත ක්‍රියාකාරකම් සියල්ල එක් දිනයක දී ම නිමකළ යුතු යැයි නියමයක් නැත. අවශ්‍ය නම් එක් එක් ප්‍රශ්නයට ගැලපෙන විෂය කොටස උගන්වා අවසානයේ දී ඇගයීම සිදුකර ලකුණු සටහන් තබාගත හැකිය. වාර අවසාන ලිඛිත ඇගයීමේ ලකුණු සමඟ මෙම ප්‍රායෝගික ලකුණුද එක් කර ශිෂ්‍යයාට හිමි අවසාන ලකුණ තීරණය කල යුතුය.

| | | | |
|---|---|---|---|
| I. | ලඛිත ප්‍රශ්න පත්‍රයට | - | ලකුණු 50 |
| II. | ප්‍රායෝගික ලකුණු (100/2) | - | ලකුණු 50 |
| | | අවසාන ලකුණ | 100 |

# 9 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන /වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි. | ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනී. | •බිලාවල්, භූපාලි, කාෆි රාග විස්තර<br>• එම රාගවල ස්වර අභ්‍යාස<br>• එම රාගවල සර්ගම්<br>• එම රාගවල මධ්‍යලය ගීත<br>• බිලාවල්, භූපාලි, කාෆි රාගවලට අයත් රාගාංග ඇතුළත් කෙටි ස්වර ඛණ්ඩ ගායනය | 1.1 බිලාවල්, භූපාලි, කාෆි, රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීත ගායන හැකියා ප්‍රදර්ශනය කරයි. | 15 |
| | •මේ දක්වා අධ්‍යයනය කළ තාලරූප ප්‍රායෝගික අභ්‍යාසයේ යෙදෙයි. | • සපයා ගත හැකි අවනද්ධ භාණ්ඩයක් ආශ්‍රයෙන් මාත්‍රා දෙකේ, තුනේ, හතරේ සහ මිශ්‍ර තාල සරල ව වාදනය<br>• $^{5}_{4}$ $^{7}_{4}$ Rhythm (By using Darbak, Congo Drum, Jembe, Tamborine, Kahon) | 1.2 මාත්‍රා කැටි මිශ්‍ර වූ හින්දුස්ථානී සහ දේශීය තාල පද ප්‍රායෝගිකව දක්වයි. | 03 |
| | රාගභාවය සහ එකිනෙක වෙනස්කම් ඇතිවීමට බලපාන හේතු විමර්ශනය කරයි. | • මේලය, රාග, ජාතිය වාදී, සංවාදී, අනුවාදී, විවාදී, වර්ජිත ස්වර<br>•ආරෝහණ අවරෝහණ, මුඛ්‍යාංග<br>•බිලාවල්, භූපාලි, කාෆි රාගවලට අයත් ලක්ෂණ ගී ගායනය කරමින් රාග ලක්ෂණ විමසයි. | 1. 3 රාගධාරී සංගීතය ප්‍රායෝගිකව හැදෑරීමට අවශ්‍ය සිද්ධාන්තමය දැනුම ලබයි. | 09 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0 වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනිය | 2.1වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි. | • විවිධ ස්වරස්ථාන ශ්‍රැති කර ගනිමින් ස්වර පුවරුවෙන් ගීත වාදනය කරයි. (මධ්‍යමය සහ පංචමය ශ්‍රැති කර ගනිමින් බිලාවල් කාෆි ආරෝහණ අවරෝහණ සහ එම ස්වර ශ්‍රැති කර ගනිමින් ගීත වාදනය) | 2.1 මධ්‍යමය සහ පංචමය ශ්‍රැති කර ගනිමින් ස්වර පුවරු භාණ්ඩ වාදනයේ යෙදෙයි. | 05 |
| | | • විවිධ ස්වරස්ථාන ශ්‍රැති කර ගනිමින් ස්වර වාද්‍ය භාණ්ඩ මගින් ගීත වාදනය කරයි. (මධ්‍යමය සහ පංචමය ශ්‍රැති කර ගනිමින් බිලාවල්, කාෆි ගීත වාදනය) | 2.2 මධ්‍යමය සහ පංචමය ශ්‍රැති කර ගනිමින් ස්වර වාද්‍ය භාණ්ඩ වාදනයේ යෙදෙයි. | 05 |
| | | • සර්පිනාවේ ව්‍යුහය, යාන්ත්‍රණය, හා භාවිතය | 2.3 සර්පිනාවේ යාන්ත්‍රණය හඳුනාගෙන ආරක්ෂාකාරී ලෙස භාවිත කරයි. | 02 |
| 3.0 සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ළඟා කර ගැනීමට හුරුවෙයි. | 3.1 ජන සංගීතය ආශ්‍රයෙන් නිර්මාණය කළ ගීත විමසයි. | • ජන ගී තනු ආශ්‍රිත සරල ගී (පහත දක්වෙන ගී අතරින් එකක් දැතට වළලු-සී.ද.ඇස්.කුලතිලක වන්නම් සවුදම් - ලයනල් රංවල මල්සරා - රෝහණ බැද්දගේ) | 3.1 සංගීත නිර්මාණ කාර්යයේ දී ශ්‍රී ලංකා ජනසංගීතය පාදක කර ගත හැකි ආකාරය පිළිබඳ අත්දැකීම් ලබයි. | 02 |
| | 3.2 ලබාගත් සංගීතමය අත්දැකීම් ප්‍රාසංගිකව ඉදිරිපත් කරමින් සතුට ලබයි. | • වාර්ෂික විවිධ ප්‍රසංගය | 3.2 මෙතෙක් උගත් සංගීතමය අත්දැකීම් ප්‍රාසංගිකව ඉදිරිපත් කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0 දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි. | මහනුවර යුගය හා සම්බන්ධ ගී පිළිබඳ විචාරාත්මක අදහස් දක්වමින් ගායනය කරයි. | • වන්නම් ප්‍රශස්ති සහ හටන් ගී පිළිබඳ සංස්කෘතිකමය තොරතුරු<br>• උකුසා වන්නම ගායනය.<br>• ප්‍රශස්ති සහ හටන් ගී ගායනය | 4.1 වන්නම් ප්‍රශස්ති සහ හටන් ගී පිළිබඳ සංස්කෘතිකමය තොරතුරු රැස් කරමින් ගායනයේ යෙදෙයි. | 02<br>02<br>03 |
| | දේශීය අවනද්ධ වාද්‍ය භාණ්ඩවල විශේෂතා සාකච්ඡා කරමින් අගය කරයි. | • පංචතූර්ය වාදනය සහ දවුල, තම්මැට්ටම, ගැටබෙරය, පහතරට බෙරය යන අවනද්ධ වාද්‍ය භාණ්ඩයන් හඳුනාගැනීම. | 4.2 දේශීය අවනද්ධ භාණ්ඩ කිහිපයක ගති ස්වභාවය වටහා ගනියි. | 03 |
| | | • රිද්ම රටා වාදනය | 4.3 අවනද්ධ වාද්‍ය භාණ්ඩ යොදා ගනිමින් රිද්මරටා වාදනය කරයි. | 02 |
| 5.0 සරල සංගීතය හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි. | 5.1ඉංග්‍රීසි බසින් රචිත ගීතයක් ගායනය | • I have a Dream (ABBA) යන ගීතය ගායනය | 5.1 ඉංග්‍රීසි ගීත ගායනයේ හුරුව ලබයි. | 02 |
| | 5.2 මව්පිය ගුණ වරුණ ගී ගායනයේ යෙදෙයි. | • අම්මා සඳකි, සියක් ආයු ලැබ, ආදරයේ උල්පත වූ අම්මා , දුනුකෙයියා මලක් වගේ යන ගී අතරින් එකක් ගායනය. | 5.2 මව්පිය ගුණ වරුණ ගී ගයමින් රසවිඳියි. | 02 |
| | 5.3 ශ්‍රී ලංකාවේ පැවති කණ්ඩායම් ගී පිළිබඳ සාකච්ඡා කරමින් අගය කරයි. | • ශ්‍රී ලංකා ගුවන්විදුලිය ආශ්‍රිතව නිර්මාණය වූ කණ්ඩායම් ගීත වල සාධනීය ලක්ෂණ<br>• තෝරාගත් කණ්ඩායම් ගීයක් ගායනය හා නිර්මාණය කළ නව කණ්ඩායම් ගීයක් ගායනය | 5.3 කණ්ඩායම් ගී පිළිබඳ අගය කරමින් ප්‍රායෝගික අත්දැකීම් ලබයි. | 02<br>02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 රංග සම්ප්‍රදායන්හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි. | • නව නාට්‍ය ශෛලියේ ස්වභාවය සහ සංගීතය විමසයි. | • හුණුවටය/නරිබෑණා/තාරාවෝ ඉගිලෙති/බෙරහඬ/නල දමයන්ති යන නාට්‍ය අතරින් දෙකක ගීත 2 ක්.<br>• දෙපානෝ/පේමතෝ ජායති සෝකෝ, යන ගීත නාට්‍යවලින් එක් ගීතයක්<br>• නූර්ති ගීත තුනක් | 6.0 නවනාට්‍ය සහ ගීත නාට්‍ය අතරින් තෝරා ගත් ගීත ගායනයේ යෙදෙයි. | 02<br><br>02<br><br>03 |
| 7.0 සංගීත නිර්මාණ කාර්යයයේ අත්හදා බැලීම් කරයි. | ජනප්‍රිය සංගීතයේ බහුලව භාවිත වන සංගීත භාණ්ඩ පිළිබඳ විමසයි.<br><br>පාසල් පද්ධතියතුළ භාවිතවන අපරදිග තූර්යවාද්‍ය භාණ්ඩ පිළිබඳ විමසයි. | • ගිටාරය ස්වර පිහිටන අයුරු සහ (E,D,C, Minor Chords & D,G,A, Major Chords) වාදනය<br>• එකෝඩියන් භාණ්ඩයේ ස්වර පිහිටන අයුරු<br>• විදුලි ඕගනයේ මූලිකාංග ( Settings , Voice, Style , Tempo, Auto Accompany )<br><br>• අපරදිග තූර්යවාද්‍ය භාණ්ඩ වර්ගීකරණය.<br>• පාසල් පද්ධතිය තුළ භාවිතවන අපරදිග සංගීත භාණ්ඩ අතරින් ප්‍රචලිත භාණ්ඩ කිහිපයක රූපසටහන් ( Trumphet, Trombone, Euphonium, Oboe, Clarinet, Saxophone ) | 7.1 ජනප්‍රිය සංගීතයේ බහුලව භාවිත වන සංගීත භාණ්ඩ කිහිපයක ප්‍රායෝගික හැකියාව ලබයි.<br><br>7.2 අපරදිග සංගීත භාණ්ඩ වර්ග කරමින් ප්‍රචලිත භාණ්ඩ කිහිපයක ස්වභාවය වටහා ගනියි. | 03<br><br>02<br>02<br><br>02<br>02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| 8.0 සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත් දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි. | බටහිර සංගීත සංකල්ප හඳුනා ගනිමින් භාවිත කරයි. | • Sharps, Flats, Natural Marks<br>• Clef, Rest marks, Tie<br>• F.G, C, B flat Scales, (Major & Minor)<br>• Time signature<br>• Key signature F.G, C, B flat Scales, (Major & Minor) | 8. බටහිර ක්‍රමයට සංගීත ප්‍රස්තාර කිරීමේ කුසලතාවය ලබයි. | 07 |
| 9.0 සංගීතයේ තාක්ෂණික මෙවලම් සහ භෞතික විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි. | සංගීත ප්‍රසංගයක අත්‍යවශ්‍ය තාක්ෂණික මෙවලම් හසුරුවන ආකාරය පිළිබඳ සොයා බලයි. | • මයික්‍රෆෝනය, ඇම්ප්ලිෆයරය, බෆල් මික්ස්චර් | 9. සංගීත ප්‍රසංගයක යොදා ගන්නා අත්‍යාවශ්‍ය තාක්ෂණික මෙවලම් කිහිපයක් හසුරුවා ගැනීමේ හැකියාව ලබයි. | 04<br>--------<br>96<br>-------- |

| නිපුණතා මට්ටම | අනුක්‍රමික පාඩම් අංකය | විෂය මාතෘකාව/ ක්‍රියාකාරකම | කාලච්ඡේද |
|---|---|---|---|
| 5.2 මව්පිය ගුණ වරුණ ගී ගායනයේ යෙදෙයි.<br><br>6.3 නූර්ති ගී ගායනයේ යෙදෙයි. | 01<br><br>02 | • අම්මා සඳකි, සියක් ආයු ලැබ, ආදරයේ උල්පත වූ අම්මා , දුනුකෙයියා මලක් වගේ යන ගී අතරින් එකක් ගායනය.<br>• නූර්ති ගීතයක් ගායනය | 02<br>01 |
| 1.1 ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනී.<br>1.3 රාගභාවය සහ එකිනෙක වෙනස්කම් ඇතිවීමට බලපාන හේතු විමර්ශනය කරයි. | 03<br>04<br>05<br>06<br>07<br>08 | • බිලාවල් රාගයේ ස්වර අභ්‍යාස<br>• බිලාවල් රාගයේ සර්ගම්<br>• බිලාවල් රාගයේ මධ්‍යලය ගීතය<br>• බිලාවල් රාගයට අයත් රාගාංග ඇතුළත් කෙටි ස්වර ඛණ්ඩ ගායනය<br>• මේලය, ජාතිය වාදි, සංවාදී , අනුවාදි ,විවාදි ,වර්ජිත ස්වර යන පාරිභාෂික පද.<br>•ආරෝහණ අවරෝහණ. මුඛ්‍යාංග<br>• බිලාවල් රාගයට අයත් ලක්ෂණ ගී ගායනය කරමින් රාග ලක්ෂණ විමසීම | 01<br>01<br>02<br>01<br>02<br>01<br>02 |
| 7.1 ජනප්‍රිය සංගීතයේ බහුලව භාවිත වන සංගීත භාණ්ඩ පිළිබඳ විමසයි. | 09<br>10<br>11<br>12 | •විදුලි ඕගනයේ මූලිකාංග(Settings Voice, Style, Tempo, Auto Accompany )<br>• එකෝඩියන් භාණ්ඩයේ ස්වර පිහිටන අයුරු<br>• විදුලි ඕගන්/එකෝඩියන්/සර්පිනා භාණ්ඩ අතරින් ගීතයක් වාදනය<br>• ගිටාරය ස්වර පිහිටන අයුරු සහ (E,D,C, Minor Chirds & D,G,A, Major Chords) වාදනය | 02<br>02<br>03<br>03 |
| 5.3 ශ්‍රී ලංකාවේ පැවති කණ්ඩායම් ගී පිළිබඳ සාකච්ඡා කරමින් අගය කරයි. | 13<br>14 | • ශ්‍රී ලංකා ගුවන්විදුලිය ආශ්‍රිතව ගොඩ නැගුණු කණ්ඩායම් ගීත වල සාධනීය ලක්‍ෂණ<br>• තෝරාගත් කණ්ඩායම් ගීයක් ගායනය හා නිර්මාණය කළ නව කණ්ඩායම් ගීයක් ගායනය | 02<br>02 |
| 1.2 මේ දක්වා අධ්‍යයනය කළ තාලරූප ප්‍රායෝගික අභ්‍යාසයේ යෙදෙයි. | 15 | • සපයා ගත හැකි අවනද්ධ භාණ්ඩයක් ආශ්‍රයෙන් මාත්‍රා දෙකේ, | |

| නිපුණතා මට්ටම | අනුක්‍රමික පාඩම් අංකය | විෂය මාතෘකාව/ ක්‍රියාකාරකම | කාලච්ඡේද |
|---|---|---|---|
| 5.3 නූර්ති ගී ගායනයේ යෙදෙයි. | 17 | • නූර්ති ගීතයක් ගායනය | 01 |
| 1.1 ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනී.<br>1.3 රාගභාවය සහ එකිනෙක වෙනස්කම් ඇතිවීමට බලපාන හේතු විමර්ශනය කරයි. | 18<br>19<br>20<br>21<br>22 | • භූපාලි රාගයේ ස්වර අභ්‍යාස<br>• භූපාලි රාගයේ සර්ගම්<br>• භූපාලි රාගයේ මධ්‍යලය ගීතය<br>• භූපාලි රාගයට අයත් රාගාංග ඇතුළත් කෙටි ස්වර ඛණ්ඩ ගායනය<br>• භූපාලි රාගයට අයත් ලක්ෂණ ගී ගායනය කරමින් රාග ලක්ෂණ විමසීම | 01<br>01<br>02<br>01<br>02 |
| 2.1වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි. | 23<br>24<br>25 | • සර්පිනාවේ ව්‍යුහය, විවිධතා, එහි යාන්ත්‍රණය හා භාවිත කිරීමේ ශිල්ප ක්‍රම<br>• ස්වරපුවරුවෙන් මධ්‍යමය සහ පංචමය ශ්‍රැති කර ගනිමින් බිලාවල් කාෆි ආරෝහණ අවරෝහණ සහ එම ස්වර ඇතුළත් ගීත වාදනය.<br>• ස්වර වාද්‍ය භාණ්ඩ මගින් මධ්‍යමය සහ පංචමය ශ්‍රැති කර ගනිමින් බිලාවල් කාෆි ආරෝහණ අවරෝහණ සහ එම ස්වර ඇතුළත් ගීත වාදනය. | 02<br>03<br>03 |
| 7.2 පාසල්පද්ධතිය තුළ භාවිතවන අපරදිග තූර්යවාදක භාණ්ඩ පිළිබඳ විමසයි. | 26<br>27 | • අපරදිග තූර්යවාදක භාණ්ඩ වර්ගීකරණය.<br>• පාසල් පද්ධතිය තුළ භාවිතවන අපරදිග සංගීත භාණ්ඩ අතරින් ප්‍රචලිත භාණ්ඩ කිහිපයක රූපසටහන් ( Trumphet, Trombone, Euphonium, Oboe, Clarinet, Saxophone ) | 02<br>02 |
| 8.1 බටහිරසංගීත ප්‍රස්තාරකරණයේ කුසලතා ලබයි. | 28<br>29<br>30<br>31<br>32 | • Sharps, Flat, Natural Marks<br>• Clef, Rest marks, Tie<br>• F.G, C, B fiat Scales, (Major & Minor)<br>• Time signature<br>• Key signature F.G, C, B fiat | 01<br>02<br>02<br>01<br>01 |
| 6.1 නව නාට්‍ය ශෛලියේ ස්වභාවය සහ සංගීතය විමසයි. | 33 | • හුණුවටය/නරිබෑනා/තාරාවෝ ඉගිලෙති /බෙරහඬ/නල දමයන්ති/යන නාට්‍ය අතරින් | 02 |

| නිපුණතා මට්ටම | අනුක්‍රමික පාඩම් අංකය | විෂය මාතෘකාව/ ක්‍රියාකාරකම | කාලච්ඡේද |
|---|---|---|---|
| 5.3 නූර්ති ගී ගායනයේ යෙදෙයි. | 35 | • නූර්ති ගීතයක් ගායනය | 01 |
| 1.1 ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනී.<br>1.3 රාගභාවය සහ එකිනෙක වෙනස්කම් ඇතිවීමට බලපාන හේතු විමර්ශනය කරයි. | 36<br>37<br>38<br>39<br>40 | • කාෆි රාගයේ ස්වර අභ්‍යාස<br>• කාෆි රාගයේ සර්ගම්<br>• කාෆි රාගයේ මධ්‍යලය ගීතය<br>• කාෆි රාගයට අයත් රාගාංග ඇතුළත් කෙටි ස්වර ඛණ්ඩ ගායනය<br>• කාෆි රාගයට අයත් ලක්ෂණ ගී ගායනය කරමින් රාග ලක්ෂණ විමසීම | 01<br>01<br>02<br>01<br>02 |
| 3.1 ජන සංගීතය ආශ්‍රයෙන් නිර්මාණය කළ ගීත විමසයි. | 41 | • ජන ගී තනු ආශ්‍රිත සරල ගී<br>(පහත දක්වෙන ගී අතරින් එකක්<br>දෑතට වළලු-සී.ද.ඇස්.කුලතිලක<br>වන්නම් සවුදම් - ලයනල් රංවල<br>මල්සරා - රෝහණ බැද්දගේ) | 02 |
| 4.1 මහනුවර යුගය හා සම්බන්ධ ගී පිළිබඳ විචාරාත්මක අදහස් දක්වමින් ගායනය කරයි.<br>4.2 දේශීය අවනද්ධ වාද්‍ය භාණ්ඩවල විශේෂතා සාකච්ඡා කරමින් අගය කරයි. | 42<br>43<br>44<br>45 | • වන්නම් ප්‍රශස්ති සහ හටන් ගී පිළිබඳ සංස්කෘතිකමය තොරතුරු<br>• උකුසා වන්නම ගායනය.<br>• ප්‍රශස්ති සහ හටන් ගී ගායනය<br>• පංචතූර්ය වාදනය සහ දවුල, තම්මැට්ටම, ගැටබෙරය, පහතරට බෙරය යන අවනද්ධ වාද්‍ය භාණ්ඩයන් හඳුනාගැනීම. | 02<br>02<br>03<br>03 |
| 5.1ඉංග්‍රීසි බසින් රචිත ගීතයක් ගායනය | 46 | • I have a Dream (ABBA) යන ගීතය ගායනය | 02<br>04 |
| 9.1 සංගීත ප්‍රසංගයක අත්‍යවශ්‍ය තාක්ෂණික මෙවලම් හසුරුවන ආකාරය පිළිබඳ සොයා බලයි. | 47 | • මයික්‍රෆෝනය, ඇම්ප්ලිෆයරය, හෆල් මික්ස්චර් | 06 |
| 3.2 ලබාගත් සංගීතමය අත්දැකීම් ප්‍රාසාංගිකව ඉදිරිපත් කරමින් සතුට | 48 | • වාර්ෂික විවිධ ප්‍රසංගය | |

**ක්‍රියාකාරකම 01**

## මව්පිය ගුණ වරුණ ගී ගායනය (අම්මා සඳකි, සියක් ආයු ලැබ, ආදරයේ උල්පත, දුනුකෙයියා මලක්)

**නිපුණතාව 1.0** :- සරල සංගීතය හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 1.1** :- මවුපිය ගුණ වරුණ, ගී ගායනයේ යෙදෙයි.

**ක්‍රියාකාරකම 1.1.1** : මවුපිය ගුණ වරුණ, ගී ගායනය.

**කාලච්ඡේද** :- 02

**ඉගෙනුම් පල** :-

- මවුගුණ ගීතයක් රස විඳියි.
- මවුගුණ ගීතයක් ගායනයේ හුරුව ලබයි.
- මවුගුණ ගීතයේ පද මාලාවේ අරුත පැහැදිලි කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- ගීතය ලියූ දෘශ්‍යාධාරයක්
- ගීතය පටිගත කළ තැටියක් සහ තැටි වාදන යන්ත්‍රයක්.
- මවක දරුවෙකු වඩාගෙන සුරතල් කරන අයුරු ප්‍රදර්ශනය වන චිත්‍රයක් හෝ ඡායාරූපයක්
- හාර්මෝනියම් එකක්, තාල වාද්‍ය භාණ්ඩයක්

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

මෙම පාඩමෙන් අපේක්ෂා කරනුයේ මවුගුණ ගීතයක් ගායනයේ සිසුන් හුරු කිරීමත්, එම ගීතයෙන් කියැවෙන අර්ථය පිළිබඳව සිසුන් දැනුම්වත් කිරීමත්, ඒ පිළිබඳව සිසුන් සංවේදී කිරීමත් ය. මෙහිදී ගීතය විචාරාත්මක ව විස්තර කිරීම ඉතා වැදගත් වේ. මේ සඳහා නිර්දේශිත ගීත හතරකින් අභිමත ගීතයක් තෝරාගත හැකි ය.

**පාඩම සංවර්ධනය :-**

පියවර 01

- මවක දරුවෙකු වඩාගෙන ඉන්නා චිත්‍රය හෝ ඡායාරූපය හෝ සිසුනට ප්‍රදර්ශනය කරන්න.
- මව හා දරුවා අතර සබඳතාව පිළිබඳ වත්, මවක දරුවකු වෙනුවෙන් කරන කැපවීම පිළිබඳ වත් සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- පදමාලාව ප්‍රදර්ශනය කර ගීතය සිසුනට ශ්‍රවණය කිරීමට සලස්වන්න.
- පද මාලාවේ ධ්වනිතාර්ථය පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.

(මිනිත්තු 20)

පියවර 02

- තෝරාගත් ගීතය ගායනය කරන්න. වාද්‍ය භාණ්ඩයක් සමඟ සිසුන් ගයනයට පොලඹවන්න.
- නැවත නැවත කොටසින් කොටස සිසුන් ගායනයට පොලඹවන්න.

(මිනිත්තු 30)

පියවර 03

- සිසුන් සාමූහික වශයෙන් ගායනයට පොලඹවන්න.
- සිසුන් තනි තනි ව ගායනයේ යොදවා සදොස් තැන් වෙතොත් නිදොස් කරන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :-

- තනි තනි ව ගායනය කරවා අගයන්න.

(මිනිත්තු 10)

**පැවරුම** :-

මවුගුණ පිළිබඳ කියැවෙන ගීත, පද මාලා එක් කොට පොත් පිංචක් නිර්මාණය කරන්න.

නිර්දේශිත ගීත හතර

- ♦ අම්මා සඳකි
- ♦ සියක් ආයු ලැබ
- ♦ ආදරයේ අල්පත වූ අම්මා
- ♦ දුනුකෙයියා මලක් වගේ

**ක්‍රියාකාරකම 02**

## නූර්ති ගීත ගායනය/වාදනය කරයි...

**නිපුණතාව 6.0** : රංග සම්ප්‍රදායයන්හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 6.1** : නූර්ති ගී ගායනයේ කුසලතා ලබයි.

**ක්‍රියාකාරකම 2.1.1** : නූර්ති ගීතයක් ගායනය

**කාලච්ඡේද** : 01

**ඉගෙනුම් පල** :

- නූර්ති ගීතය අයත් නාට්‍ය නම් කරයි.
- නූර්ති ගීතවල තනු ආකර්ෂණීය බව පිළිගනියි.
- නූර්ති ගීතයක් ගායනය/වාදනය කරයි.

**ගුණාත්මක යෙදවුම්:**

- ඇමුණුම අංක 1 :- වාසනා දිනේකි මේක... ගීතය ලියූ දෘශ්‍යාධාරය
  ඇමුණුම අංක 2 :- අහෝ දුක වාන්ට... ගීතය ලියූ දෘශ්‍යාධාරය
- සර්පිනාවක්, තබ්ලාවක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

නූර්ති ගීතයක් ගායනය/වාදනය කිරීමට පුහුණුවක් ලබා දීම මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ. පළමු වාරයට නියමිත ගීත අතරින් 'වාසනා දිනේකි' ගීතය තෝරා ගන්නේ නම් එහි එන දොහොරා කොටස පිළිබඳ ව සිසුන් දැනුම්වත් කිරීමට සැලකිලිමත් වන්න.

පියවර 01

- ප්‍රචලිත නූර්ති ගීතයක් ගයමින් පාඩමට පිවිසෙන්න. (දන්නෝ බුදුන්ගේ)
- එම ගීතයේ තනුව පිළිබඳ ව සිසුන් හා සාකච්ඡා කරන්න.

(මිනිත්තු 05)

පියවර 02

- තෝරාගත් ගීතය ඇතුළත් දෘශ්‍යාධාරය පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- සර්පිනාව වයමින් ගුරුවරයා තෝරා ගත් ගීතය ගායනය කර පෙන්වන්න.
- නාදමාලාව තහවුරු වන පරිදි ගීතය කොටසින් කොටස ගායනය කරමින් පුහුණු කරවන්න.

(මිනිත්තු 20)

පියවර 03

කණ්ඩායම් වශයෙන් ගායනය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
(මිනිත්තු 10)

**ඇගයීම් සහ තක්සේරුකරණය සඳහා උපදෙස්:-**

- නූර්ති ගීතය නිවැරදි ශ්‍රැතියට හා ලයට අනුගත ව නිවැරදි නාද මාලාවට ගැයූ සිසු/සිසුවියන් තෝරා අගයන්න.

(මිනිත්තු 05)

**පැවරුම**

විද්‍යුත් මාධ්‍යයෙහි ප්‍රචාරය වන නූර්ති ගීත ඇතුළත් කර පොත් පිංචක් සකස් කිරීමට උපදෙස් දෙන්න.

ඇමුණුම් 01 :- **ශ්‍රී වික්‍රම නූර්තිය - නීතීඥ ජෝන් ද සිල්වා**

වාසනා දිනේකි මේක පාමූ - තුටින් සිතේ
වාසනා දිනේකි මේක පාමූ තුටින්
පාමූ තුටින් නටමු - මේ ලී දරා අතේ
වාසනා දිනේකි මේක පාමූ තුටින්

දෙහොරාවः-

කෝමල මධුර බසිනී මේ ගී - සාදා පවසමු දූන්
නටමු පේළි පේළි සැදී රජිඳා තුටු වන මෙන්

ගීතය

සිරියා වසා ය උරේ - ආසාවේ භූපති
තේජසා තිබේ ය දීපෙ ආලෝක වී අපේ
ආලෝක වී රජිඳු බෝ ප්‍රීති වී අපේ
තේජ සා තිබේ ය දීපෙ ආලෝක වී අපේ

නට නට කිංකිණි නාද දීමෙනි යමු පාරේ
තුති දිදි බොහෝ සේ භූපති ලක වැජඹේවා
නිතිනා නිරෝගි වේවා රාජා මේ සිංහලේ
තේජසා තිබේ ය දීපෙ ආලෝක වී අපේ
තේජසා තිබේ ය දීපෙ ආලෝක වී අපේ
ආලෝක වී රජිඳු බෝ ප්‍රීති වී

ඇමුණුම් 02 :- **වෙස්සන්තර - නීතීඥ ජෝන් ද සිල්වා**

අහෝ දුක වාන්ට බෑ දූන් මගේ දෙවියනේ
අහෝ දුක වාන්ට බෑ දූන් මගේ දෙවියනේ
මාගේ මාතා කොයි ද ඉන්නේ කියාපන් පියේ
මා මරා දමාවි නාකි අදම්ටු බමුණා //
ශෝක ලයේහි - බෝම පිරේවි
පියා නෑ ඊට කම්පා කළේ
නංගියේ තලා වී නාකි අදම්ටු බමුණා

**ක්‍රියාකාරකම 03A**

## බිලාවල් රාගයේ ස්වර අභ්‍යාස

**නිපුණතාව 1.0** :- සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන/වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** :- ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම 1.1.1** :- බිලාවල් රාගයේ ස්වර අභ්‍යාස

**කාලච්ඡේද** :- 01

**ඉගෙනුම් පල** :-

- රාගයක් ගොඩනැගී ඇත්තේ ස්වර සංගති ඇසුරින් බව සංගති සහිත අභ්‍යාස පුහුණු වීමෙන් අවබෝධ කර ගනියි.
- ස්වර අභ්‍යාස හොඳින් ප්‍රගුණ කිරීම මඟින් රාගය මිහිරි ව ගායනය/වාදනය කළ හැකි බව අවබෝධ කරගෙන පවසයි.
- බිලාවල් රාගයට අදාළ ස්වර සංගති හඳුනා ගනිමින් නිවැරදි ව ගායනය/වාදනය කරයි.
- බිලාවල් රාගය කණට මිහිරි රාගයක් බව අදාළ අභ්‍යාස තුළින් හඳුනාගෙන පවසයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- සර්පිනාවක් හෝ ශ්‍රැති පෙට්ටියක්.
- ඇමුණුම 01 අනුව සෑදූ දෘශ්‍යාධාරයක්.
- ඉන්දියානු ගායනයක් / වාදනයක් ඇතුළත් සංයුක්ත තැටියක් හා තැටි වාදන යන්ත්‍රයක්.

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

නිවැරදි ව ස්වර ගායනය හෝ වාදනය හෝ කිරීමේ හැකියාව ලබා ගැනීම, ස්වර අභ්‍යාස පුහුණු වීමෙන් ම දියුණු කර ගත යුතුය. කිසියම් රාගයකට අදාළ ව ගොඩනගා ඇති ස්වර අභ්‍යාස මඟින් අදාළ රාගයේ ස්වර නිවැරදි ව හැසිරවීමේ හැකියාව වර්ධනය වනු ඇත. මෙවැනි ස්වර අභ්‍යාස

''පල්ටා'' යන නමින් ද හඳුන්වයි.

රාගයක භාවිත ශුද්ධ, කෝමල, තීව්‍ර ආදි ස්වර එකට මුසු කොට ගත් ස්වර සමූහයන් මඟින් රාග නිර්මාණය වී ඇත. මෙම ස්වර කැටි 'ස්වර සංගති' නම් වේ. 'රාග අංග' යනුවෙන් ද හඳුන්වයි. මෙවැනි සංගති මුල් කොටගත් ස්වර අභ්‍යාස (රාග පල්ටා) පුහුණු කරවීම මෙහි දී අපේක්ෂිත ය. එමඟින් රාග ස්වරූපය ද සිසුනට වටහා දීමට හැකි වනු ඇත.

ඇමුණුම 01හි දී ඇති පල්ටා ඉතා හොඳින් පුහුණු කරවන්න. පන්ති කාමරය තුළ දී කළ හැකි අභ්‍යාස පුහුණු කරවා සෙසු අභ්‍යාස විවේක අවස්ථාවක දී පුහුණු කරවන්න.

**පාඩම සංවර්ධනය :-**

පියවර 01

- බිලාවල් රාගයෙන් ඉදිරිපත් කොට ඇති භාරතීය ගායනයක හා වාදනයක කොටස් 2ක් ශ්‍රවණයට සලස්වන්න.
- ස්වර අභ්‍යාස කිරීම මඟින් නිවැරදි ව ගායනය කළ හැකි ආකාරය පහදමින් පාඩමට පිවිසෙන්න.

(මිනිත්තු 05)

පියවර 02

- ඇමුණුම 01හි සඳහන් අභ්‍යාස සහිත දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න.
- අනුකරණය කිරීමේ ශිල්ප ක්‍රමය භාවිතයෙන් සිසුනට ගැයීමට/වැයීමට හුරු කරවන්න. (අවම වශයෙන් මුල් අභ්‍යාස 02ක් පුහුණු කළ යුතු ය)
- ස්වර අභ්‍යාස වල ඇති රාග අංග වෙන් කොට ගෙන කීප වරක් හෝ ගයමින්/වයමින් ඒවා පිළිබඳ අවධානය යොමු කරවන්න.

(මිනිත්තු 20)

පියවර 03

- තනි තනි ව ගැයීමට සලස්වන්න.
- සදොස් තැන් ඇතොත් නිවැරදි කර ඇගයීමට ලක් කරන්න.
- සියලු අභ්‍යාස පිළිබඳ සටහන් තබාගැනීමට ගැනීමට සලස්වන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- රාගයට අයත් අංග පිළිබඳ ව අවබෝධය හා ස්වර ඥානය මැනෙන ලෙස ඇගයීම සිදු කරන්න.

(මිනිත්තු 05)

**අතිරේක උදවු :-**

- ශාස්ත්‍රීය ගායන-වාදනවලට සවන් දීම හා නැරඹීම සඳහා යොමු කිරීම හා ස්වර අභ්‍යාස පුහුණු වීමට පෙලඹවීම.

ඇමුණුම 01 :-

**අභ්‍යාස**

(1) රාගයේ ආරෝහණය හා අවරෝහණය ඉතා හොඳින් පුහුණු කරවන්න.

(2) සරිස

සරි, ගමප, මගමරිස

සරි, ගමප ධප, ගප, මගමරිස

සරි, ගමප, ධනිස්නිධප, ගප, මගමරිස

(3) 1 සරිස රිගමප ... මගමරිස

2 ධප

3 ධනිස්නිධප

4 ධනිස්රි̇ස්නිධප

දෙපස ඇති ස්වර ඛණ්ඩ සෑම පේළියක ම මුලට හා අගට භාවිත කරන්න.

(4) සරිගම ගරිප ... ගමරිස

ගමප

ගමප ධප

ගමප ධනිස්නිධප

ගමප ධනිස්රි̇ස්නිධප

**ක්‍රියාකාරකම 03B**

## බිලාවල් රාගයේ සර්ගම්

**නිපුණතාව 1.0** :- සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන/වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** :- ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම 1.1.1** :- බිලාවල් රාගයේ සර්ගම්

**කාලච්ඡේද** :- 01

**ඉගෙනුම් පල** :-

- බිලාවල් රාගයට අයත් සර්ගම් ගීතයේ ස්වර යෙදෙන අයුරු පැහැදිලි කරයි.
- සර්ගම් ගීත රාග අංගයන්ගේ මිශ්‍රණයෙන් නිර්මාණය වූවක් බව පිළිගනියි.
- සර්ගම් ගීතය නිවැරදි ව ගායනය/වාදනය කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- සර්පිනාව/ශ්‍රැති පෙට්ටිය
- සර්ගම් ගීතය ලියූ දෘශ්‍යාධාරයක්
- තබ්ලාව

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

රාගයකට අයත් ස්වර භාවිතයෙන් පමණක් නිර්මාණය කොට ඇති සර්ගම් ගීත හින්දුස්ථානි රාගධාරී සංගීතය හදාරන ලබන ආධුනිකයන් විසින් පුහුණු විය යුතු ම අංගයකි. මේවායේ රාග අංග ඉතා පැහැදිලි ව දක්නට ඇත. සර්ගම් ගීතය උගන්වන අතරතුර පෙර පාඩමේ දී පුහුණු වූ ස්වර අභ්‍යාසයන්හි හමු වූ ස්වර සංගති හා වෙනත් සංගති සර්ගම් ගීතයෙන් වෙන් කොට දක්වමින් රාග අංග පිළිබඳ අවබෝධය හා මතකය තහවුරු කිරීම අපේක්ෂිත ය.

ඉතා නිවැරදිව ගායනය/වාදනය කිරීමට හැකියාව ලැබෙන තෙක් සර්ගම් ගී සිසුනට හුරු කරවීම අනිවාර්ය ය.

**පාඩම සංවර්ධනය :-**

පියවර 01

- සර්ගම් ගීතය ලියූ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න.
- ස්වර අභ්‍යාස පාඩමේ දී ඉගෙන ගත් රාග අංග මෙම සර්ගම් ගීතය හෝ ගීත හෝ මඟින් හඳුනා ගැනීමට සිසුන් පොලඹවන්න.
- රාගධාරී සංගීතයේ සියලු කෘතීන් බිහිවනුයේ මුලින් ඉගෙන ගන්නා ස්වර සංගති මඟින් බව පහදා සර්ගම් පුහුණුවීමේ ප්‍රයෝජනය පහදමින් පාඩමට පිවිසෙන්න.

(මිනිත්තු 05)

පියවර 02

- ප්‍රදර්ශනය කළ සර්ගම් ගීතය අනුකරණාත්මක ක්‍රමවේදය මඟින් සිසුනට ගැයීමට/වැයීමට සලස්වන්න. (මිනිත්තු 20)

පියවර 03

- සර්ගම් ගීතය තනි තනි ව ගැයීමට/වැයීමට සලස්වා සදොස් තැන්

ඇතොත් නිදොස් කරන්න.

- සිසුන්ගේ කුසලතා අගයමින් දිරි ගන්වන්න.
- සර්ගම් ගීතය සටහන් පොතේ ලියා ගැනීමට සලස්වන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- සර්ගම් ගීතයේ නිවැරදි ගායනය / වාදනය (ස්වර / තාල) හා රාග අංග පිළිබඳ අවබෝධය හා ප්‍රායෝගික හුරුව ඇගයෙන පරිදි ඇගයීමට සලස්වන්වන.

(මිනිත්තු 05)

**අතිරේක උදවු :-** අන්තර්ජාලය මඟින් උගත් රාගයට අදාළ සර්ගම් ගී හා වෙනත් ගායන වාදන ශ්‍රවණයට හා නැරඹීමට සලස්වන්න.

**ඇමුණුම 01** :- ගායනය, වාදනය සඳහා සිසුනට ගැළපෙන ගීතයක් තෝරා ගන්න.

**රාගය - බිලාවල් - සර්ගම් - තාලය ත්‍රිතාල් (මධ්‍යලය)**

**ස්ථායි**

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 3 | | | | X | | | | 2 | | | | 0 | | | |
| ග | ප | ධ | නි | ස̇ | – | ධ | ප | ම | ග | ම | රි | ස | රි | ස | – |
| ග | – | ම | රි | ග | ප | ධ | නි | ස̇ | නි | ධ | ප | ම | ග | රි | ස |

අන්තරා

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 3 | | | | X | | | | 2 | | | | 0 | | | |
| ප | ප | ධ | නි | ස̇ | – | ස̇ | ස̇ | ධ | නි | ස̇ | රි̇ | ස̇ | නි | ධ | ප |
| ග̇ | රි̇ | ස̇ | නි | ධ | ප | නි | ධ | ස̇ | නි | ධ | ප | ම | ග | රි | ස |

**රාගය - බිලාවල්, තාලය එක්තාල් (මධ්‍යලය) සර්ගම්**

**ස්ථායි**

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| × | | 0 | | 2 | | 0 | | 3 | | 4 | |
| ස̇ | නි | ධ | නි | ස̇ | – | ස̇ | රි̇ | ස̇ | නි | ධ | ප |
| ම | ග | ම | රි | ග | ම | ප | ග | ම | රි | ස | – |
| නි̣ | ස | ග | රි | ස | නි̣ | ධ̣ | ධ̣ | ස | – | රි | ස |
| ග | ම | ග | රි | ග | ම | ප | ග | ම | රි | ස | – |

**අන්තරා**

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප | ප | ධ | නි | ස̇ | – | ස̇ | රි̇ | ම̇ | රි̇ | ස̇ | – |
| ස̇ | රි̇ | ග̇ | ම̇ | ප̇ | ග̇ | ම̇ | රි̇ | ස̇ | – | රි̇ | ස̇ |
| ස̇ | රි̇ | ස̇ | නි | ධ | ප | ධ | නි | ස̇ | නි | ධ | ප |
| ම | ග | ම | රි | ග | ම | ප | ග | ම | රි | ස̇ | – |

**ක්‍රියාකාරකම 04**

## බිලාවල් රාගයේ මධ්‍යලය ගීතය

**නිපුණතාව 1.0** :- සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන / වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** :- ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන වාදන හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම 1.1.1** :- බිලාවල් රාගයේ මධ්‍යලය ගීතය

**කාලච්ඡේද** :- 02

**ඉගෙනුම් පල** :-

- බිලාවල් රාගයේ යෙදෙන ස්වර නම් කරයි.
- පුහුණුවෙන් පසු හින්දුස්ථානී රාගධාරී සංගීතයේ ගීත ගායනය පහසු වන බව පිළිගනියි.
- බිලාවල් රාගයේ මධ්‍ය ලය ගීතය ගායනා කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- සර්පිනාවක්/ශ්‍රැති පෙට්ටිය
- ගීත ලියූ දෘශ්‍යාධාරයක්

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

ස්වර අභ්‍යාස හා සර්ගම් ගායනයෙන් අනතුරු ව මධ්‍යලය ගීතය ගැයීම සාර්ථක ඉගැන්වීමේ ක්‍රමයකි. මේ වන විට රාගය හා රාග අංග පිළිබඳ ව සුළු හෝ අවබෝධයක් සිසුන් සතු ව ඇත. අප මෙම අවස්ථාවේ දී උගන්වනුයේ ඛ්‍යාල් ශෛලියට අයත් මධ්‍යලය (චොටා ඛ්‍යාල්) ගීතයකි.

මධ්‍යලය ගීතය රාග භාවය මතු වන ලෙස ගයමින්/වයමින් ඉගැන්වීම අවශ්‍ය ම ය. ඛ්‍යාල් ගීතයේ ස්වර ප්‍රස්තාරය පෙන්වා මෙතෙක් ඉගෙනගත් රාග අංග හඳුනා ගැනීමට සලස්වන්න. එම අංග මතු කරමින් සිසුවාගේ අවබෝධය පුළුල් කරන්න.

පසු ගිය 8 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ 22 වැනි පිටුවේ සඳහන් මධ්‍යලය ගීතයන්ගෙන් ගීතයක් තෝරා ගන්න. එය හොඳින් ගායනය/වාදනය කිරීමට හැකියාව ලැබෙන තෙක් පුහුණු කරවන්න.

**පාඩම සංවර්ධනය :-**

පියවර 01

- බිලාවල් රාගයට අදාළ නොවන වෙනත් රාගධාරී ගීතයක් ගයා ශ්‍රවණයට සලස්වන්න.
- බිලාවල් රාගයෙන් මෙම පාඩමෙහි උගන්වන ඛ්‍යාල් ගීතය නොමැති ව වෙනත් ඛ්‍යාල් ගීතයක් ගයා ශ්‍රවණයට සලස්වන්න.
- බිලාවල් ස්වර අභ්‍යාස හා සර්ගම් යන පාඩමෙහි උගත් ස්වර සංගතිවල හුරුව අනුව බිලාවල් රාගයට සමාන කුමන ගීයදැයි විමසමින් සිසු පිළිතුරු අනුව සාකච්ඡාව ගොඩ නගමින් පාඩමට පිවිසෙන්න.

(මිනිත්තු 10)

පියවර 02

- ඛ්‍යාල් ගීතය සහිත දෘශ්‍යාධාර ප්‍රදර්ශනය කරන්න.
- අනුකරණාත්මක ක්‍රමය අනුව ගැයීමට/වැයීමට හුරු කරවන්න.

(ගායනයට ඉගැන්වීමේ දී ගීතයේ පද පමණක් ලියා ගැනීමට සලස්වා පළමුව වචන ගයවන්න. ස්වර ප්‍රස්තාරය ගායනය කළ යුත්තේ දෙවනුව ය.)

- එම ගීතයෙහි සඳහන් රාගාංග පැහැදිලි කරන්න.

(මිනිත්තු 30)

පියවර 03

- තනි තනි ව ගායනය කිරීමට සලස්වා ඇගයීමට ලක් කරන්න.
- සදොස් තැන් නිදොස් කරන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- ඒකල ව/කණ්ඩායම් ලෙස ගායනයට සළසා අගයන්න.

(මිනිත්තු 10)

**අතිරේක උදවු :-**

- භාවික ගී - වින්සන්ට් සෝමපාල
- රාගාලංකාර - සනත් නන්දසිරි

ඇමුණුම:-

නිර්දේශිත මධ්‍ය ලය ගීත:- (පසු ගිය 8 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ 22 වැනි පිටුවේ සඳහන් මධ්‍යලය ගීත)

- මුරලි බජාවේ මෝහනා
- තුහී අදාර
- මන නුවන් පිනන
- බඳවා ජය රන් දද

**ක්‍රියාකාරකම 5**

## බිලාවල් රාගයට අයත් රාගාංග ඇතුළත් කෙටි ස්වර ඛණ්ඩ ගායනය

**නිපුණතාව 1.0** :- සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන/වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** :- ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම 1.1.1** :- බිලාවල් රාගයට අයත් රාගාංග ඇතුළත් කෙටි ස්වර ඛණ්ඩ ගායනය

**කාලච්ඡේද** :- 01

**ඉගෙනුම් පල** :-

- රාගයක් ගොඩනැගෙනුයේ රාගාංග (ස්වර සංගති) එකතුවකින් බව දැන ගනියි.
- රාගාංග ශ්‍රවණයෙන් රාගය හඳුනා ගනියි.
- රාගයක් ඉගෙන ගැනීමේ ප්‍රධාන කාර්ය රාග අංග ඉගෙන ගැනීම යැයි සිතයි.
- බිලාවල් රාගයට අයත් රාගාංග ගායනා කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- සර්පිනාවක්, රාගාංග ලියූ දෘශ්‍යාධාරයක්.

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

නියමිත රාගයට අදාළ රාගාංග හඳුනා ගැනීම ගායනය/වාදනය ඉතා උසස් මට්ටමේ කුසලතාවකි. මෙම කුසලතාව සිසුන් තුළ ඇති කිරීම මෙම පාඩමේ අපේක්ෂාව යි. ඔවුන් විටින් විට මෙතෙක් හඳුනාගත් රාග අංග ස්වර සංගති එක් දෘශ්‍යාධාරයකට ගෙන එය භාවිතයෙන් එම අංග ගැයීමට හුරු කරවන්න. මෙය ද අනුකරණාත්මක ක්‍රමවේදය භාවිතයෙන් සිදු කළ යුතු ය. සැම අංගයක් ම ස්වර හා ''අ'' කාරයෙන් ගැයීමට හුරු කරවිය යුතු ය. ඔබ ''අ'' කාරයෙන් අංගය ගයන විට එහි ස්වර හඳුනා ගැනීමේ හැකියාව ද සිසුන් තුළ ගොඩ නැඟිය යුතු ය.

ඇමුණුම 01හි දැක්වෙන රාග අංග (සංගති) හා තව දුරටත් පල්ටා සර්ගම්/ගීත ඇසුරින් උපුටා ගත් අංග සිසුන් ලවා ගයවන්න/වයවන්න.

**පාඩම සංවර්ධනය :-**

පියවර 01

- කළු ලෑල්ල මත ලියූ රාගාංග කිහිපය අහඹු ලෙස තෝරා ගත් සිසුන් කිහිප දෙනෙකු ලවා ගායනය කරවන්න. (දර්ශන මාත්‍රයෙන්)
- සදොස් තැන් නිදොස් කරවන්න.
- රාග අංග වලින් රාගයක ට ඇති වැදගත්කම පිළිබඳ ව පහදමින් පාඩමට පිවිසෙන්න.

(මිනිත්තු 05)

පියවර 02

- රාගාංග ඇසුරින් නිර්මිත කෙටි ස්වර ඛණ්ඩ ලියූ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරවන්න.
- එහි සඳහන් ස්වර ඛණ්ඩ එකින් එක ගෙන අනුකරණාත්මක ක්‍රමයට ගායනයට/වාදනයට හුරු කරවන්න.
- (ඇමුණුම 01 භාවිත කරන්න) ගායනයේ දී ස්වර සහ 'අ'කාරයෙන් සිදු විය යුතුය.

- ඔබ විසින් එම ඛණ්ඩ 'අ'කාරයෙන් ගයා, ගැයූ ස්වර හඳුනා ගැනීමට සලස්වන්න.

(මිනිත්තු 20)

පියවර 03

- 'අ' කාරයෙන් ස්වර ඛණ්ඩ ගයමින්, ගැයූ ස්වර පිළිබඳ ව සිසුන්ගෙන් විමසයි.
- ඔබ සැකසූ (රාගයට අදාළ ව) ස්වර ඛණ්ඩ ලබා දී තනි තනි ව ගායනයට/වාදනයට සලස්වා සදොස් තැන් නිදොස් කරන්න.
- පොතේ සටහන් කිරීමට සලස්වන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

ස්වර හා රාග ඥානය මැනෙන ලෙස ඇගයීම සිදු විය යුතු යි.

(මිනිත්තු 05)

**අතිරේක උදවු :-**

රාගාංග ඇතුළත් ස්වර ඛණ්ඩ භාවිත කරමින් සුදුසු තාලයකට ස්වර පේළි දෙකක් හෝ හතරක් නිර්මාණය කිරීමට සිසුන් පොලඹවන්න.

ඇමුණුම 01

(1) සරිගම, ගරිගප

(2) සරිස, රිගමප

(3) සරිගමප, මගමරිස

(4) ගප, ධනිස්

(5) ධනිස්රි, ස්නිධප

(6) සරිස, ගමප ගමරිස -

(7) ග - මරි සරිස -

(8) ස්රිස්නිධප,ගප

(9) ප-ධග- මගමරිස-

(10) රිගමප මගමරිස-

**ක්‍රියාකාරකම 6 A**

## ථාටය, (මේලය), රාගය. ජාතිය, වාදී, සංවාදී, අනුවාදී, විවාදී, වර්ජිත ස්වර යන පාරිභාෂික පද

**නිපුණතාව 1.0** :- සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන/වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.3** :- රාගභාවය සහ එකිනෙක වෙනස්කම් ඇතිවීමට බලපාන හේතු විමර්ශනය කරයි.

**ක්‍රියාකාරකම** :- ථාටය, (මේලය), රාගය, ජාතිය, වාදි, සංවාදි, අනුවාදි, විවාදි, වර්ජිත ස්වර යන පාරිභාෂික පද

**කාලච්ඡේද** :- 02

**ඉගෙනුම් පල** :-

- රාගධාරී සංගීතයේ මූලධර්ම හා බැඳි පද කිහිපයක අර්ථය ප්‍රකාශ කරයි.
- හිංදුස්ථානී රාගධාරී සංගීතය තුල ප්‍රායෝගිකව යෙදෙමින් මෙම කරුණු අධ්‍යයනය කිරීමට කැමැත්ත පල කරයි.
- එක් එක් පාරිභාෂික පද හා බැඳුණු කරුණු උදාහරණ තුලින් පැහැදිලි කර සුවිශේස ලක්‍ෂණ සොයා පෙන්වයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- ඇමුණුම 01-කියවීම් පත්‍රිකාවේ සහ කාර්ය පත්‍රිකාවේ පිටපත්
- ඇමුණුම 02-කියවීම් පත්‍රිකාවේ සහ කාර්ය පත්‍රිකාවේ පිටපත්
- සර්පිනාව, තබ්ලාව

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

මෙම ක්‍රියාකාරකමට පෙර, සිසුන් බිලාවල් රාගය ප්‍රායෝගිකව හා න්‍යායිකව අධ්‍යයනය කර ඇත. බිලාවල් රාගයේ රාග විස්තරයට මේලය, රාගය, ජාතිය, වාදි, සංවාදි, අනුවාදි, විවාදි, වර්ජිත ස්වර යන පාරිභාෂික පද අන්තර්ගතව ඇත. එම පාරිභාෂික පද පිළිබඳව අවබෝධයක් ලබාදීම මෙම ක්‍රියාකාරකමින් අපේක්‍ෂා කෙරේ.

පාඩම සංවර්ධනය :-

පියවර 01

- බිලාවල් රාගයේ විස්තර ඇතුළත් දෘශ්‍යාධාරයක් පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.
- මේලය, රාගය, ජාතිය, වාදි, සංවාදි, අනුවාදි, විවාදි, වර්ජිත ස්වර යන කොටස් පිළිබඳව විශේෂ අවධානයක් යොමුවන ලෙස ඒවා යටින් ඉරක් අඳින්න.
- මෙම පද පිළිබඳව දැනගැනීමේ අවශ්‍යතාවය පැහැදිළි කරදෙමින් සාකච්ඡාව මෙහෙයවන්න.

(මිනිත්තු 10)

පියවර 02

- ඇමුණුම අංක 01 කියවීම් පත්‍රිකාවේ පිටපත් සිසුනට බෙදා දෙන්න.
- එහි ඇතුළත් තොරතුරු සාකච්ඡා කරන්න.
- කාර්ය පත්‍රිකාවේ පිටපත් ලබාදී කණ්ඩායම් වශයෙන් සිසුන් ක්‍රියාකාරකමේ යොදවන්න.
- ඇමුණුම අංක 02 කියවීම් පත්‍රිකාවේ පිටපත් සිසුනට ලබා දී ඉහත ක්‍රමයට අනුගමනය කරන්න. (මිනිත්තු 80)

පියවර 03

- සිසුන් අභ්‍යාස පොත් වල ලියූ පිළිතුරු කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කිරීමට අවස්තාව ලබාදෙන්න.

(මිනිත්තු 20)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- කාර්ය පත්‍රිකාවන්ට අදාළව නිවැරදිව හා පැහැදිළිව කරුණු ඉදිරිපත් කළ කණ්ඩායම් හඳුනාගෙන එම සිසුන්ගේ දක්ෂතා අගයන්න.

(මිනිත්තු 10)

**අතිරේක උදවු :-** Musicology of India - þrt I Prof. V.S. Nigam

ඇමුණුම 01

## කියවීම් පත්‍රිකාව

ථාට - රාගයක් ඉපදවීමට ශක්තිය ඇති විශේෂ ස්වර සමුදායට ''ථාට'' නමින් හැඳින්වේ. ථාට ගායනය නොකෙරේ. එබැවින් ථාටයකින් රස උත්පාදනය සිදුනොවේ. හින්දුස්ථානී සංගීතයේදී ''ථාට'' නමින් ද කර්ණාටක සංගීතයේ දී ''මේල'' නමින්ද මෙම පාරිභාෂික වචනය හැඳින්වේ. පණ්ඩිත් විශ්ණු නාරයන් භාත්ඛණ්ඩෙ පඬිතුමා මේල 10 හඳුන්වාදී ඇත.

| මේලය | මේල ස්වර |
|---|---|
| 1 යමන් (කල්‍යාණ) | ස රි ග ම් ප ධ නි |
| 2 බිලාවල් | ස රි ග ම ප ධ නි |
| 3 කාෆි | ස රි ගු ම ප ධ නි |
| 4 හෛරව | ස රි ග ම ප ධු නි |
| 5 හෛරවි | ස රි ගු ම ප ධු නි |
| 6 ඛමාජ් | ස රි ග ම ප ධ නි |
| 7 ආසාවරී | ස රි ගු ම ප ධු නි |
| 8 පූර්වි | ස රි ග ම් ප ධු නි |
| 9 මාර්වා | ස රි ග ම් ප ධ නි |
| 10 තෝඩි | ස රි ගු ම් ප ධු නි |

රාග - සිත සතුටු කරවන ස්වර සමුදාය රාග නමින් හැඳින්වේ. හින්දුස්ථානී සංගීතයේ රාග විශාල සංඛ්‍යාවක් ඇත. එම රාග භාත්ඛණ්ඩෙ පඬිතුමා ථාට යටතේ වර්ග කර ඇත.

- රාගයකට ආරෝහණ අවරෝහණ දෙකම තිබිය යුතුයි.
- රාගයකට අවම වශයෙන් ස්වර 5ක් වත් තිබිය යුතුයි.
- රාගයක ම, ප, ස්වරයන්ගෙන් එක් ස්වරයක් වත් තිබිය යුතුයි.

මෙම කරුණු වලින් දක්වෙන්නේ රාගයක සුවිශේෂ ලක්ෂණ කිහිපයකි.

ජාතිය - රාගයක ආරෝහණයේ, අවරෝහණයේ යෙදෙන ස්වර සංඛ්‍යාව අනුව ඒ ඒ රාගයේ ජාතිය තීරණය වේ. මූලික වශයෙන් ජාති 3ක් ඇත.

| | | ආරෝ. | | අවරෝ. |
|---|---|---|---|---|
| • ඖඩව | - | 5 | - | 5 |
| • ෂාඩව | - | 6 | - | 6 |
| • සම්පූර්ණ | - | 7 | - | 7 |

මූලික රාග ජාති 3න් රාග ජාති 6ක් බිහිවේ. ඒ අනුව රාග ජාති 9ක් සැදේ.

ඇමුණුම 02

## කියවීම් පත්‍රිකාව

වාදී ස්වරය - රාගයක යෙදෙන ප්‍රබලම ස්වරය වාදී ස්වරය නමින් හැඳින්වේ. රාගයක් ගැයීමේ දී හෝ වැයීමේදී වැඩිම වාරයක් ගායනය හෝ වාදනය වන්නේ වාදී ස්වරයයි. රාගයේ **ජීව ස්වරය** ලෙස මෙම වාදී ස්වරය හඳුන්වනු ලැබේ.

සංවාදී ස්වරය -වාදී ස්වරයෙන් පසු දෙවනුවට ප්‍රධාන වන ස්වරය සංවාදී ස්වරයයි. රාගයක සංවාදී ස්වරය පිහිටන නිශ්චිත ක්‍රමවේදයක් ඇත. සංවාදී ස්වරය වාදී ස්වරයේ සිට හතර වන හෝ පස් වන ස්වරය ලෙස පිහිටයි.

අනුවාදී ස්වර - වාදී, සංවාදී ස්වර හැරුණු විට රාගයේ ඉතිරි ස්වර සියල්ලම අනුවාදී ස්වර වේ.

විවාදී ස්වර - රාගයක නොයෙදෙන ස්වරයි. නමුත් දක්ෂ සංගීතඥයින් රාගයට හානියත් නොවන ආකාරයට මෙම ස්වර යොදා ගෙන රාගය අලංකාර කරගනියි. එම ස්වර විවාදී ස්වර ලෙස හැඳින්වේ.

වර්ජිත ස්වර - මේලයට අයත් වුවත්, රාගයේදී නොයෙදෙන ස්වර වර්ජිත ස්වර නමින් හැඳින්වේ. උදාහරණ ලෙස කළ්‍යාණ මේලයට අයත් වන භූපාලි රාගයේ වර්ජිත ස්වර ම සහ නි වේ.

| කළ්‍යාණ ථායට (යමන්) | භූපාලි රාගය |
|---|---|
| ස රි ග ම් ප ධ නි ස් | ස රි ග ප ධ ස් |

## ඇමුණුම 01 - කාර්ය පත්‍රිකාව

පහත සඳහන් ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

01

i. මේල යන්න නිර්වචනය කර දක්වන්න.
ii. හින්දුස්ථානී සංගීතයේ ඨාට කීයක් භාවිතවේද ?
iii. මෙම සිද්ධාන්තය හඳුන්වාදුන් පඬිතුමා නම් කරන්න.
iv. හින්දුස්ථානී සංගීතයේ දී හා කර්ණාටක සංගීතයේදී මෙම මේල හා ඨාට යන්න හඳුන්වන්නේ කෙසේද ?
v. ඨාට 10 නම් කරන්න.

02

i. රාග යන්න නිර්වචනය කරන්න.
ii. ඨාට වර්ගීකරණය කරන ලද්දේ කවුරුන් විසින් ද?
iii. රාගයක සුවිශේෂ ලක්‍ෂණ 3ක් ලියන්න.

03

i. රාග ජාති යන්න නිර්වචනය කරන්න.
ii. මූලික රාග ජාති 3 නම් කරන්න.
iii. මූලික රාග ජාති 3 එක් වී ජාති 6 සැදෙන අයුරු දක්වන්න.
vi. රාග ජාති පිළිබඳව ''ගැලීම්'' සටහනක් ඇඳ දක්වන්න.

## ඇමුණුම 02 - කාර්ය පත්‍රිකාව

- නිවැරදි පිළිතුරු යොදා හිස්තැන් පුරවන්න

1. රාගයක යෙදෙන ________________වාදී ස්වරයයි.
2. රාගයක වැඩිම වාරයක් _________ ________ වන්නේ වාදී ස්වරයයි.
3. වාදී ස්වරය රාගයේ ________ස්වරය නමින් හැඳින්වේ.
4. බිලාවල් රාගයේ වාදී ස්වරය _______වේ.

---

1. වාදී ස්වරයෙන් පසු දෙවනුවට ප්‍රධාන ස්වරය__________වේ.
2. වාදී ස්වරයේ සිට _________ හෝ ________ ස්වරය සංවාදී ස්වරය සේ පිහිටයි.
3. වාදී ස්වරය රාගයේ ________ස්වරය නමින් හැඳින්වේ.
4. බිලාවල් රාගයේ සංවාදී ස්වරය ______වේ.

---

1. වාදී, සංවාදී ස්වර හැරුණු විට රාගයේ ඉතිරි ස්වර_______ස්වර නමින් හැඳින්වේ.
2. ස රි ග ම ප ධ නි ස් මෙහි වාදී ග හා සංවාදී නි වන අතර අනුවාදී ස්වර __________ ______ වේ.
3. බිලාවල් රාගයේ අනුවාදී ස්වර ලියා දක්වන්න.

---

- කෙටි පිළිතුරු සපයන්න.

1. විවාදී ස්වරය යන්න කෙටියෙන් විස්තර කරන්න.
2. වර්ජිත ස්වර යන්න කෙටියෙන් විස්තර කරන්න.
3. වර්ජිත ස්වර යෙදෙන රාගයක් නම් කර එම රාගයේ යෙදෙන වර්ජිත ස්වර ලියා දක්වන්න.
4. වර්ජිත ස්වර හා විවාදී ස්වර රාගයක යෙදුනොත් එය රාගයට බලපාන ආකාරය ලියා දක්වන්න.

**ක්‍රියාකාරකම 7**

## ආරෝහණ අවරෝහණ මුඛ්‍යාංග

**නිපුණතාව 1.0** :- සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන/වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.3** :- රාග භාවය සහ එකිනෙක වෙනස්කම් ඇතිවීමට බලපාන හේතු විමර්ශනය කරයි.

**ක්‍රියාකාරකම** :- ආරෝහණ අවරෝහණ මුඛ්‍යාංග

**කාලච්ඡේද** :- 01

**ඉගෙනුම් පල** :-

- රාගයක ආරෝහණ අවරෝහණ හා මුඛ්‍යාංගයෙහි ඇති වැදගත්කම දැන ගනියි.
- රාගයක ආරෝහණ අවරෝහණ හා මුඛ්‍යාංගය අධ්‍යයනය කොට හොඳින් අභ්‍යාස කිරීම මඟින් රාගය වඩා හොඳින් ගායනය/වාදනය කරයි.
- රාගයක් අවබෝධ කර ගැනීමේ මූලික හා සාර්ථකම පියවර ආරෝහණ අවරෝහණ හා මුඛ්‍යාංගය අධ්‍යයනය කිරීම බව අවබෝධ කොට ගෙන පවසයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- ආරෝහණ/අවරෝහණ මුඛ්‍යාංග ඇතුළත් දෘශ්‍යාධාරය

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

රාගයක් අධ්‍යයනයේ ඉතා වැදගත්ම කොටස නම් ආරෝහණ අවරෝහණ යයි. තවද රාගයක් ගැඹුරින් අධ්‍යයනය කිරීමේ පළමු පියවර එහි මුඛ්‍යාංගයයි. මේ පිළිබඳ ව සිසුන් තුළ මනා අවබෝධයක් ඇති කළ යුතු ය. ඉහත සංකල්ප නිර්වචනය කිරීමට සිසුනට හැකි විය යුතු ය. එසේම ගායනය වාදනය කරන සියල්ලන් ම රාගය තහවුරු වීම සඳහා වැඩි කාලයක් අභ්‍යාස කළ යුත්තේ රාගයෙහි ආරෝහණ අවරෝහණය හා මුඛ්‍යාංගය බව දැඩි ලෙස අවධාරණය කළ යුතු ය.

''පකඩ්'' යනු මුඛ්‍යාංගයට යෙදෙන හින්දි නාමයයි. රාගයක ආරෝහණ අවරෝහණයෙහි ස්වර කැටි කොට ඇති බව තෙවන පියවරේ දී සිසුනට ම හඳුනා ගැනීමට උදවු වන්න. රාගයට අදාළ ප්‍රස්තාර තුළින් මුඛ්‍යාංගයෙහි ඇති අංග හඳුනා ගැනීමට ද තෙවන පියවරේ දී සිසුන් පොළඹවන්න.

**පාඩම සංවර්ධනය :-**

පියවර 01

- මේ වන විට උගන්වා අවසන් කළ රාගයක ආරෝහණ/අවරෝහණ හා මුඛ්‍යාංගය ගයා පෙන්වා රාගය හඳුනා ගැනීමට සලස්වා පාඩමට පිවිසෙන්න.
- රාගයක් අවබෝධයෙන් ගායනය/වාදනය පුහුණු වීමට ආරෝහණ/අවරෝහණ හා මුඛ්‍යාංගයේ ඇති වැදගත්කම පිළිබඳ ව සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10)

පියවර 02

- ආරෝහණය හා අවරෝහණය යන්න පිළිබඳ ව සිසුන් සමඟ ම සාකච්ඡා කරමින් නිර්වචන ගොඩගන්න.

- එම නිර්වචන රාගය සමඟ ගළපා සටහන් කර ගැනීමට සලස්වන්න.
- ''මුඛ්‍යාංගය'' යන පදයේ අර්ථ විග්‍රහ කරමින් රාගයෙහි මුඛ්‍යාංගය යන්නට නිර්වචනයක් ගොඩනගන්න.
- 'පකඩ්' යන්න මුඛ්‍යාංගයට යොදන හින්දි නම බව පහදන්න.

(මිනිත්තු 15)

පියවර 03

- මුඛ්‍යාංගය පිළිබඳ ව නිර්වචනයක් සටහන් කර ගැනීමට සලස්වන්න.
- රාගයන්හි (ඉගැන්වූ) ආරෝහණ අවරෝහණ, මුඛ්‍යාංග ඇතුළත් දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න. (ස්වර වෙන් වන ''කොමා'' ලකුණ නිසි පරිදි යොදන්න.)
- ශුද්ධ ස්වර ඇතුළත් ආරෝහණ අවරෝහණය හා රාගයන්හි ආරෝහණ අවරෝහණ අතර ඇති වෙනස දෘශ්‍යාධාරය විමර්ශනය කොට ඉදිරිපත් කිරීමට සිසුනට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් අතැති නිම කළ රාගයන්ට අදාළ ස්වර ප්‍රස්තාරයන්හි ඒ ඒ රාගයට අයත් මුඛ්‍යාංගයෙහි ඇතුළත් අංග වෙන් කර දක්වන්නට සලස්වන්න.
- සදොස් තැන් නිදොස් කරමින් ගුරු උපදෙස් ලබා දෙන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- ඉහත සංකල්ප සෛද්ධාන්තික ව හා ප්‍රායෝගික ව අවබෝධ කරගත් බව මැනබැලීමට සුදුසු ඇගයීමක් සකසා ගන්න.

**අතිරේක උදවු :-**

Musicology of India - þrt I Prof. V.S. Nigam

- සංගීතය - ප්‍රේමවංශ හපුවලාන
- සිද්ධාන්ත සම්භාව්‍ය සංගීත - ශාන්ති ගීතදේව

**දෘශ්‍යාධාරය :-**

| රාගයේ නම | ආරෝහණ | අවරෝහණ | මුඛ්‍යාංගය |
|---|---|---|---|
| බිලාවල් | ස රි, ග ම,ප,ධ,නි ස් | ස්, නි ධ ප, ම ග, රි ස | ගරි, ගප, ධ, නිස් |
| භූපාලි | ස රි ග ප, ධ ස් | ස්, ධ ප, ග, රි ස | ගරිස,ධ̣සරිග, පග,ධපග,රිස |
| කාෆි | ස රි <u>ග</u>, ම ප, ධ, <u>නි</u> ස් | ස්, <u>නි</u> ධ ප, ම <u>ග</u>, රි ස | සස, රිරි, <u>ගග</u>, මම, ප |

**ක්‍රියාකාරකම 8**

## බිලාවල් රාගයට අයත් ලක්ෂණ ගීත ගායනය කරමින් රාග ලක්ෂණ විමසයි

**නිපුණතාව 1.0** :- සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන/වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** :- ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම 1.1.1** :- බිලාවල් රාගයට අයත් ලක්ෂණ ගීත ගායනය කරමින් රාග ලක්ෂණ විමසයි

**කාලච්ඡේද** :- 02

**ඉගෙනුම් පල** :-

- ලක්ෂණ ගීතයන්හි අන්තර්ගතය පිළිබඳ ව දැන ගනියි.
- රාග විස්තර ඉගෙන ගත හැකි සරල ගීත විශේෂයක් බව පිළිගෙන පවසයි.
- ලක්ෂණ ගීත ගායනය කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- සර්පිනාවක්, ලක්ෂණ ගීත ලියූ දෘශ්‍යාධාරයක්, තාල වාද්‍ය භාණ්ඩ.

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

ස්වර සංගති වලට අමතර ව රාග හා බැඳුණු බොහෝ කරුණු ඇති අතර එම කරුණු ඇතුළත් වන සේ පදමාලාව නිර්මාණය කර ඇති ගීත ලක්ෂණ ගීත වේ. ලක්ෂණ ගීතය ගායනයට හුරු කරවනවාට අමතර ව ඒ මගින් රාග විස්තර අධ්‍යයනයට සිසුන් පෙලඹවීම මෙයින් අපේක්ෂිත ය.

ගීතය පුහුණු කරවන අතරතුර එහි ඇතුළත් රාග විස්තර පිළිබඳ ව සිසුන් දැනුම්වත් කිරීම අවශ්‍ය ය. සෑම ගීතයකම නිවැරැදි ව මතකයෙන් ගැයීමේ හැකියාව ලැබෙන තෙක් පුහුණු වීමට සිසුන් උනන්දු කරවන්න.

**පාඩම සංවර්ධනය :-**

පියවර 01

- ගුරුවරයා විසින් නියමිත රාගයේ හා වෙනත් රාගයක ස්වර ඛණ්ඩයක් ආකාරයෙන් ආලාප කරමින් රාගය හඳුනාගෙන නම් කිරීමට සිසුන් පොලඹවන්න.
- රාග හඳුනා ගැනීමේ නිවැරදිතාව පිළිබඳ ව දැනුම් දෙමින් රාගයක් වීමට අත්‍යාවශ්‍ය කරුණු රාශියක් ඇතිබව ද පවසන්න.
- එම කරුණු ඇතුළත් ගීත ලක්ෂණ ගීත බව හඳුන්වමින් පාඩමට පිවිසෙන්න.

(මිනිත්තු 10)

පියවර 02

- දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කොට ලක්ෂණ ගීතය ගායනයට/වාදනයට හුරු කරවන්න.
- පද පමණක් ලියා ගැනීමට සලස්වා එය ගැයීමට හුරු වූවායින් පසු ස්වර ප්‍රස්තාරය ගැයීමට පුහුණු කරවන්න.
- ගයන අතරතුරෙහි පද මාලාවෙන් කියැවෙන රාග ලක්ෂණ පිළිබඳ ව අදහස් මතු කරමින් ගයන්න.

(මිනිත්තු 30)

පියවර 03

- තනි තනි ව ගයා/වයා සදොස් තැන් නිදොස් කරන්න.
- වාචික ප්‍රශ්න මඟින් රාග විස්තර පිළිබඳ මතකය හා අවබෝධය පිරික්සන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- ගායන කුසලතාව හා රාග විස්තර පිළිබඳ අවබෝධය මැනෙන සේ ඇගයීම සකස් කරන්න.

(මිනිත්තු 10)

**අතිරේක උදවු :-**

ගීතයේ ඇතුළත් රාග විස්තර සටහන් පොතේ ලිවීමට සලස්වන්න.

ඇමුණුම:-

නිර්දේශිත ලක්ෂණ ගීත:-

* සපිරුණු රතියේ ලක්ෂණ ගීතය යොදා ගන්න.

**ක්‍රියාකාරකම 09**

# විදුලි ඕගනයේ මූලිකාංග

**නිපුණතාව 7.0** :- සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි.

**නිපුණතා මට්ටම 7.1** :- ජනප්‍රිය සංගීතයේ බහුලව භාවිත වන සංගීත භාණ්ඩ පිළිබඳ විමසයි.

**කාලච්ඡේද** :- 02

**ඉගෙනුම් පල** :-

- විදුලි ඕගනයේ මූලිකාංග නම් කරයි.
- විදුලි ඕගනයේ මූලිකාංග තවදුරටත් සොයා බැලීමට කැමැත්ත පළ කරයි.
- විදුලි ඕගනයේ මූලිකාංග ඇසුරින් තමනට වුවමනා හඬ/නාද සකස් කර ගනියි.

**ගුණාත්මක යෙදවුම් :-**

- විදුලි ඕගනයක් හෝ කිහිපයක්.
- දෘශ්‍යාධාර හා කාර්ය පත්‍රිකා
- කියවීම් පත්‍රිකා

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

විදුලි ඕගනය යනු වර්තමානයේ තාක්ෂණික වශයෙන් ඉතා ඉහළ ම දියුණුවක් ලබා ඇති සංගීත භාණ්ඩයක් ලෙස නම් කළ හැකිය. මුල් කාලයේ pipe organ ඇසුරින් සංවර්ධනය වී පසු ව සින්තසයිසර් ආදී වශයෙන් දියුණු වී අද වන විට work station දක්වා දියුණු වී ඇත. work station නමැති විදුලි ඕගනය වාදනය සඳහා පමණක් නොව, නිර්මාණ සඳහා ද උපයෝගී කර ගත හැකි වේ. එමඟින් ගීතයක් නිර්මාණය කොට පටිගත කර සංගීත කෘතියක් වශයෙන් නිකුත් කළ හැකි ව තිබේ. එහි දී තමන්ට අවශ්‍ය අයුරින් තාල ස්වර වාදනයක් නිර්මාණය කොට තමාගේ නිර්මාණය උපරිම අයුරින් නිම කර ගත හැකි වීම සුවිශේෂ ය. වෙළෙඳ පොළේ විවිධ නම්වලින් මිල දී ගැනීමට ඇති විදුලි ඕගන් අතුරින් ලංකාවේ වඩාත් ම පොදු ජනතාව අතර ප්‍රචලිත වී ඇත්තේ YAMAHA සහ CASIO යන වෙළෙඳ නාම සහිත ඕගන් ය. එහෙත් වෘත්තීය ඕගන් වාදන ශිල්පීන් අතර වඩාත් ම ප්‍රචලිත ව ඇත්තේ ROLAND සහ KORG යන ඕගන් වර්ග ය.

ප්‍රසංග වේදිකා සංගීත කණ්ඩායම් අතර මෙන් ම ඒක පුද්ගල/ද්වි පුද්ගල සංගීත කණ්ඩායම් අතර ද, සියළු පෙරදිග වාද්‍ය වෘන්ද වල ද මෙම භාණ්ඩයට විශාල තැනක් හිමි ව ඇත.

**පාඩම සංවර්ධනය :-**

පියවර 01

- දෘශ්‍යාධාරය (1) රූප සටහන සිසුනට ප්‍රදර්ශනය කරන්න.
- එම භාණ්ඩය පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- පහත සඳහන් කරුණු මතු වන සේ සාකච්ඡාව මෙහෙයවන්න.
  - විදුලි ඕගනය භාවිත වන අවස්ථා.
  - විදුලි ඕගනය සංගීත කටයුතු වලදී ප්‍රධාන තැනක් ගන්නා බව.
  - මෙහි settings වල ඇති වටිනාකම පිළිබඳ ව සාකච්ඡාව මෙහෙයවන්න. (මිනිත්තු 30)

පියවර 02

- පන්තිය කණ්ඩායම් දෙකකට බෙදන්න.
- කියවීම් පත්‍රිකා කණ්ඩායම් දෙකට ලබා දෙන්න.
- එම පත්‍රිකා කියවීමට අවස්ථාව සිසුනට ලබා දෙන්න.

(මිනිත්තු 25)

පියවර 03

- එක් එක් කණ්ඩායමකට පළමු/දෙවන දෘශ්‍යාධාරයේ තිබූ විස්තර ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එම කරුණු තවත් පැහැදිලි කර ගැනීමට සිසුනට අවස්ථාව දෙන්න.
- ඕගනයක් ගෙන (තවත් ඕගන් ඇත්නම් සිසුනට බෙදා දෙන්න.) ඉහත කරුණු අත්හදා බලමින් සිසුනට පැහැදිලි කරන්න.
- එම කරුණු පැහැදිලි කිරීමට සිසුනට අවස්ථාව ලබා දෙන්න.
- නැවත එම කරුණු පිළිබඳ සමාලෝචනයක් කරන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ෘ-**

- සිසුනට කරුණු පැහැදිලි කිරීමට අවස්ථාව ලබා දී අගයන්න.

(මිනිත්තු 10)

**දෘශ්‍යාධාරය (1)**




**කියවීම් පත්‍රිකා (පිටපත් 4)**

**කියවීම් පත්‍රිකා (2) (පි**

Voice / Style

| | |
|---|---|
| සංගීත භාණ්ඩ තෝරා ගැනීමට ඇති ස්විචයයි. මෙය තෝරා ඉන් පසු ඕගනයේ ඇති අංක පුවරුවෙන් අවශ්‍ය අංකය තෝරා ගැනීමෙන් අවශ්‍ය සංගීත භාණ්ඩයේ නාදය ලබා ගත හැකිය. මෙය සමහර ඕගන්වල Tone නමින් ද සඳහන් වේ. | අවශ්‍ය තාලය නැතහොත් drum beat එක තෝරා ගැනීම සඳහා භාවිත කරන ස්විචය යි. මෙය තෝරා අංක පුවරුවෙන් අදාළ Beat එකට ඇති අංකය ඇතුළු කිරීමෙන් එය ලබා ගත හැකිය. මෙය Beat වශයෙන් ද භාවිත වේ.<br>Tempo - මෙය අදාළ තාලයේ ලය නැතහොත් වේගය සීරුමාරු කරගත හැකි ස්විච් 2කි. එකකින් වේගය වැඩි කළ හැක. අනිකෙන් වේගය අඩු කළ හැකිය. |


## Auto Accompony

ගීතයක් chord සමග වාදනය කිරීමේ දී මෙම ස්විචය තෝරා ගත යුතු ය. බොහෝ විද්‍යුත් ඕගන්වල මෙය සඳහන් ව ඇත්තේ Auto Accomp ලෙස ය. මෙය තෝරා ගැනීමෙන් ඕගනයේ අප විසින් තෝරා ගත් drum beat එක අනෙකුත් Bass, rhythm, pad ආදිය සමඟ වාදනය කළ හැකිය. මෙම පහසුකම් ද තවත් කොටස් කිහිපයකට වෙන් කර දැක්විය හැකිය. එනම්

Fingerd/single fingerd..... ආදි වශයෙනි.

මෙම ස්විචය තෝරා ගැනීමෙන් අවශ්‍ය chord එක වාදනය කළ යුතු ය. (එනම් chord එකට අදාළ සියලු ස්වර වාදනය කළ යුතු ය.

මෙම ස්විචය තෝරා ගත් විට chord එකක් වාදනය කිරීමට එම කෝඩ් එකේ පළමු ස්වරය වාදනය කිරීම පමණක් ප්‍රයෝජනවත් වේ.



**ක්‍රියාකාරකම 10**

## එකෝඩියන් සහ එහි ස්වර පිහිටන අයුරු

**නිපුණතාව 7.0** :- සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි.

**නිපුණතා මට්ටම 7.1** :- ජනප්‍රිය සංගීතයේ බහුල ව භාවිත වන සංගීත භාණ්ඩ පිළිබඳ විමසයි.

**ක්‍රියාකාරකම 7.2.2** : 'එකෝඩියන් සහ එහි ස්වර පිහිටන අයුරු....'

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :
- එකෝඩියන් සංගීත භාණ්ඩයේ ස්වභාවය පැහැදිලි කරයි.
- මෙම භාණ්ඩය වාදනයට පෙලඹෙයි.
- දකුණත සහ වමත භාවිත කරමින් ස්වර වාදනය කරන අයුරු නිරූපණය කර පෙන්වයි.

**ගුණාත්මක යෙදවුම්**
- ඇමුණුම් 01 ඇතුළත් ඡායාරූප
- ඇමුණුම අංක 02හි ඇතුළත් කියවීම් පත්‍රිකාව.
- ඇමුණුම් අංක 03හි ඇතුළත් කාර්ය පත්‍රිකාව.
- එකෝඩියන් සංගීත භාණ්ඩයක් (පන්තියේ සිසුන් සංඛ්‍යාවට අවශ්‍ය ප්‍රමාණයට සපයා ගැනීම.)
- එකෝඩියන් වාදනයක් ඇතුළත් දෘශ්‍යාධාරකයක් (සංගම් චිත්‍රපටයේ එකෝඩියන් වාදනය ඇතුළත් දර්ශනයක් සහිත VCD තැටියක්)

**ක්‍රියාකාරකම සැලසුම් කිරීමට උපදෙස්**

එකෝඩියන් වාද්‍ය භාණ්ඩය වත්මනෙහි වැඩි වශයෙන් දක්නට නොලැබෙන සංගීත භාණ්ඩයකි. විද්‍යුත් ස්වර පුවරු ජනප්‍රිය වීමට පෙර එකෝඩියනය ඉන්දියානු චිත්‍රපට සංගීතයේත්, ලංකාවේ කණ්ඩායම් සංගීතයේත් ඉතා ජනප්‍රිය ව භාවිත වූ සංගීත භාණ්ඩයක් විය. සමහර අවස්ථාවල දී බටහිර තූර්ය වාදක කණ්ඩායම්වල පවා එකෝඩියනය බහුල ව යොදාගත් අවවස්ථා තිබිණි. පහසුවෙන් එළිමහනේ වාදනය කළ හැකි ස්වර පුවරු භාණ්ඩයක් වූ එකෝඩියනය මඟින් ගීතයත්, අවශ්‍ය රිද්මයත් එක විට වාදනය කිරීමට හැකි වීම මේ භාණ්ඩයේ ඇති විශේෂත්වයකි. එහෙත් මේ වන විට මේ භාණ්ඩය කෙමෙන් භාවිතයෙන් ඉවත් ව යමින් පවතින බවක් පෙනේ. එම නිසා වත්මන් සිසු පරපුරට මේ භාණ්ඩය හඳුන්වා දී ජනප්‍රිය කරවීම මේ පාඩමෙන් අපේක්ෂා කෙරේ. මේ සඳහා පාසලේ තූර්ය වාදන කණ්ඩායමේ හෝ බටහිර සංගීත අංශයේ හෝ ඇති එකෝඩියන් ලබා ගනිමින් ඇමුණුම් භාවිත කරමින් පාඩම සංවර්ධනය කර ගන්න.

**පියවර 1**
- එකෝඩියන් වාදනය ඇතුළත් දෘශ්‍යාධාරය සිසුන්ට පෙන්වා එහි වාදන කොටස් ඇසීමට/බැලීමට සලස්වන්න.
- ඇමුණුම් අංක 1හි ඇතුළත් එකෝඩියන් භාණ්ඩයේ ඡායාරූප පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- ඔබ සපයා ගෙන ඇති එකෝඩියන වාදනය කිරීම සඳහා උපයෝගී කර ගන්නා ආකාරය පිළිබඳ ව පහත සඳහන් කරුණු මතුවන සේ පැහැදිලි කරන්න.

  - වාදන ඉරියවු සඳහා එකෝඩියනය පැලඳ ගැනීම.

- දකුණතින් ස්වර පුවරුව හා වමතින් බේස් පුවරුව යොදා ගැනීම.
- එකෝඩියනයේ මුහුණතෙහි ඇති බොත්තම් මඟින් නාදය හසුරුවා ගැනීම.
- බැලෝවේ සුළං පාලනය කර ගැනීම.

(මිනිත්තු 10)

පියවර 2

- ඇමුණුම් 2 කියවීම් පත්‍රිකාව හා ඇමුණුම් 3 කාර්ය පත්‍රිකාව සිසුන් අතර බෙදා දෙන්න.
- සිසුන් එම ක්‍රියාකාරකම්හි යොදවන්න.
- නිවැරදි අතැඟිලි භාවිත ක්‍රම පිළිබඳව සිසුන් දැනුම්වත් කරන්න.

(මිනිත්තු 30)

පියවර 3

- කාර්ය පත්‍රිකාවේ සඳහන් බේස් බොත්තම්වල ස්වර යෙදෙන ආකාරය පිළිබඳ ව එක් කණ්ඩායමකට විස්තර කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- Major හා Minor කෝඩ් ඇති බොත්තම් අතරින් CFG යන කෝඩ්ස් රිද්මානුකූල ව වාදනය කිරීමට එක කණ්ඩායමකට හෝ සිසුවකුට හෝ ඒ සඳහා අවස්ථාව ලබා දෙන්න.
- ඔබ එම කාර්යයන් පිළිබඳව සමාලෝචනයක යෙදෙන්න.
  - එකෝඩියනය සුසිර වාද්‍ය භාණ්ඩයක් බව.
  - මෙය බටහිර සංගීත භාණ්ඩයක් වුව ද පෙරදිග ද බහුල ව භාවිත වෙන බව.
  - සරල සංගීතය සඳහා යොදාගෙන ඇති බව.
  - එකෝඩියනයේ ස්වර පුවරුව දකුණතින් හා බේස් පුවරු වමතින් ද වාදනය කරන බව.
  - පියානෝ එකෝඩියනය හා බටන් එකෝඩියනය වශයෙන් වර්ග දෙකක් ඇති බව.

  දකුණතින් ගීතයත් වමතින් තාලයත් (Bass & Chords) රිද්මානුකූල ව එකතු වීමෙන් වාදනය කරන එකෝඩියනය ඉතා විචිත්‍ර සංගීත භාණ්ඩයක් බව.

(මිනිත්තු 30)

**ඇගයීම් සහ තක්සේරුකරණය සඳහා උපදෙස්:-**

එකෝඩියනයක් සපයා ගතහැකි නම් වාදනය කරන ආකාරය අනුව අගයන්න.

**අතිරේක උදව්**

•'ස්වර පුවරු සංගීත භාණ්ඩ' - ආර්. එම්. පී. චන්ද්‍රසිරි රණසිංහග

ඇමුණුම (1)






ඇමුණුම (2)

## කියවීම් පත්‍රිකාව

එකෝඩියනය බටහිරින් ආරම්භ ව ලොව පුරා ව්‍යාප්ත වී ඇති ස්වර පුවරු භාණ්ඩයකි. 19 වන සියවසේ පමණ එළි දක්වන ලද එකෝඩියනය button & piano accordian වශයෙන් වර්ග දෙකකි. මෙය සුළඟේ ආධාරයෙන් නාදය නිපදවන 'සුසිර' ගණයට අයත් ය. මෙහි බැලෝව සර්පිනාවේ බැලෝවට වඩා විශාල වීම විශේෂත්වයකි. එය ඇදීමෙන්, තල්ලු කිරීමෙන් යන දෙආකාරයෙන් ම ස්වර නිකුත් වන සේ නළා යොදා ඇත. සැම විට ම එක් ස්වරයක් සඳහා නළා යුගලයක් සම්බන්ධ කර ඇත. කරෙහි එල්ලා ගත් එකෝඩියනයේ දකුණු පස ඇති යතුරු, පියානෝවේ යතුරුවලට සමාන ය. එම යතුරුවලින් ගීතයේ තනුව වාදනය කරයි. වම් පස ඇති බොත්තම්වලින් bass & chord රිද්මයානුකූලව වාදනය කරයි. මෙම එකෝඩියන් වෙළෙඳ පොළේ ප්‍රමාණ කිහිපයකින් දක්නට ලැබේ. එනම් Bass 16 - 18 - 32 - 48 - 60 - 96 - 120 - 160 ආදි වශයෙනි.

දකුණත උපයෝගී කර ගනිමින් ගීතයක තනුව වයන විට වමතින් Bass button රිද්මානුකූල ව එබීමෙන් වාදනය ඉතා විචිත්‍ර කර ගත හැකිය. ඔබ පාසලේ එකෝඩියනයක් ඇත්නම් පහත සඳහන් විස්තර පිරික්සා බලන්න.

- වමතින් වැයෙන Bass button තිරස් අතට 4 6 8 ලෙස පෙළ ගැසී ඇත් දැයි සොයා බලන්න.
- බැලෝව දෙසින් සිරස් අතට ඇති Bass button 2 වන පේළියේ මැදට වන්නට වූ බොත්තමක මධ්‍ය ෂඩ්ජය Middle C පිහිටා ඇත.
- එය හඳුනා ගත හැකි පරිදි අනිත් බොත්තම්වලට වඩා එහි උඩු කොටස ඇතුළට නෙරා යන අන්දමට පිහිටුවා ඇත.
- වමතේ මැදඟිල්ලෙන් එය පිරිමැදි විට පහසුවෙන් හසු වේ.

උදා :- 48 Bass එකෝඩියනය Bass button දෙවන පෙළෙහි ඉහළ සිට පහළින් ඇති 6 වන බොත්තමේ මධ්‍ය ෂඩ්ජය පිහිටා ඇත.

- 3 හා 4 පේළිවල පිළිවෙළින් Major Minor Chords පිහිටා ඇත.
- - 1 වන බොත්තමේ ඇත්තේ 3 වන බොත්තමේ පිහිටා ඇති ස්වර සංචිතයේ 2 වන ස්වරය යි.

උදාහරණයක් ලෙසට එම පේළිය ගත් විට ග ස ලෙස C major C minor දක්විය හැකිය.

ඇමුණුම 3

**කාර්ය පත්‍රිකාව**

• කොටස් නම් කරන ලද එකෝඩියනය රූප සටහනක් තම සටහන් පොතේ පිටපත් කර ගන්න.

• එහි Bass button පේළි 3 ක කොටසක් පහත දක්වේ.

| | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|
| i | - | ප | - | - |
| ii | ග | ස | C major | C minor |
| iii | - | ම | - | - |

මෙහි සිරස් අතට රෝම ඉලක්කම්වලින් දක්වෙන කොටු අයත් වන්නේ G C F Chords වලට යි.

2 ඉලක්කම පහළට ඇති කොටුවල එම Chrods තුන ලියා ඇත.

3 හා 4 කොටුවල ඇත්තේ major minor Chrods හඬයි.

එම රූප සටහන හොඳින් අධ්‍යයනය කර ඉතිරි හිස් කොටු පුරවන්න.

ඔබේ පහසුව සඳහා G C F Chrods වල අදාළ ස්වර ලියා ඇත.

| Major Chords | Minor Chrods |
|---|---|
| C Major - C E G (ස ග ප) | C Minor C $E^b$G (ස <u>ග</u> ප) |
| F Major - F A C (ම ධ ස) | F Minor F $A^b$C (ම <u>ධ</u> ස) |
| G Major - G B D (ප නි රි) | G Minor G $B^b$D (ප <u>නි</u> රි) |

එකෝඩියන් පිළිබඳ ව තව දුරටත් හැදෑරීම සඳහා අන්තර්ජාලයේ පහත සඳහන් වෙබ් අඩවිවලට පිවිසෙන්න.

www.accordians.com

සහ you tubeහි accordian යන්න සටහන් කොට වීඩියෝ සොයා නරඹන්න.

**ක්‍රියාකාරකම 11**

## විදුලි ඕගන්, සර්පිනා, එකෝඩියන් භාණ්ඩවලින් ගීතයක් වාදනය කිරීම

**නිපුණතාව 7.0** :- සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි.

**නිපුණතා මට්ටම 7.1** :- ජනප්‍රිය සංගීතයේ බහුල ව භාවිත වන සංගීත භාණ්ඩ පිළිබඳ විමසයි.

**කාලච්ඡේද** :- 03

**ඉගෙනුම් පල** :-

- විදුලි ඕගන්, සර්පිනා, එකෝඩියන් භාණ්ඩවලින් ගීතයක් වාදනය
- උක්ත සංගීත භාණ්ඩවල පිහිටා ඇති සියලු ස්වර නම් කරයි.
- එම භාණ්ඩවලින් සරල ගීතයක් වාදනය කරයි.
- ඇඟිලි පුවරුව (finger board) මත ස්වර පිහිටා ඇති අයුරු පැහැදිලි කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- විදුලි ඕගන්, සර්පිනා, එකෝඩියන් භාණ්ඩ
- මෙම භාණ්ඩවලින් වයන ලද වාදන අඩංගු හඬ පටයක් හා වාදන යන්ත්‍රයක්.

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

උක්ත භාණ්ඩ නිවැරදි ව සුසර කරන අයුරු පහදා දෙන්න. සරල ස්වර රටා වාදනය කරමින් ළමා ගී හා සරල ගීත වාදනයට ක්‍රමයෙන් හුරු කරවන්න. ස්වර පුවරුවේ ඇඟිලි හැසිරවීම සඳහා අභ්‍යාස ලබා දෙන්න.

**පාඩම සංවර්ධනය :-**

පියවර 01

- වාදන අඩංගු හඬ පට සිසුන්ට ශ්‍රවණයට සලස්වා ඒ පිළිබඳ සාකච්ඡා මෙහෙයවමින් පාඩමට පිවිසෙන්න.

(මිනිත්තු 10)

- ඔබ සකස් කර ගත් ස්වර ප්‍රස්තාර පත්‍රිකා සිසුනට බෙදා දෙමින් වාදන ක්‍රම පිළිබඳ සිසුන්ට හුරු කරමින් මඟ පෙන්වන්න.

(මිනිත්තු 10)

පියවර 02

- පළමු දෘශ්‍යාධාරයේ සඳහන් දුර පෙනෙන තැනිතලා ගීතයේ ස්වර ප්‍රස්තාරය සිසුනට ප්‍රදර්ශනය කරන්න. එය වාදනයට හුරු කරවන්න.

(මිනිත්තු 10)

- පළමු ගීතය හොඳින් හුරු වූ පසු දෙවැනි දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කොට එහි ඇති ප්‍රස්තාරය වාදනයට හුරු කරවන්න.

(මිනිත්තු 10)

පියවර 03

- එක් එක් සිසුවා කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් වාදන කුසලතා ප්‍රගුණ කරවන්න.

- කණ්ඩායම් වශයෙන් සිසුන් වර්ග කොට එක කණ්ඩායමකට එක සංගීත භාණ්ඩය බැගින් ලබා දී මෙම ගීත අභ්‍යාස කරවන්න.

(මිනිත්තු 10)

- වාදනය කරන අයුරු නිරීක්ෂණය කොට ප්‍රශංසා කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- සිසුන්ගේ වාදන ඉරියව්, වාදනයේ ප්‍රිය භාව ආදිය අගයන්න.

(මිනිත්තු 10)

**පැවරුම :-**

අන්තර්ජාලයේ ඇති විදුලි ඕගන්, සර්පිනා, එකෝඩියන් වාදන පිළිබඳ වීඩියෝ එකතු කිරීමට පොලඹවන්න.

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ග ම | (C) ප | - | ග | (F) ම | ප | ධ | (C) ප | ග | - | - | ග | ම |
| | ප | - | ග | (F) ම | ප | ධ | (C) ප | ග | - | - | ග | ම |
| | (C) ප | - | ග | ස | - | - | (F) ම | - | රි | (G) නි̣ | - | - |
| | (F) ධ | - | ප | (G) ම | රි | නි̣ | (C) ස | - | - | - | - | - |
| | (C) ප | ස්̇ | ස්̇ | (F) ස්̇ | නි | ධ | (G) ප | නි | නි | (G) නි | ධ | ප |
| | (F) ම | ධ | ප | ප | ම්́ | ප | (G) ග | - | - | ප | - | - |
| | (G) රි | ප | ම | (C) ග | - | (G) රි | (C) ස | - | - | - | - | - |
| | (C) ග | ප | ප | ග | ප | - | (F) ම | ධ | ධ | ම | ධ | - |
| | (G) නි | නි | ප | නි | රි̇ | නි | (C) ස̇ | - | - | (G) නි | ධ | ප |
| | (G) ග | ප | ප | ග | ප | - | (C) ම | ධ | ධ | (G) ම | ධ | - |
| | (C) නි | නි | ප | නි | රි̇ | නි | (C) ස්̇ | - | - | - | - | - |
| | (C) ස්̇ | ග්̇ | ග්̇ | (G) රි̇ | රි̇ | - | (C) ස්̇ | - | ස්̇ | (G) නි | නි | - |
| | (F) ධ | ධ | ධ | (C) ප | ම | ප | (C) ග | - | - | (G) ප | - | - |
| | (G) රි | ප | ම | (C) ග | - | (G) රි | (C) ස | - | - | - | - | - |

අතැගිලිවල හසුරු කුසලතා මැනවින් ගොඩනැඟී ඇති සිසුන් සඳහා පහත දැක්වෙන ගීතය ද යොදා ගත හැකි ය.

සෝබන සැන්දෑවේ

| | | | |
|---|---|---|---|
| (C) | (G7) | (C) | |
| පු̣ ස ග ප | ම රි නි̣ රි | ස - - - | - - - - |
| (C) | | (F) | (C) |
| ග - ස ග | ප ම´ ධ ප | ම - - ග | ප - - - |
| (G) | | (C) | |
| පු̣ නි̣ රි ම | ග ග රි රි | ස - - - | - - - - |
| (C) | | (F) | (C) |
| [ ග ග ස ග | ප - - - | ධ ප ම´ ධ | ප - - - ] |
| (C) | (G) | (C) | |
| ග ම ප ධ | නි නි ධ ධ | ප - ම - | ග - රි - |
| (G) | | (C) | |
| ප නි̣ රි ම | ග ග රි රි | ස - - - | - - - - |

**ක්‍රියාකාරකම 12**

## ගිටාරයේ ස්වර පිහිටීම හා chord වාදනය

**නිපුණතාව 7.0** :- සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි.

**නිපුණතා මට්ටම 7.1** :- ජනප්‍රිය සංගීතයේ බහුලව භාවිත වන සංගීත භාණ්ඩ පිළිබඳව විමසයි.

**කාලච්ඡේද** :- 03

**ඉගෙනුම් පල** :-

- ගිටාරයේ තත් සුසර කරන අයුරු ප්‍රකාශ කරයි.
- ගිටාරයේ ස්වර පිහිටා ඇති අයුරු පැහැදිලි කරයි.
- ගිටාරයේ ඇඟිලි පුවරුවේ පිහිටා ඇති සියලු ස්වර නම් කරයි.
- minor සහ major කෝඩ් කිහිපයක් වාදනය කරයි.
- එම කෝඩ් ඇඟිලි පුවරුව (finger board) මත පිහිටා ඇති අයුරු පැහැදිලි කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- ගිටාරයක් හෝ කිහිපයක් හෝ, දෘශ්‍යාධාර කිහිපයක්, ගිටාර් වාදනයක් අඩංගු හඬ පටයක් හා වාදන යන්ත්‍රයක්.

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

ගිටාරයේ ඉතිහාසය, ව්‍යුහය, ප්‍රචලිත වී ඇති සංගීත ක්‍රම ආදිය පිළිබඳ කරුණු සොයා කියවීම් පත්‍රිකාවක් සකස් කර ගන්න. ගිටාර් කිහිපයක් සපයා ගත හැකි නම් පාඩම ඉතා සාර්ථක වනු ඇත.

**පාඩම සංවර්ධනය :-**

පියවර 01

- ගිටාර් වාදනය අඩංගු හඬ පටය සිසුන්ට ශ්‍රවණයට සලස්වා ඒ පිළිබඳ සාකච්ඡාව මෙහෙයවමින් පාඩමට පිවිසෙන්න.

(මිනිත්තු 10)

- ඔබ සකස් කර ගත් කියවීම් පත්‍රිකා සිසුනට බෙදා දෙමින් ගිටාරයේ ඉතිහාසය, ව්‍යුහය, ගිටාර් වර්ග, වාදන ප්‍රකාර ආදිය පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10)

පියවර 02

- පළමු දෘශ්‍යාධාරය සිසුනට ප්‍රදර්ශනය කොට ගිටාරයේ තත් සුසර කරන ආකාරය පැහැදිලි කරන්න. ඔබ ළඟ ඇති ගිටාරය හාර්මෝනියම් එකක් භාවිත කරමින් සිසුනට ප්‍රදර්ශනය වන ඇසුරින් සුසර කොට පෙන්වන්න. නැතහොත් ඔබ ළඟ ඇන්ඩ්‍රොයිඩ් දූරකථනයක් ඇත්නම් එහි tunning app එකක් භාවිත කරමින් ගිටාරය සුසර කොට පෙන්වන්න.

(මිනිත්තු 10)

- දෙවැනි දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කොට ගිටාරයේ ඇඟිලි පුවරුව මත ස්වර පිහිටන ආකාරය පිළිබඳ සිසුන්ට පැහැදිලි කරන්න. (මෙහි දී එහි ඇති රවුම ආධාරයෙන් ස්වර 12 පිළිබඳ නැවත සිහිපත් කර එක් එක් fret එකක් සකසා පිළිවෙළට ස්වර යෙදිය හැකි බව පැහැදිලි

කරන්න. සිසුනට එසේ කිරීමට උපදෙස් දෙන්න.

- 3 වන දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කොට මුලින් ම වම් අතේ ඇඟිලි අංකනය කරන අයුරු පහදන්න. ඉන් පසු E minor, D, C යන කෝඩ් හඳුන්වා දෙන්න. කාෆි රාගයට සමාන නැතහොත් minor scale එකක් ගැයෙන ඕනෑ ම ගීතයක් මෙම කෝඩ් තුන (3 chord) භාවිතයෙන් වාදනය කළ හැකි බව පහදන්න. ගිටාරයේ පුවරුව මත මෙහි දැක්වෙන ලෙස ඇඟිලි තබා පෙන්වා සිසුනට ද එසේ කිරීමට උපදෙස් දෙන්න.

(මිනිත්තු 10)

- 4 වන දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කොට D, G, A කෝඩ් හඳුන්වා දෙන්න. ඇඟිලි තබන අයුරු සිසුනට පෙන්වන්න. සිසුනටත් එය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

පියවර 03

- 3 වන සහ 4 වන දෘශ්‍යාධාර ප්‍රදර්ශනය කොට මෙම කෝඩ් මාරු කරමින් වාදනයට හුරු විය යුතු බව පහදන්න. ඒ සඳහා මෙම අභ්‍යාස භාවිත කළ හැකි බව පෙන්වා සිසුන් ව අභ්‍යාසයේ යොදවන්න. (මෙහිදී එක් විභාගයක් රි ම යනුවෙන් එක වරක් වාදනය කරමින් තාලානුකූල ව වාදනයෙහි යොදවන්න.
- කණ්ඩායම් වශයෙන් සිසුන් වර්ග කොට එක කණ්ඩායමට එක ගිටාරයක් හෝ ලබා දී මෙම අභ්‍යාස කරවන්න. වැරදි ලෙස ඇඟිලි තබා ඇත්නම් නිවැරදි කරන්න.

(මිනිත්තු 10)

- වාදනය කරන අයුරු නිරීක්ෂණය කොට පසසන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**


- සිසුන්ගේ වාදන ඉරියවු, වාදනයේ ප්‍රිය භාව ආදිය අගයන්න.

(මිනිත්තු 10)


**පැවරුම :-**

අන්තර්ජාලයේ ඇති ගිටාර් වාදන පිළිබඳ වීඩියෝ එකතු කිරීමට පොලඹවන්න.


දෘශ්‍යාධාරය (1)




දෘශ්‍යාධාරය (2) (A)



දෘශ්‍යාධාරය (2) (B)




දෘශ්‍යාධාරය (3)


**D chord**





**C chord**



**$E^m$ chord**




**Left hand**

දෘශ්‍යාධාරය (4)

**D chord**




**G chord**




**A chord**



<u>දෘශ්‍යාධාරය (5)</u>

| | | | |
|---|---|---|---|
| $E^m$ | — | — | — |
| D | — | — | — |
| C | — | — | — |
| $E^m$ | — | D | — |
| C | — | $E^m$ | — |
| $E^m$ | D | C | $E^m$ |
| $E^m$ | C | D | C |
| $E^m$ | — | D | C |

<u>දෘශ්‍යාධාරය (6)</u>

| | | | |
|---|---|---|---|
| D | — | — | — |
| G | — | — | — |
| A | — | — | — |
| D | — | G | — |
| A | — | D | — |
| D | G | A | D |
| D | A | G | D |

ක්‍රියාකාරකම 13

# ශ්‍රී ලංකා ගුවන් විදුලිය ආශ්‍රිත ව ගොඩ නැඟුණු කණ්ඩායම් ගීත

**නිපුණතාව 5.0** : සරල සංගීතය හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 5.3** : ශ්‍රී ලංකාවේ පැවති කණ්ඩායම් ගී පිළිබඳ සාකච්ඡා කරමින් අගය කරයි.

**ක්‍රියාකාරකම** : ශ්‍රී ලංකා ගුවන් විදුලිය ආශ්‍රිත ව ගොඩ නැඟුණු කණ්ඩායම් ගීත

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :
- ශ්‍රී ලංකාවේ පැවති කණ්ඩායම් ගී පිළිබඳ අදහස් දක්වයි.
- ඒවායේ පවතින සාධනීය ලක්ෂණ විමසයි.
- කණ්ඩායම් ගීත අගය කරයි.
- කණ්ඩායම් ගීයක් නිර්මාණයට හා ගායනයට පෙලඹෙයි.

**ගුණාත්මක යෙදවුම්**
- ඇමුණුමේ දැක්වෙන තොරතුරු ඇතුළත් දෘශ්‍ය උපකරණ
- ස්වර වාද්‍ය භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

ශ්‍රී ලංකාවේ කණ්ඩායම් ගීත එක්තරා කාල වකවානුවක මෙරට රසිකයන්ගේ ජනාදරයට පත් ගීත විශේෂයක් විය. එමෙන් ම සමාජය තුළ විවිධ සාමූහික කටයුතු හා සම්බන්ධ ව ගී ගයන අවස්ථාවල දී කණ්ඩායම් ගීතයක් නැති ව ම බැරි අංගයක් බවට පත් විය. ශාස්ත්‍රීය ගායනයක මෙන් මීන්ඩ්, ගමක් ආදි විවිධ ශිල්පාංග නොමැති වුව ද, වඩා පුළුල් සහ සංකීර්ණ තනු නොවුණ ද, ආධුනිකයන්ගේ ගායන කුසලතාව ඇති කිරීමට සමත් වූ ගීත විශේෂයක් විය. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව කණ්ඩායම් ගී සඳහා වෙන ම ගුවන් කාලයක් ලබා දුන් වකවානුවක් ද විය. එබැවින් ශ්‍රී ලාංකේය සංස්කෘතිකාංගයක් ලෙසට කණ්ඩායම් ගීත තව දුරටත් සමාජය තුළ ව්‍යාප්ත කිරීමටත්, ඒවායේ ගති ලක්ෂණ ඊළඟ පරම්පරාවේ ව්‍යවහාරික සංගීත නිර්මාණ කෙරෙහි දායාද කිරීමටත් අපේක්ෂාවෙන් මෙම පාඩම ඇතුළත් කොට ඇත.

පාඩම සංවර්ධනය

**පියවර 01 :**
- ඇමුණුමේ දැක්වෙන කණ්ඩායම් ගීත අතරින් සුදුසු ගීතයක් ගායනය/වාදනය කර පාඩමට පිවිසෙන්න. ගීතය පිළිබඳ සාකච්ඡාවක යෙදෙන්න.

(විනාඩි 05)

**පියවර 02 :**
- දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කර හෝ ඇමුණුමේ දැක්වෙන තොරතුරු ඇතුළත් පත්‍රිකා සපයා හෝ කණ්ඩායම් ගීත පිළිබඳ ව සිසුන් අධ්‍යයනයේ යොමු කරන්න.

(විනාඩි 35)

**පියවර 03 :**
- කණ්ඩායම් ගීවල ඇති සාධනීය ලක්ෂණ සහ ඒවායේ ඇති සුවිශේෂ අගයන් සිසුන් සමඟ සාකච්ඡා කරන්න. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් ඒ සඳහා ලැබුණු දායකත්වය සිසුන් සමඟ සාකච්ඡා කරන්න. සිසුන් සමඟ ගීත හා කණ්ඩායම් පිළිබඳ ලැයිස්තුවක් සකසන්න.

(විනාඩි 35

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :
- ලිඛිත හෝ වාචික හෝ ක්‍රමයක් උපයෝගී කරගනිමින් අගයන්න.

(විනාඩි 05)

**පසු අභ්‍යාස** : • නිදහස් කාලවල දී කණ්ඩායම් ගීත කිහිපයක් ගායනය පිණිස හුරු වීමට සලස්වන්න.

**අතිරේක උදවු** : • ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතය - මහාචාර්ය සුනිල් ආරියරත්න

ඇමුණුම :-

- සිංහල කණ්ඩායම් ගීයේ නිර්මාතෘවරයා දක්ෂ ගිටාර් වාදක නෙවිල් ප්‍රනාන්දු ලෙස පිළිගැනේ.
- කණ්ඩායම් ගීත 1964 සිට ජනප්‍රිය විය.
- ස්පාඤ්ඤ සංගීතයේ ආශ්‍රය ලැබී ඇත.
- ගී තනු සීමිත ස්වර පරාසයකින් නිර්මාණය වී ඇත.
- එක ම තනුව නැවත නැවත ඇසේ.
- නර්තනශීලි රිද්ම ලක්ෂණයක් ඇත.
- කෝඩ් දෙකක් හෝ තුනක් හෝ මත තනු නිර්මාණය කර ඇත.
- සුසංවාද (හාර්මනී) ක්‍රමය භාවිත කර ඇත.
- භාවිතා කළ සංගීත භාණ්ඩ:- ස්පැනිෂ් ගිටාර්, ගයිරෝ, මර්කාස්, කොංගෝ ඩ්‍රම්ස්, බොංගෝ ඩ්‍රම්ස්, වයලින්
- එකල බොහෝ වියතුන් කණ්ඩායම් සංගීතය දුර්වල සංගීතයක් ලෙසට ඍණාත්මකව විවේචනය කර ඇති අතර ෂෙල්ටන් ප්‍රේමරත්න සංගීතඥයා එය සමාජීය අවශ්‍යතායක් ලෙසට අගය කර ඇත.
- ශ්‍රී ලංකාවේ මුල් ම ගායක කණ්ඩායම් දෙකකි. එනම් ලොස් කැබෙලරෝස්, සහ ලා සිලනියන්ස් යන කණ්ඩායම් දෙක යි.
- ලොස් කැබෙලරොස් කණ්ඩායම පිළිබඳ කෙටි සටහනක්:-
  නම ස්පාඤ්ඤ පදයකි. නායක නෙවිල් ප්‍රනාන්දු (දක්ෂ ගිටාර් වාදකයෙකි.)
  ප්‍රචලිත ගීත:- සී. ටී. ප්‍රනාන්දු සමඟ ගායනා කළ මගේ සුදු මාමේ
  සී. ඩී. ෆොන්සේකා. රසීනා යකීම් යුවළ සමඟ - උඩරට මැණිකේ මනහර.
  රුක්මණී දේවිය සමඟ - ලස්සණ රත්තරං බබෝ, පුන්සඳ හිනැහෙන්නේ, සඳක් නැගී සඳක් ගිලේ සාගරේ, මැණිකේ ඔබේ සිනාවෙන්
  ලොස් කැබෙලරෝස් ස්වාධීන ව - මල්බර හිමිදිරියේ
- ලා සිලනියන්ස් ගායක කණ්ඩායම පිළිබඳ කෙටි සටහනක්.
  බතික් සරම සමඟ අත් කොට තද පැහැති කමිසයක් ඇඳ පන්කොළ තොප්පියක් දමූ ඇඳුමක් භාවිත කර ඇත.
  නායක නොයෙල් බ්‍රයන් රණසිංහ සමඟ සාමාජික සංඛ්‍යාව හයකි.
  ප්‍රචලිත ගීත:- හොයියා හෝයියා, එක්සත් වී බේද නසා, තරුණ ජීවිතේ අපේ විනෝදයෙන්,
- 60-70 දශකය තුළ මෙරට බිහි වූ වෙනත් කණ්ඩායම් කිහිපයක්:- සමනළයෝ,
  මූන්ස්ටෝන් - (රුවන් පුරේ අපේ ගම තමයි. මංගෝ කළු නැන්දේ, මැණිකේ සුදු මැණිකේ,)
  ලා බම්බාස් (එන්න යන්න නෙළුම් විලේ නෙළුම් කඩන්න, උකුළේ කළේ තියාලා)
  ත්‍රී සිස්ටර්ස්, - (වන දෙව් ලිය තුරුලේ, ඔබ සොයනා කළු කෙල්ල මම යි.)
  ජිප්සීස් (පාවෙන පීරිසියක් උඩ නැගලා, දුන දුන වැරදී, ඕවත් වැඩ ද,)
  සුපර් ගෝල්ඩන් චයිම්ස් (කඳු සුරිඳුනි, මුව හසරැලි සාගරේ)
  ධර්මරත්න බ්‍රදර්ස් (හෝ වැස්ස වහිනවා)
  මී මැස්සෝ (මුළු ගත ම වෙහෙසුණා)
  ලොස් ෆ්ලෙමින්කෝස් (කළු කෙල්ලේ ඔබ හරිම හැඩයි )

පසු කාලීන ව කණ්ඩායම් සංගීතය මගින් ජනප්‍රිය වූ වාග්ගේයකාර යන නමින් හැඳින්විය හැකි ගායකයකු ලෙස ක්ලැරන්ස් විජේවර්ධන හැඳින්විය හැකි ය. (කාගෙද ගොන්වස්සා, මලට බඹරෙකු සේ, කඳු සුරිඳුනි ඔබෙ, කිම ද නාවේ, වන දෙව් ලිය තුරුලේ, දිල්හානි දුවනී, ගමෙන් ලියුමක් ඇවිල්ලා)

ක්‍රියාකාරකම 14

# කණ්ඩායම් ගීතයක් ගායනය

**නිපුණතාව 5.0** : සරල සංගීතය හා බැඳි සංගීතාංග පිළිබඳ ව අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 5.3** : ශ්‍රී ලංකාවේ පැවති කණ්ඩායම් ගී පිළිබඳ සාකච්ඡා කරමින් අගය කරයි.

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :
- කණ්ඩායම් ගීත විස්තර කරයි.
- ශ්‍රී ලංකාවේ පැවති කණ්ඩායම් ගී රසවිඳියි.
- කණ්ඩායම් ගීයක් ගායනය කරයි.
- නව කණ්ඩායම් ගීයක් නිර්මාණය කරයි.

**ගුණාත්මක යෙදවුම්**
- ඇමුණුමේ දැක්වෙන ගීතය ඇතුළත් දෘශ්‍ය උපකරණ
- ස්වර වාද්‍ය භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

මීට පෙර පාඩමින් කණ්ඩායම් ගී පිළිබඳ මෙම සිසුන් අධ්‍යයනය කර ඇත. ඒ පිළිබඳ සිසුන් මේ වන විට ඇල්මක් දක්වනු ඇත. මෙම පාඩමින් කණ්ඩායම් ගීතයක් සාමූහික ව ගායනයට යොමු කිරීම අපේක්ෂිත ය. මේ සඳහා ඇමුණුමේ දැක්වෙන ගීත දෙකෙන් එකක් යොදා ගන්න. එම ගීතය ගායනය කිරීමෙන් පසු කණ්ඩායම් ගීතයකට සුදුසු ලෙස ගී පාද හතරක් පමණ සිසුන් සමඟ නිර්මාණය කරන්න. C,F,G. යන කෝඩ් 3 පදනම් කර ගනිමින් ඉතා සරල තනුවක් සිසුන් සමඟ නිර්මාණය කර ගායනයට හුරු කරන්න.

**පාඩම සංවර්ධනය**

**පියවර 01 :**
- මීට පෙර පාඩමින් සිසුන් ලබා ගත් දැනුම ආවරණය වන පරිදි කෙටි විමසුමක් කර පාඩමට පිවිසිය හැකි ය.

(විනාඩි 05)

**පියවර 02 :**
- දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කර තෝරාගත් කණ්ඩායම් ගීතය ගායනයට හුරු කරන්න.

(විනාඩි 35)

**පියවර 03 :**
- කණ්ඩායම් ගීවල ඇති ලක්ෂණ පදනම් කරගනිමින් සරල ගී පද දෙකක් හෝ හතරක් හෝ සිසුන් සමඟ නිර්මාණය කරන්න. C,F,G යන කෝඩ් 3 පදනම් කරගනිමින් ඉතා සරල තනුවක් සිසුන් සමඟ නිර්මාණය කර ගායනයට හුරු කරන්න. (එක ම තනුවක ආකාරය පද හතරට ම දැක්විය හැකි ය.)

(විනාඩි 35

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :
- තනි තනි ව හෝ කණ්ඩායම් ලෙස හෝ ගායනයට සලසා අගයන්න.

(විනාඩි 05)

**පසු අභ්‍යාස** :
- නිදහස් කාලවල දී කණ්ඩායම් ගීතයක් නිර්මාණය කර ගායනය හුරු කරවන්න.

**අතිරේක උදවු** :
- ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතය - මහාචාර්ය සුනිල් ආරියරත්න පිටු අංක 186- 187- 214-215

# හෝයියා හෝයියා

**මුල් ශ්‍රැතිය : E major**

**තාලය : චෙම්බෙටො 6/8**

තනු නිර්මාණය සහ ගායනය :- ලා සිලොනියන්ස්

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ( + + P | - P - | S S - | S - - | - - S | - S - | N N - | N - - |
| ++හො | යියා S | හෝSයි | යා S S | S Sහො | යියා S | හෝS යි | යා S S |
| - - P | - P - | N N - | N - - | - - N | - N - | S S - | S - - ) |
| S Sහො | යියා S | හෝS යි | යා S S | S Sහො | යියා S | හෝS යි | යා S S ) |
| ( + + + | P P - | S - - | S - S | S - R | G - M | MP - - | - - - |
| + + + | චන් ද | යා S S | අ දු රු | අ හසෙ | එ යිනැ | ගී S S | S S S |
| - - - | P - P | M - M | M P M | G - G | R G R | S - - | - - - ) |
| S S S | සි සි ල් | සු ළ ඟ | අ ව ට | හ ම යි | වේSගෙ | නී S S | S S S ) |
| - - - | - - - | S - - | S - - | S - R | G - R | G - - | - - - |
| S S S | S S S | නා • S | වා S S | රැ ව ල | අ පි සැ | මා S S | S S S |
| - - - | - - - | N N N | M M M | M M G | R G R | S - - | - - - |
| S S S | S S S | ප දි මු | ප දි මු | වෙර ළ | බ ල බ | ලා S S | S S S |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ( S S S | S - R | G - - | - - - | R - - | R G R | S - - | - - - |
| ස මු ද්‍ර | රේ S ම | සු න් S | S S S | බොහෝS | ඇ ත ජ | ලේS S | S S S |
| N - N | N - R | M - - | - M M | G - - | R G R | S - - | - - - ) |
| ස ම ගි | යේS බ | ලේS S | S අ ප | ජී S ව | නේS බ | ලේS S | S S S ) |
| - - - | M - P | P - - | - - - | M - P | D - P | M - - | - - - |
| S S S | රා S ත්‍රී | යේS S | S S S | මේS ජ | ලා S ස | යේS S | S S S |
| - - - | - - - | M M P | - P - | M M P | - P - | M P M | G M R |
| S S S | S S S | පැ ද ප | ල්ලා S | පැ ද පු | ල්ලා S | වෙර ළ | බ ල බ |
| S - - | - - - | - - - | S - G | G - - | - - - | G - P | M - G |
| ලා S S | S S S | S S S | රා S ත්‍රී | යේS S | S S S | මේS ජ | ලා S ස |
| R - - | - - - | - - - | - - - | G G M | - M - | G G M | - M - |
| යේS S | S S S | S S S | S S S | පැ ද ප | ල්ලා S | පැ ද ප | ල්ලා S |
| G M G | R G R | S - - | - - - | | | | |
| වෙර ළ | බ ල බ | ලා S S | S S S | | | | |

ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතය - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුනිල් ආරියරත්න
පිටු අංක - 187

# මුළු ගතම වෙහෙසුණා

## C major

## තාලය : මෙම්බෙටෝ 6/8

R G R S - S R G - - - M G R S R S - -
දු ප් ප ත් වෙ ලා s s s s s s s s s s

S R G M G R - G R - - -
ම ම ක ම් ම ලේ s s s s s

R G R S S R G - - - M G R S R S - - - -
වෙ හෙ සෙ නා වා s s s s s s s s s s s s s s

| +++ (( +PP
| + නුඹ

SSS SSS | S - - +NS | R R- R - R | R - - +SR | G -G RS- | G-G RS-
ගතම වෙහෙසු | ණාss +දහ | ඩියෙන් තැවුවු | ණාss +කුස | ගින්න නිවා | ගත්ත මෙමාss

SSS SS- | S - - )) +++
යකඩ තලන් | නාss )) sss

(( ++P PD- | Ṡ - - - - - | - - N DPD | D -P - - - | - - G RSR
++වෙ හෙසී | ලාss s s s | + +දු ක්විද | ලාss s s s | ++ක මම s

G - - - - - | ++M GRS | S - - - - - ))
ලේss sss | ++ය කඩක | ලාss sss ))

| +++ (( +GM
| + පාන්

MP- PPP | P - - +PD | P-M MMM | M - - +GR | R -G GGR | R- - +GG
දරින් නැගිට | ලාss +දෙවි | යන්වැඳ පුද | ලාss +දරු | වන්මු වසිඹ | ලාss + ගිහි

RRS S-S | S - - )) +++
මැලය දල්ව | ලාss )) +++

ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතය - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුනිල් ආරියරත්න
පිටු අංක - 215

**ක්‍රියාකාරකම 15**

## සපයා ගත හැකි අවනද්ධ භාණ්ඩයක් ආශ්‍රයෙන් මාත්‍රා දෙකේ, තුනේ, හතරේ සහ මිශ්‍ර තාල හා සරල රිද්ම රටා වාදනය

**නිපුණතාවය 1.0** :- සංගීතයේ මූලිකාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.2** :- මෙතෙක් අධ්‍යයනය කළ තාල රූප ප්‍රායෝගික අභ්‍යාසයේ යෙදෙයි.

**ක්‍රියාකාරකම 1.2.1** :- මාත්‍රා දෙකේ තුනේ හතරේ සහ මිශ්‍ර තාල හා සරල රිද්ම රටා වාදනය

**කාලච්ඡේද** :- 03

**ඉගෙනුම් පල** :-

- මිශ්‍ර මත් කැටි සහිත රිද්ම රටා වාදනය කරයි.
- මිශ්‍ර මත් කැටි සහිත හින්දුස්තානි තාල පද නම් කරයි.
- මිශ්‍ර මත් කැටි සහිත දේශීය තාල පද නම් කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- ඇමුණුම 1. 2, 1. 1, ට අයත් රිද්ම රටා සහිත පත්‍රිකාව පහසුවෙන් සපයා ගත හැකි අවනද්ධ භාණ්ඩයක් හෝ භාණ්ඩ කිහිපයක්.

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

හින්දුස්තානි තාලවලත් දේශීය තාලවලත් එන මිශ්‍ර මත් කැටි අධ්‍යයනය කිරීමත් ඒ අනුව රිද්ම රටා වාදනය කිරීමත් මෙම පාඩමෙන් අපේක්ෂිත ය. විවිධ රිද්ම අනුව නිර්මාණය වූ ගීත කිහිපයක් තෝරා ගැනීමෙන් මෙම පාඩම සාර්ථක ව ඉදිරිපත් කළ හැකි වේ. මේ දක්වා අධ්‍යයනය කළ දාදරා, ලාවණී, කෙහෙර්වා, ත්‍රී තාල්, ඣප් තාල්, දීප්චන්දි තාල හා දේශීය තිත් රූප ප්‍රායෝගික ව යොදාගත යුතු යි.

**පාඩම සංවර්ධනය :-**

පියවර 01

- ඇමුණුම 1.2. 1.1, ට අයත් රිද්ම රටා ඇතුළත් පත්‍රිකාව ඉදිරිපත් කරන්න.
- ඇමුණුමෙහි සඳහන් රිද්ම රටාවලට අත්වැල ගැසීමට සිසුන් යොමු කරන්න.
- මාත්‍රා දෙක, තුන හා හතරේ රිද්ම රටා අනුව අත්තල යොදන්න.
- මිශ්‍ර මත් කැටි සහිත රිද්ම රටාවලට ද අත්තල යොදන්න.

(මිනිත්තු 10)

පියවර 02

- සපයා ගත් අවනද්ධ භාණ්ඩයෙන් සරල රිද්ම රටාවක් වයා පෙන්වන්න.
- මාත්‍රා දෙකේ රිද්ම රටාවක් වයා පෙන්වන්න.
- මාත්‍රා තුනේ රිද්ම රටාවක් වයා පෙන්වන්න.
- මාත්‍රා හතරේ රිද්ම රටාවක් වයා පෙන්වන්න.
- මිශ්‍ර මත් කැටි ඇතුළත් රිද්ම රටාවක් වයා පෙන්වන්න.
  (මාත්‍රා 2, 3 හා මාත්‍රා 3, 4 රිද්ම රටා)
- සපයා ගත් අවනද්ධ භාණ්ඩ සිසුන් අතට පත් කරන්න.
- පත්‍රිකාවේ සඳහන් රිද්ම රටා එකින් එක වැයීමට සිසුන් යොමු කරන්න.
- මාත්‍රා දෙකේ රිද්ම රටා කීපයක් වැයීමට සිසුන් යොමු කරන්න.
- මාත්‍රා තුනේ රිද්ම රටා කීපයක් වැයීමට සිසුන් යොමු කරන්න.

- මාත්‍රා හතරේ රිද්ම රටා කීපයක් වැයීමට සිසුන් යොමු කරන්න.
- මිශ්‍ර මත් කැටි ඇතුළත් රිද්ම රටා වැයීමට සිසුන් යොමු කරන්න. (මාත්‍රා 2, 3 හා මාත්‍රා 3, 4 රිද්ම රටා)
- දාදරා, ලාවණී, කෙහෙර්වා, ත්‍රී තාල්, ජප්, දීප්චන්දි තාල අභ්‍යාස කරවන්න.

(මිනිත්තු 70)

පියවර 03

- කැමති රිද්ම රටා වැයීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ගුරුවරයා අහඹු ලෙස යෝජනා කරන රිද්ම රටා කිහිපයක් වැයීමට සිසුන් යොමු කරන්න.
- ගුරුවරයා වයන රිද්ම රටාවලට අත්තල යෙදීමට සිසුන් යොමු කරන්න.
- සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා එක් කණ්ඩායමකට අත්තල යෙදීමටත්, අනෙක් කණ්ඩායමට අවනද්ධ භාණ්ඩ වැයීමටත් යොමු කරන්න.

(මිනිත්තු 35)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- මාත්‍රා 2, 3, 4 හා මිශ්‍ර මත් කැටි නිවැරදි ව වාදනය කළ සිසුන් ඇගයීමට ලක් කරන්න.

(මිනිත්තු 05)

**අතිරේක උදවු :-**

අන්තර්ජාලයේ ඇතුළත් විවිධ තාල වාද්‍ය භාණ්ඩ (පෙරදිග / අපරදිග) වාදනවලට සවන් දෙන්න.

**ඇමුණුම අංක 1.2. 1.1**

**මාත්‍රා 2 රිද්ම රටා**

(1)

| × × | × × | × × | × × |
| × × | × – | × × | × – |
| × – | × × | × – | × × |

**මාත්‍රා 3 රිද්ම රටා**

(2)

| × × × | × × × | × × × | × × × |
| × × × | × × – | × × × | × × – |
| × × × | × – – | × × × | × – – |
| × – × | × × × | × – × | × × × |
| × – × | × – × | × – × | × – × |
| × – × | × × – | × – × | × × – |
| × × – | × × × | × × – | × × × |
| × × × | × – × | × × × | × – × |

### මාත්‍රා 4 රිද්ම රටා

(3)

| | | | |
|---|---|---|---|
| × × × × | × × × × | × × × × | × × × × |
| × × × × | × × × – | × × × × | × × × – |
| × × × – | × × × – | × × × – | × × × – |
| × × × – | × × × × | × × × – | × × × × |
| × – × × | × × × – | × – × × | × × × – |
| × – × × | × × – – | × – × × | × × – – |
| × × × – | × – × – | × × × – | × – × – |
| × × × × | × – × – | × × × × | × – × – |

### මිශ්‍ර මත් කැටි ඇතුළත් රිද්ම රටා

### මාත්‍රා 2 සහ 3

(4)

| | | | |
|---|---|---|---|
| × × | × × × | × × | × × × |
| × × | × × – | × × | × × – |
| × × | × – × | × × | × – × |
| × – | × × × | × – | × × × |
| × – | × × – | × – | × × – |
| × – | × – × | × – | × – × |

### මාත්‍රා 3 හා 4 රිද්ම රටා

(5)

| | | | |
|---|---|---|---|
| × × × | × × × × | × × × | × × × × |
| × × × | × – × – | × × × | × – × – |
| × × × | × × × – | × × × | × × × – |
| × × × | × – × × | × × × | × – × × |
| × – × | × × × × | × – × | × × × × |
| × – × | × × × – | × – × | × × × – |
| × – × | × – × – | × – × | × – × – |

**ක්‍රියාකාරකම 16**

## $^{5}4$, $^{7}4$ Rhythems (බටහිර තාල)

**නිපුණතාව 1.0** :- සංගීතයේ මූලිකාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.2** :- මේ දක්වා අධ්‍යයනය කළ තාල රූප ප්‍රායෝගික අභ්‍යාසයේ යෙදෙයි.

**ක්‍රියාකාරකම 1.2.2** :- $^{5}4$, $^{7}4$ Rhythems (බටහිර තාල)

**කාලච්ඡේද** :- 01

**ඉගෙනුම් පල** :-
- මිශ්‍ර මත් කැටි සහිත බටහිර තාල පද නම් කරයි.
- මිශ්‍ර මත් කැටි සහිත බටහිර තාල පද ලියා දක්වයි.
- මිශ්‍ර මත් කැටි සහිත බටහිර තාල පද අත්තල යොදා පෙන්වයි.

**ගුණාත්මක යෙදවුම් :-**
- ඇමුණුම 1. 2, 2. 1 ට අයත් බටහිර තාල පද හා රිද්ම රටා ඇතුළත් පත්‍රිකාව.
- බටහිර තාල පද වාදන ඇතුළත් audio හෝ video තැටි .

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

බටහිර සංගීතයේ ද වෙන ම තාල වාදන කොටසක් ඇති අතර ඒවා වාදනය සඳහා වාද්‍ය භාණ්ඩ රාශියක් ඇත. එතරම් ගැඹුරට නොගොස් සරල ව බටහිර තාල වාදනය පිළිබඳව සිසුන් දැනුම්වත් කිරීම අපේක්ෂා කෙරේ. යෝජිත ගුණාත්මක යෙදවුම්වලට වඩා වෙනස් සුදුසු යැයි හැඟෙන යෙදවුම් ගුරුවරයාගේ අභිමතය පරිදි යොදා ගැනීමටත් ගුරුවරයාට නිදහස ඇත.

**පාඩම සංවර්ධනය :-**

පියවර 01
- ඇමුණුම 1.2. 2.1ට අයත් රිද්ම රටා හා බටහිර තාල පද ඇතුළත් පත්‍රිකාව සිසුන්ට ඉදිරිපත් කිරීමට සකසාගන්න.
- එහි ඇතුළත් තාල රූප පිළිබඳ ව පැහැදිලි කිරීමක් කරන්න.
- ඣප්තාලය හා රූපක තාලය ඇසුරින් තාල රූපවලට උදාහරණ දෙන්න.

(මිනිත්තු 05)

පියවර 02
- බටහිර තාල පද ප්‍රායෝගික ව යෙදෙන අයුරු ගීතයක් ඇසුරින් විමසීමට ලක් කරන්න.
- සපයා ගත් තාල වාද්‍ය භාණ්ඩ ඇසුරින් එම තාල පද වාදනයට යොමු කරන්න.
- මාත්‍රා 2, 3 හා මාත්‍රා 3, 4 වශයෙන් යෙදෙන ගීතයක් තෝරාගෙන එම රිද්ම රටා වාදනයට යොමු කරන්න.

(මිනිත්තු 20)

පියවර 03
- ඒකල ව හා සාමූහික ව සරල තාල රූප වාදනය කිරීමට සිසුන් යොමු කරවන්න.
- ගුරුවරයා විසින් යෝජිත තාල රූප වාදනය සඳහා සිසුන් යොමු කරවන්න.
- 1, 2, 3 ආදි වශයෙන් උච්චාරණය කිරීමට සලස්වා එම තාල රූපවලට අදාළ රිද්ම රටා වාදනයට යොමු කරවන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**
- මිශ්‍ර මත් කැටි නිවැරදි ව වාදනය කළ සිසුන් ඇගයීමට ලක් කරන්න.

(මිනිත්තු 05)

**අතිරේක උදවු :-** අන්තර්ජාලයේ බටහිර තාල පද පිළිබඳ නිරීක්ෂණය කරන්න.

**ක්‍රියාකාරකම 17**

## නූර්ති ගීත ගායනය/වාදනය කරයි

**නිපුණතාව 6.0** : රංග සම්ප්‍රදායයන් හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 6.1** : නූර්ති ගී ගායනයේ කුසලතා ලබයි.

**ක්‍රියාකාරකම 2.1.1** : නූර්ති ගීතයක් ගායනය.

**කාලච්ඡේද** : 01

**ඉගෙනුම් පල** :
- නූර්ති ගීතය අයත් නාට්‍ය නම් කරයි.
- නූර්ති ගීතවල තනු ආකර්ෂණීය බව පිළිගනියි.
- නූර්ති ගීතයක් ගායනය/වාදනය කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ඇමුණුම අංක 1 :- දැක්කොත් පද්මාවතී... ගීතය ලියූ දෘශ්‍යාධාරය
  ඇමුණුම අංක 2 :- ලියමු මේ සිංහල.. ගීතය ලියූ දෘශ්‍යාධාරය
- සර්පිනාව, තබ්ලාව
- 2007 ගුරුමාර්ගෝපදේශ 11 වන ශ්‍රේණිය පිටු අංක 99.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- නූර්ති ගීතයක් ගායනය/වාදනය කිරීමට පුහුණුවක් ලබා දීම මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ. ඇමුණුමේ දක්වා ඇති ගීත අතරින් එක් ගීතයක් මේ සඳහා තෝරාගත හැකිය.
- එම ගීතය ශ්‍රවණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- එම ගීතයේ තනුව පිළිබඳ ව සිසුන් හා සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10)

පියවර 02

- තෝරාගත් ගීතය ඇතුළත් දෘශ්‍යාධාරය පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- සර්පිනාව වයමින් තෝරා ගත් ගීතය ගායනය කර පෙන්වන්න.
- නාදමාලාව තහවුරු වන පරිදි ගීතය කොටසින් කොටස ගායනය කරමින් පුහුණු කරවන්න.

(මිනිත්තු 15)

පියවර 03

කණ්ඩායම් වශයෙන් ගායනය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
(මිනිත්තු 10)

**ඇගයීම් සහ තක්සේරුකරණය සඳහා උපදෙස්:-**

- නූර්ති ගීතය නිවැරදි ශ්‍රැතියට හා ලයට අනුගත ව නිවැරදි නාද මාලාවට ගැයූ සිසු/සිසුවියන් තෝරා අගයන්න.

(මිනිත්තු 05)

පැවරුම

නූර්ති ගීත ඇතුළත් පොත් පිංචක් සකස් කිරීමට උපදෙස් දෙන්න.

ඇමුණුම් 01 :- **පද්මාවතී නූර්තිය - නීතිඥ චාර්ල්ස් ඩයස්**

දැක්කොත් පද්මාවතී ආලේ නොකරා බැරී
ලාලාටේ චන්ද්‍රයා සේ පෙනේ
ලාලාටේ චන්ද්‍රයා සේ පෙනේ
දැක්කොත් පද්මාවතී ආලේ නොකරා බැරී

මේඝා සේ කේසාවේ ඇගේ ග්‍රීවේ සක් සේ වේ
අහො ඇගේ ග්‍රීවේ සක් සේ වේ
ළමැද හංසයින් සේ පෙනේ
ආලේ නොකරා බැරී

මුක්තා සෙ දන්තා වේ ඇගේ වර්ණ ස්වර්ණාවේ
අහො ඇගේ වර්ණ ස්වර්ණාවේ
ළමැද හංසයින් සේ පෙනේ
ආලේ නොකරා බැරී

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| x | | | | 0 | | | | x | | | | 0 | | | |
| | | ස | ස | – | රිම | –ප | ධ | ප | – | – | – | – | මධ | ධ | ධප |
| | | ආ | ලේ | s | නොක | sරා | බැ | රී | s | s | s | s | දැක් | කොත් | පත් |
| ම | –ධ | පධ | මප | ගම | ගරි | සරි | ස– | – | රිම | –ප | ධ | ප | – | – | පප |
| මා | sව | තී | ss | ss | ss | ආs | ලේ | s | නොක | රා | බැ | රී | s | s | ල |
| ධස් | ස් | –ස් | ස් | නි | ධප | –ධ | නි | ප | – | – | පප | ධස් | ස් | –ස් | රි̇ |
| ලාs | වේ | sචන් | ද | යා | ss | sසේ | පෙ | නේ | s | s | ලා | ලා | වේ | චන් | ද |
| නි | ධප | –ධ | නි | ප | – | ධප | ම | – | මධ | ධ | ධප | ම | –ධ | පධ | මප |
| යා | ss | sසේ | පෙ | නේ | s | ss | s | s | දැක් | කොත් | පත් | මා | sව | තීs | ss |
| ගම | ගරි | සරි | ස | – | රිම | –ප | ධ | ප | – | – | – | – | ග | –ප | ධ |
| ss | ss | ආs | ලේ | s | නොක | sරා | බැ | රී | s | s | s | s | මේ | sස | සෙ |
| ස් | රි̇ | ස් | – | – | නි | –ධ | ප | පනි | ධනි | ප | ග | – | ග | –ප | ධ |
| කේ | සා | වේ | s | s | ඇගේ | sශ්‍රී | ව | සක් | සේs | වේ | s | s | මේ | sසා | සෙ |
| ස් | රි̇ | ස් | – | – | නි | –ධ | ප | පනි | ධනි | ප | ම | පධ | ධ | –ධ | ප |
| කේ | සා | වේ | s | s | ඇගේ | sශ්‍රී | ව | සක් | සේs | වේ | අහො | ඇs | ගේ | sශ්‍රී | ව |
| පනි | ධනි | ප | ම | පධ | ධ | –ධ | ප | පනි | ධනි | ප | ම | – | මධ | ධ | –ධ |
| සක් | සේs | වේ | අහො | ඇ | ගේ | sශ්‍රී | ව | සක් | සේs | වේ | s | s | ළමැ | දහ | ංස |
| ධ | ධ | ප | –ධ | මප | ධනි | ධ | ප | ගම | ගරි | සරි | ස | – | රිම | –ප | –ධ |
| යි | න් | සේ | sපෙ | නේs | ss | s | s | ss | ss | ආ | ලේ | s | නොක | sරා | sබැ |
| ප | – | – | – | – | | | | | | | | | | | |
| රී | s | s | s | s | | | | | | | | | | | |

මුක්තා සෙ දන්තා වේ යන පදයද මේසා සෙ කේසාවේ යන ප්‍රස්තාරය මෙන් ගැයේ

ඇමුණුම් 02:- **දේවානම් පියතිස්ස නූර්තිය**

## ලියමු මේ සිංහල භාෂාවෙන්

ලියමු මේ සිංහල භාෂාවෙන් අටුවා - ඒ
බුදුන්ගෙ ධර්මෙ තෝරා දී
බුද්ධ ධර්මේහී ගුඪාර්ථ ඇත්තේ මැයි - ඊට
දක්වමූ පොත් පත් සදා දීපේ

සද්ධර්මේ තෝරා දී මෙ දීපේ ලංකා
බුද්ධාගමේ හී තබාලා
ලෝකෙට දම් කෙතක් කරමු ස්වාමිනේ
තැන්පත් කරමු දූන් සිත්සේ අටුවා - ඒ
බුදුන්ගෙ ධර්මෙ තෝරා දී

| x | | 0 | | x | | 0 | |
|---|---|---|---|---|---|---|---|
| පස්ස් | –ස්රි් | ස්–නි | ධධප | මප– | නිධ– | ප–– | මපප |
| ලියමු | sමේs | සිංs | හලs | භාss | ෂාss | වෙන්s | අටුs |
| ගු–ම | –ප– | ගු–රි | ස–රි | නි–ස | ගු–රි | ස–– | පම– |
| වාss | ඒsබු | දූන්ගෙ | ධර්මෙ | තෝss | රාss | දීss | බුද්ධ |
| පස්ස් | –ස්රි් | නි–– | ධ–ප | ම–ප | නි–ධ | ප–– | මප– |
| ධර්මේ | sහිs | ගුss | ඪාර්ථ | ඇත්s | තේss | මැයිs | ඊsට |
| ගු–ගු | –මප | ගු–රි | ස–රි | නි–ස | ගු–රි | ස–– | ––– |
| දක්ව | sමූs | පොත්ප | ත්සs | දාss | දීss | පේss | sss |
| ++ගු | රි–ම | ගු–රි | –ස– | ++රි | ම–ම | පධ– | පධනිධ |
| ++සද් | ධර්මෙ | තෝsරා | sදීs | ++මෙ | දීsපෙ | ලංs | කාss |
| ++ප | මනිප | ගු–රි | ස–රි | නි–– | ස–– | ––– | ––– |
| ++බුද් | ධාsග | මේss | හීsත | බාss | ලාsss | sss | sss |
| ++ප | –ස්ස් | ස්–රි් | ස්රි්ගු් | ++රි් | ස්–රි් | නි–නි | ස්–– |
| ++ලෝ | sකෙට | දම්කෙ | තක්s | ++ක | රsමු | ස්වාමි | නේss |
| පස්ස් | –ස්රි් | නි–– | ධ–ප | ම–ප | නි–ධ | ප–– | මප– |
| තැන්ප | ත්කs | රsමූ | sදූන් | සිss | ත්ss | සේss | අටුs |
| ගු–ම | –ප– | ගු–රි | ස–රි | නිස– | ගු–රි | ස–– | ––– |
| වාss | ඒsබු | දූන්ගෙ | ධර්මෙ | තෝss | රාss | දීss | sss |

ක්‍රියාකාරකම 18

## භූපාලි රාගයේ ස්වර අභ්‍යාස

**නිපුණතාව 1.0** :- සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** :- ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම 1.1.1** :- භූපාලි රාගයේ ස්වර අභ්‍යාස

**කාලච්ඡේද** :- 01

**ඉගෙනුම් ඵල** :-

- භූපාලි රාගයට අයත් ස්වර නම් කරයි.
- ස්වර 05ක් යෙදුණ ද භූපාලි මිහිරි රාගයක් බවට පිළිගනියි.
- ස්වර සංගති හඳුනා ගනිමින් භූපාලි රාගයේ ස්වර අභ්‍යාස නිවැරදි ව ගායනය/වාදනය කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- සර්පිනාවක්, වාදනය කරන සිසුන්ගේ වාද්‍ය භාණ්ඩ, ගීත ඇතුළත් සංයුක්ත තැටි වාදන යන්ත්‍රයක්.

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

භූපාලි රාගය ඖඩව රාගයක් වන බැවින් ශුද්ධ ස්වර අෂ්ටකයෙන් මධ්‍යමය හා නිෂාදය ඉවත් කළ විට ගන්ධාරය හා පංචමයත්, ධෛවතය හා තාර ෂඩ්ජයත් අතර ඇති වන පරතරය අවබෝධ වන පරිද්දෙන් ප්‍රායෝගිකත්වයට ප්‍රමුඛත්වය දෙමින් මෙම රාගය අවබෝධ කරගත යුතු ය.

මෙම රාගය ගොඩනැගී ඇති ආකාරය පිළිබඳ ව ස්වර සංගති (රාග අංග) මඟින් පහදමින් සංගති ප්‍රමුඛ ව ගොඩ නැගුණ අභ්‍යාස නිවැරදි ව ගායනය/වාදනය කළ හැකි වන තෙක් පුහුණු කරවිය යුතු වෙයි. පළමු ව රාගයේ ආරෝහණ අවරෝහණ හොඳින් පුහුණු කරවන්න. එයින් අභ්‍යාසයක් සේ සලකා අවම අභ්‍යාස 02ක් වත් පුහුණු කරවිය යුතු ම ය. ඇමුණුම 01හි අභ්‍යාස හෝ ඒ ඇසුරින් ගොඩ නැගූ අභ්‍යාස භාවිත කරන්න.

**පාඩම සංවර්ධනය :-**

පියවර 01

- මන්නාරම් පිටි වැල්ලේ, මධුර යාමේ, මෙලොව තිබෙන, සටනෙකී ජීවිතේ දැන්, වැනි සරල ගීතයක් ශ්‍රවණයට සලස්වන්න.
- එම ගීත නිර්මාණයේ දී ''සරිගපධස්'' යන ස්වර පමණක් භාවිත වී ඇති ආකාරය දක්වමින් පාඩමට පිවිසෙන්න.

(මිනිත්තු 05)

පියවර 02

- ස්වර අභ්‍යාස සහිත දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න.
- අනුකරණාත්මක ව ගායනයට/වාදනයට හුරු කරවන්න.
- වර්ජ ස්වර අතර ඇති පරතරය හොඳින් අවබෝධ කරමින් පුහුණු කරවන්න.
- අභ්‍යාසයේ ඇතුළත් රාග අංග (ස්වර සංගති) අවධාරණය කොට පෙන්වන්න.

(මිනිත්තු 20)

පියවර 03

- තනි තනි ව ගෙන අගයමින් සදොස් තැන් නිදොස් කරන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- ස්වර ස්ථානයන්හි නිවැරදි බව හා රාගයේ ස්වර සංගති පිළිබඳ ව අවබෝධය මැනෙන පරිදි ඇගයීම සිදු කරන්න.

(මිනිත්තු 05)

**අතිරේක උදවු :-**

- අන්තර්ජාලයෙන් භූපාලි රාගයට අදාළ ගායන/වාදන පරිශීලනයට යොමු කරන්න.
- වෙනත් අභ්‍යාස සපයා පුහුණුවීමට පොලඹවන්න.

**ඇමුණුම 01 :-**

**අභ්‍යාස - රාගය භූපාලි**

(1) රාගයේ ආරෝහණ හා අවරෝහණයඃ- ස රි ග ප ධ ස̇ - ස̇ ධ ප ග රි ස

(2) සරිගරි

ස රි ග ප ග රි　　ස ධ̣ රි ස

ස රි ග ප ධ ප ග රි

ස රි ග ප ධ ස̇ ධ ප ග රි

ස රි ග ප ධ ස̇ රි̇ ස̇ ධ ප ග රි

ස රි ග ප ධ ස̇ රි̇ ග̇ රි̇ ස̇ ධ ප ග රි

(3) ස රි ග රි ස

ස රි ග ප ග රි ස

ස රි ග ප ධ ප ග රි ස

ස රි ග ප ධ ස ධ ප ග රි ස

ස රි ග ප ධ ස̇ රි̇ ස̇ ධ ප ග රි ස

ස රි ග ප ධ ස̇ රි̇ ග̇ රි̇ ස̇ ප ග රි ස

ස රි ග ප ධ ස̇ රි̇ ග̇ ප̇ රි̇ ස̇ ධ ප ග රි ස

(4) ස රි ග ග රි ස

ස රි ග ප ප ග ග රි ස

ස රි ග ප ධ ධ ප ප ග ග රි ස

ස රි ග ප ධ ධ ස̇ ස̇ ධ ධ ප ප ග ග රි ස

**ක්‍රියාකාරකම 19**

## භූපාලි රාගයේ සර්ගම්

**නිපුණතාව 1.0** :- සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** :- ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම 1.1.1** :- භූපාලි රාගයේ සර්ගම්

**කාලච්ඡේද** :- 01

**ඉගෙනුම් ඵල** :-

- සර්ගම් ගීත ස්වර පමණක් ඇතුළත් ගීත බව ප්‍රකාශ කරයි.
- සර්ගම් ගීතය නිවැරදි ව ගායනය/වාදනය කරයි.
- සර්ගම් ගීතය පුහුණු වීමෙන් රාගය අධ්‍යයනය කිරීමට පහසු බව දන ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- සර්පිනාවක්, වාදනය කරන සිසුන්ගේ වාද්‍ය භාණ්ඩ, සර්ගම් ගීතය ලියූ දෘශ්‍යාධාරයක්

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

භූපාලි රාගයට අයත් ස්වර සංගති ද හඳුන්වා දෙමින් සර්ගම් ගීතය ඉගැන්විය යුතු ය. මෙය රාග අධ්‍යයන ඉතා පහසු කරවන ගායන ශෛලියකි. සර්ගම් යන අදහස සිසුන් තුළ තහවුරු වන සේ ඉගැන්වීම් කටයුතු සිදු කිරීම අවශ්‍යය.

මෙහි දී ද මධ්‍යමය හා නිෂාදය වර්ජ්‍ය වීමෙන් ඇතිවන පරතරය නිවැරදි ව (ධ සිට සं) ගායනය කිරීමට හුරු කරවන්න.

**පාඩම සංවර්ධනය :-**

පියවර 01

- ස්වර අභ්‍යාස පාඩමේ පුහුණුව පිරික්සමින් පාඩමට පිවිසෙන්න.
- සර්ගම් පුහුණු වීමෙන් රාග අංග අධ්‍යයනය කරමින් රාග ගායනය/වාදනය දියුණු කර ගත යුතු අයුරු පහදමින් සර්ගම් පුහුණුවේ වැදගත්කම සාකච්ඡා කරන්න. භූපාලි සර්ගමයේ විශේෂත්වය පැහැදිලි කරන්න. (මිනිත්තු 05)

පියවර 02

- සර්ගම් ගීතයේ පාදයෙන් පාදය, කොටසින් කොටස ගායනය හුරු කරවන්න.
- අනුකරණාත්මක ක්‍රමවේදය ඇසුරින් ගායනය/වාදනය අනුව හුරු කරවන්න. (මිනිත්තු 20)

පියවර 03

- තනි තනි ව ගැයීමට සලස්වා සදොස් තැන් නිදොස් කරන්න.
- සිසු කුසලතා අගයමින් දිරි ගන්වන්න.
- සර්ගම් ගීතය සටහන් පොතේ ලියා ගැනීමට සලස්වන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- නිවැරදි ගායනය හා රාග අංග පිළිබඳ දැනුම පිරික්සමින් අගයන්න.

(මිනිත්තු 05)

**අතිරේක උදවු :-**

අන්තර්ජාලය මඟින් ශාස්ත්‍රීය ගායන/වාදන පරිශීලනයට සිසුන් පොලඹවන්න.

**ඇමුණුම 01**

රාගය - භූපාලි - සර්ගම් ගීතය

තාලය - ත්‍රිතාල් (මධ්‍ය ලය)

ස්ථායි

| 0 | | | | 3 | | | | × | | | | 2 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස̇ | ස̇ | ධ | ප | ග | රි | ස | රි | ග | - | ප | ග | ධ | ප | ග | - |
| ග | ප | ධ | ස̇ | රි̇ | ස̇ | ධ | ප | ස̇ | ප | ධ | ප | ග | රි | ස | |

අන්තරා

| 0 | | | | 3 | | | | × | | | | 2 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ග | ග | ප | ධ | ප | ස̇ | - | ස̇ | ධ | ධ | ස̇ | රි̇ | ග̇ | රි̇ | ස̇ | ධ |
| ග | ග | රි̇ | ස̇ | රි̇ | රි̇ | ස̇ | ධ | ස̇ | ස̇ | ධ | ප | ග | රි | ස | - |

**ක්‍රියාකාරකම 20**

## භූපාලි රාගයේ මධ්‍යලය ගීතය

**නිපුණතාව 1.0** :- සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** :- ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම 1.1.1** :- භූපාලි රාගයේ මධ්‍ය ලය ගීතය

**කාලච්ඡේද** :- 02

**ඉගෙනුම් පල** :-

- භූපාලි රාගය ස්වර 05කින් යුත් රාගයක් බව හඳුනා ගනියි.
- රසවත් බවින් අනූන රාගයක් බව පුහුණුවීම් මඟින් හඳුනා ගනියි.
- මධ්‍ය ලය ගීතය නිවැරදි ව ගායනය, වාදනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :-

- සර්පිනාවක්, ගීතය ලියූ දෘශ්‍යාධාරයක්, වාද්‍ය භාණ්ඩ, තබ්ලාවක්

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස්** :-

ඛ්‍යාල් ගායන ශෛලිය පිළිබඳ ව අවබෝධයක් ලැබෙන සේ ඉගැන්වීම සංවිධානය කරගත යුතු ය. මෙයින් අදහස් වනුයේ ඛ්‍යාල් පිළිබඳ ව වූ ලිඛිත විස්තර නොව, ඛ්‍යාල් ගීත ගායනය/වාදනය කිරීමේ පිළිවෙල පිළිබඳ සිසුනට අවබෝධ කරවීම ය.

ඛ්‍යාල් ගීතය උගන්වන අතරතුර එම ගීතයේ ඇතුළත් රාග අංග පිළිබඳ ව සිසු අවධානයට යොමු කරන්න. වාදනය ප්‍රධාන විෂය කරගත් සිසුන්ගේ වාද්‍ය භාණ්ඩ මෙහි දී වාදනය සඳහා යොදාගන්න.

**පාඩම සංවර්ධනය** :-

පියවර 01

- බිලාවල් හා භූපාලි යන රාගයනට අයත් ස්වර ඛණ්ඩ 2ක් 'අ' කාරයෙන් ගයා රාග හඳුනා ගැනීමට අවස්ථාව සලසන්න.
- මෙම කාර්යය නිවැරදි ව සිදු කිරීම රාග අධ්‍යයනයේ ඇති එක් ප්‍රධාන කාර්යයක් බව අවබෝධ කරවමින් පාඩමට පිවිසෙන්න.

(මිනිත්තු 10)

පියවර 02

- ගයන ඛ්‍යාල් ගීතයේ ගීත ස්වර ප්‍රස්තාරය ප්‍රදර්ශනය කරන්න..
- පළමු ව ගී පද ගායනය හුරු කරවන්න.
- දෙවනු ව ස්වර ප්‍රස්තාරය ද ගායනයට හුරු කරවන්න.

(මිනිත්තු 40)

පියවර 03

- තනි තනි ව ගායනය කරවා සදොස් තැන් නිදොස් කරන්න.
- සිසු කුසලතා අගයමින් අභිප්‍රේරණය කරන්න.

(මිනිත්තු 20)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :-

- ඒකල ව හෝ කණ්ඩායම් වශයෙන් හෝ ගායනයට සලසා සදොස් තැන් නිදොස් කරන්න.

(මිනිත්තු 10)

**අතිරේක උදවු :-**

භූපාලි රාගය ආශ්‍රිත සරල ගී ගායනයට / වාදනයට යොමු කරන්න..

**ඇමුණුම 01**

පසුගිය 8 පොතේ පිට 40 - 41

රාගය - භූපාලි - තාලය ත්‍රිතාල් (මධ්‍ය ලය)

ස්ථායි

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 0 | | | | 3 | | | | × | | | | 2 | | | |
| ස | | | | | | | | ග | | | | | | | |
| ස̇ | ස̇ | ධ | ප | ග | රි | ස | රි | ධ̣ | ධ̣ | ස | රි | ග | රි | ග | - |
| න | ම | න | ක | ර | ච | තු | ර | ශි | රි | ගු | රු | ච | ර | ණා | S |
| ග | ග | ප | ධ | ස̇ | ධ | ස̇ | ස̇ | ස̇ | ප | ධ | ප | ග | රි | ස | - |
| ත | න | ම | න | නි | ර | ම | ල | ක | ර | හ | ව | ත | ර | ණා | S |

අන්තරා

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 0 | | | | 3 | | | | × | | | | 2 | | | |
| ප | | ප | | | | ධ | | | | | ධ | | | | |
| ග | ග | ග | ග | ප | - | ස̇ | ධ | ස̇ | ස̇ | ස̇ | ස̇ | ස̇ | රි̇ | ස̇ | ස̇ |
| ජෝ | ඉ | ණෙ | ඉ | ධ්‍ය | S | ව | ත | ශූ | හ | ඵ | ල | පා | S | ව | ත |
| | | | | | | ස | | ධ | | | | | | | |
| ස̇ | ස̇ | ග̇ | රි̇ | ස̇ | ස̇ | ප | ධ | ස̇ | ස̇ | ධ | ප | ග | රි | ස | - |
| ප | න | ම | ච | ර | න | දු | බ | ස | බ | නී | S | ස්ත | ර | ණා | S |

පහත දැක්වෙන ගීත ද මෙම පාඩම සඳහා යොදා ගත හැකි ය.

- බැබළේ පුරහඳ පෝ දිනේ
- ජබසේ තුමසන ලාග ලී
- ඉතොනොජො බන පර
- ජෞන්තොරි චරන කමළ පරිවාරි

**ක්‍රියාකාරකම 21**

## භූපාලි රාගයට අයත් රාගාංග ඇතුළත් කෙටි ස්වර ඛණ්ඩ ගායනය

**නිපුණතාව 1.0** :- සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** :- ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම 1.1.1** :- භූපාලි රාගයට අයත් රාගාංග අයත් කෙටි ස්වර ඛණ්ඩ ගායනය

**කාලච්ඡේද** :- 01

**ඉගෙනුම් පල** :-

- රාගයක් යනු ස්වර සංගති කිහිපයක එකතුවක් බව අවබෝධ කර ගනියි.
- රාගාංග ශ්‍රවණය වීමෙන් රාග හඳුනා ගැනීමේ හැකියාව ලබයි.
- කෙටි ස්වර ඛණ්ඩ ගායනය/වාදනය කරයි.
- රාග අධ්‍යයනයේ ප්‍රධාන කාර්යය සංගති අවබෝධ කර ගැනීම බව අවබෝධ කොටගෙන පවසයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- සර්පිනාව, රාගාංග ලියූ දෘශ්‍යාධාරයක්

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

රාගයක් අධ්‍යයනය කිරීම යනු ඊට අදාළ සියලු ස්වර සංගති අවබෝධ කොට ගෙන ගායනය/වාදනය කිරීම ය. රාග ආලාප, ඛ්‍යාල් ගායනය තානාලංකාර වැනි සියලු දේ සිදු වනුයේ සංගති ඇසුරෙනි. එහෙයින් මෙම පාඩම පිළිබඳ ව ඔබගේ දැඩි අවධානය යොමු කරමින් ඉගැන්වීමේ කටයුතු සිදු කිරීම වඩාත් ප්‍රතිඵලදායක ය.

සිසුන් ගායනය/වාදනය කරනවාත් සමඟ ම ඔබ එම ස්වර ඛණ්ඩ අකාරයෙන් ගැයීමේ දී එහි ස්වර හඳුනා ගැනීමේ හැකියාව ද වර්ධනය කළ යුතු ය. ඇමුණුම 01 ඇසුරින් දෘශ්‍යාධාරය ගොඩ නගා ගන්න.

**පාඩම සංවර්ධනය :-**

පියවර 01

- භූපාලි රාගයේ සර්ගම් ගීතයක හා ඛ්‍යාල් ගීතයක ස්වර ප්‍රස්තාරය ප්‍රදර්ශනය කොට එහි ඇති රාග අංග පිළිබඳ කෙටි සාකච්ඡාවක් කරන්න.
- රාගයක ස්වර සංගති හඳුනා ගැනීමෙන් ඇති ප්‍රයෝජනය පිළිබඳ ව පහදමින් පාඩමට පිවිසෙන්න.

(මිනිත්තු 05)

පියවර 02

- රාගාංග ලියූ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න.
- එහි සඳහන් ස්වර ඛණ්ඩ සුදුසු ශිල්ප ක්‍රමයකට නැවත නැවත පුහුණු කරවන්න..

(මිනිත්තු 15)

පියවර 03

- ස්වර ඛණ්ඩ කිහිපයක් අකාරයෙන් ගයා ස්වර හඳුනා ගැනීමට සලස්වන්න.
- ස්වර ඛණ්ඩ කිසියම් රිද්මයකට යොදා ගනිමින් ගායනය පුහුණු කරවන්න.

- සටහන් පොතේ සටහන් කරගැනීමට සලස්වන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- ඒකල ව හෝ කණ්ඩායම් වශයෙන් හෝ ගායනයට සලසා අගය කරන්න.

(මිනිත්තු 10)

**අතිරේක උදවු :-**

රාගාංග ඇතුළත් ස්වර ඛණ්ඩ භාවිත කරමින් සුදුසු තාලයකට ස්වර පේළි දෙකක් හෝ හතරක් නිර්මාණය කිරීමට සිසුන් පොලඹවන්න.

ඇමුණුම 01

(1) සධ̣, සරිග

(2) සරි ගප ග, ධපග

(3) ග ප, ධ, ස̇

(4) ග රි, සරිස, ධ̣ රි ස

(5) ධ̣, සරිග, රිග, පරිස

(6) ග ප, ධ රි̇ ස̇

(7) ස̇ - ධප ග ප ධ ස̇

(8) ගප ධස̇, රි̇ ග̇ රි̇ ස̇, ධ ප ග

(9) ගරි, සධ̣, සරිග

(10) ගග, පධස̇

**ක්‍රියාකාරකම 22**

## භූපාලි රාගයට අයත් ලක්ෂණ ගී ගායනය කරමින් රාග ලක්ෂණ විමසීම

**නිපුණතාව 1.0** :- සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** :- ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම 1.1.1** :- භූපාලි රාගයට අයත් ලක්ෂණ ගී ගායනය කරමින් රාග ලක්ෂණ විමසීම

**කාලච්ඡේද** :- 02

**ඉගෙනුම් පල** :-

- ලක්ෂණ ගී පිළිබඳ ව දැන ගනියි.
- ලක්ෂණ ගීත ගායනය කරයි.
- රාග විස්තර ඉගෙන ගත හැකි සරල හා වින්දනාත්මක මාර්ගය ලක්ෂණ ගී බව අවබෝධ කොට ගෙන පවසයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- සර්පිනාවක්, ලක්ෂණ ගී ලියූ දෘශ්‍යාධාරයක්

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

ලක්ෂණ ගීත යනු කුමක් ද යන්න පළමු වාරය තුළ දී අධ්‍යයනය කොට ඇත. ලක්ෂණ ගීතයක් ඇසුරින් රාග ලක්ෂණ ඉගෙන ගැනීමට සිසුන් පෙලඹවීම අපේක්ෂිත ය.

ගීතය ගායනයට පුහුණු වන අතරතුර රාග ලක්ෂණ මතු කරමින් සාකච්ඡා කළ යුතු ය. එමෙන් ම එහි නාද මාලාවේ ඇතුළත් ස්වර සංගති පිළිබඳ ව ද සිසු අවධානය යොමු කරන්න.

**පාඩම සංවර්ධනය :-**

පියවර 01

- භූපාලි රාගයේ යෙදෙන ස්වර විමසන්න. නොයෙදෙන ස්වර විමසන්න. ස්වර සංඛ්‍යාව විමසන්න. ආරෝහණය සහ අවරෝහණය ගොඩ නැඟෙන අයුරු විමසන්න. ප්‍රශ්නෝත්තර ක්‍රමය භාවිත කරමින් ලක්‍ෂණ ගීතයක වටිනාකම සාකච්ඡා කර පාඩමට පිවිසෙන්න.

(මිනිත්තු 10)

පියවර 02

- දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කොට ලක්ෂණ ගීතය ගායනයට/වාදනයට හුරු කරවන්න.
- ගයන/වයන අතර රාගයේ ලක්ෂණ හා රාග අංග ප්‍රායෝගික ව මතු කර දක්වන්න.

(මිනිත්තු 40)

පියවර 03

- කණ්ඩායම් ලෙස ගායනය/වාදනය කරවා සදොස් තැන් නිදොස් කරන්න.
- වාචික ප්‍රශ්න මඟින් රාග විස්තර පිළිබඳ ව මතකය පිරික්සන්න.

(මිනිත්තු 20)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- ඒකල ව ගායනයට සලසා අගය කරන්න.

(මිනිත්තු 10)

**අතිරේක උදවු :-**

ගීතයේ ඇතුළත් රාග ලක්ෂණ වෙන් කරමින් සටහනක් ගොඩ නංවන්න.

ඇමුණුම 01

**පසුගිය 11 පොතේ 22 පිටුවේ භූපාලි රාගයේ ලක්ෂණ ගීතය ද යොදා ගත හැකි ය.**

**රාගය - භූපාලි.** **ලක්ෂණ ගීත ත්‍රිතාල් (මධ්‍ය ලය)**

ස්ථායි

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 0 | | | | 3 | | | | × | | | | 2 | | | |
| සං | - | ධ | ප | ග | රි | ස | රි | ස | ධ. | ස | රි | ග | රි | ග | - |
| දේ | s | සෙ | ත | රා | s | ගි | නි | යේ | s | භූ | s | පා | s | ලී | s |
| ග | ග | ග | රි | ග | ප | ධ | සං | ධ | ප | ග | රි | ග | රි | ස | - |
| ක | ල | ණ | මේ | s | ල | ග | ත | ර | ස | බ | ර | ක | රු | ණා | s |

අන්තරා

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 0 | | | | 3 | | | | × | | | | 2 | | | |
| ග | ප | ධ | ප | සං | - | සං | - | සං | රිං | ගං | රිං | සං | රිං | සං | ධ |
| ගා | s | ස්ව | ර | වා | s | දී | s | ධා | s | ස | ං | වා | s | දී | s |
| ගං | රිං | සං | රිං | සං | ධ | රිං | සං | ධ | ප | ග | රි | ග | රි | ස | - |
| ම | නි | නො | මැ | ති | ව | නි | ස | පෙ | ර | ය | ම | ගැ | යෙ | නා | s |

භාවික ගීත - වින්සන්ට් සෝමපාල - පිටු අංක 6

ක්‍රියාකාරකම 23

# සර්පිනාවේ ව්‍යුහය විවිධත්වය හා එහි යාන්ත්‍රණය

**නිපුණතාව 2.0** : වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි.

**නිපුණතා මට්ටම 2.1** : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**ක්‍රියාකාරකම 2.1.1** : සර්පිනාවේ ව්‍යුහය

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :

- සර්පිනාවේ ස්වරූපය පැහැදිලි කරයි.
- සර්පිනාවේ විවිධතාවන් පිළිබඳ අවබෝධයක් ලබයි.
- සර්පිනාවේ භාවිත ශිල්ප ක්‍රම පිළිබඳ ව සොයා බලයි.

**ගුණාත්මක යෙදවුම්**:

- ඇමුණුම් අංක 1 ඇතුළත් කියවීම් පත්‍රිකාව.
- ඇමුණුම් අංක 2 ඇතුළත් කාර්ය පත්‍රිකාව.
- භාවිතයෙන් ඉවත් කරන ලද සර්පිනාවක කොටස් කිහිපයක්, (සොයා ගත හැකි නම් පමණක්)
- සර්පිනාවක් වාදනයක් ඇතුළත් ශ්‍රව්‍ය/දෘශ්‍යාධාරයක්
- CD තැටි හෝ DVD තැටි යන්ත්‍රයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

- සර්පිනා වාද්‍ය භාණ්ඩය සංගීත ලෝකයේ සියලු ම භාණ්ඩ අතරින් ප්‍රමුඛස්ථානයක් ගන්නා වාද්‍ය භාණ්ඩයකි. සෑම සංගීතඥයෙකු ම තම පරිශීලනය සඳහා සර්පිනාවක් භාවිත කිරීම සුලබ ලක්ෂණයකි. ලංකාවේ පැරණි ග්‍රැමෆෝන් ගීත සඳහා සර්පිනාව බහුල ව යොදා ගෙන ඇත. පැරණි නූර්ති, නාඩගම්, ටීටර්, බජව් සඳහා වාදනය කළ එක ම සංගීත භාණ්ඩය ලෙස ද, සර්පිනාව හැඳින්වීම නිවැරදි ය. සර්පිනා වාදනය කළ පැරණි ග්‍රැමෆෝන් ගීතයක කොටසක් සිසුන්ට ශ්‍රවණයට සැලසීමෙන් මෙය ඔවුන්ට අවබෝධ කර ගැනීමට ඉඩ ප්‍රස්තාව ලබා දෙන්න.

  සර්පිනාව අපරදිග සිට පෙරදිගට සංක්‍රමණය වූ සංගීත භාණ්ඩයකි. සංගීතය උගන්නා සිසුන් සඳහා සර්පිනාව ඉතා උචිත ස්වර පුවරු භාණ්ඩයක් බව සිසුන්ට පහදා දෙන්න. ස්වර පුවරු භාණ්ඩ වාදනය සඳහා මූලික අඩිතාලම ලබා ගත හැකි ඉතා වැදගත් භාණ්ඩයක් ලෙස සිසුන් දැනුම්වත් කරන්න. එපමණක් නොව සර්පිනාවක් පරිහරණය කිරීමේ නිවැරදි ක්‍රම ශිල්ප පිළිබඳ ව ද සිසුන් දැනුම්වත් කිරීම සඳහා මෙම පාඩම උපයෝගී කර ගන්න. ඒ අතරින් සර්පිනාව පරිහරණය කිරීමට පෙර එය කළ යුතු ආකාරය, පරිහරණය අවසානයේ නැවත එය යථා තත්ත්වයට පත් කිරීම පිළිබඳ අදාළ ඇමුණුම් භාවිත කරමින් පාඩම සංවර්ධනය කර ගන්න.

පියවර 01

- සර්පිනාවෙන් ඔබට පහසුවෙන් වාදනය කළ හැකි ගීතයක් (සරල ගීයක් හෝ චිත්‍රපට ගීයක් හෝ, රාගයක් හෝ වාදිතයක්) සිසුන්ට වාදනය කර පෙන්වන්න.

- වාදනය කරන ගීතයේ හඬ සර්පිනාවෙන් නිපදවෙන ආකාරය පිළිබඳ ව සිය අදහස් විමසමින් පාඩමට පිවිසෙන්න.

පියවර 02
- ඇමුණුම් අංක 1 ඇතුළත් කියවීම් පත්‍රිකාව සිසුන් අතට පත් කරන්න. භාවිතයෙන් ඉවත් කර ඇති සර්පිනා කොටස් ද ලබා දෙන්න.
- අවශ්‍යතාවක් වුවහොත් සර්පිනාව පරීක්ෂා කිරීමට ද, සිසුන්ට අවස්ථාවක් ලබා දෙන්න.
- ඇමුණුම් 2 ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට බෙදා දී එම ක්‍රියාකාරකම්හි යොදවන්න.

පියවර 03
- ඉදිරිපත් කළ කාර්ය පත්‍රිකාවේ තොරතුරු ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය:-**
- සිසුන්ගේ ඉදිරිපත් කිරීම දැනගැනීමට ලක් කර සදොස් තැන් නිදොස් කරන්න.

**අතිරේක උදවු:-**
- අන්තර්ජාලයේ සර්පිනාව පිළිබඳ ව විස්තර සෙවීමට උපදෙස් දෙන්න.
- "ස්වර පුවරු සංගීත භාණ්ඩ වාදන ශිල්ප ක්‍රම" ආර්. එම්. පී. චන්ද්‍රසිරි රණසිංහ.
- ස්වර පුවරු වාද්‍ය දීපනී - සුදත් සමරසිංහ

**ඇමුණුම් 1**

**සර්පිනාවේ ව්‍යුහය**

බාහිර පෙනුම අනුව සර්පිනාව සරල පෙනුම හතරැස් පෙට්ටියක ස්වරූපයක් ගනියි. දැව වර්ග යොදාගෙන ඇති අතර අවශ්‍යතාව පරිදි ලෝහ කොටස් ද යොදා සර්පිනාව නිපදවා ඇත. හතරැස් ලී පෙට්ටියක් බඳු සර්පිනාව මැදින් දෙකට බෙදා වෙන් කොට ඇත. එම බෙදීම සිදුකොට ඇත්තේ උඩ තට්ටුව හා යට තට්ටුව වශයෙනි. යට තට්ටුවට පිරෙන වාතය උඩ තට්ටුවට ගැනීම සඳහා මැද ලෑල්ලේ සිදුරු 6 ක් හෝ 8 ක් ඇත. එම ලෑල්ල මතුපිට නැවත කොටස් දෙකකට හෝ තුනකට බෙදා ඇත. නළා කාණ්ඩ අනුව එම කොටස් ගණන වෙනස් වේ. සිදුරු විවෘත කිරීම හා වැසීම සඳහා කම්බි කුරක් අග හතරැස් ලී පතුරු කැබැල්ලක් රඳවා තිබේ. එය ව්‍යවහාරික බසින් ස්ටොපර්ස් නමින් හඳුන්වයි. එය තල්ලු කිරීමෙන් සුළං සිදුර වැසීම ද, ඇදීමෙන් සුළං සිදුර විවෘත වීම ද, සිදු වේ. පහළ ස්වරයේ සිට ඉහළ ස්වරය දක්වා නළා 36ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සර්පිනාවේ එසවිය හැකි පහළ මැද ලෑල්ලට සවි කොට තිබේ.

සර්පිනාව සඳහා සුළං නිපදවෙන්නේ බැලෝව මඟිනි. එය තරමක් ඝන හාර්ඩ්බෝඩ් හා තුනී ලෙදර් සමින් නිමවා ඇත. මෙවැනි බැලෝ දෙකක් සාමාන්‍යයෙන් සර්පිනාවක පිහිටා ඇත. සර්පිනා වර්ග කිරීමේ දී බැලෝව ද විශේෂත්වයක් උසුලයි.

♦ සර්පිනා වර්ග =

- සිංගල් රීඩ්, ඩබල් රීඩ්, ත්‍රී සෙට්, ඔටෝ මැටික්, ස්කේල් චේන්ජර්
- හෑන්ඩ් බැලෝ සර්පිනාව (අතින් බැලෝ කිරීම)
- ෆුට් බැලෝ සර්පිනාව (පාදවලින් බැලෝ කිරීම)
- සයිඩ් බැලෝ, එකෝඩියන් බැලෝ.

√ යොදන නළා සංඛ්‍යාවන් අනුව වර්ග කිහිපයකි.

## සර්පිනාවේ ක්‍රියාකාරීත්වය

බැලෝ එක එහා මෙහා කිරීමෙන් සර්පිනාවේ ඇතුළත කුහරයට වාතය පිරේ. ස්ටෝපර්ස් එළියට ඇදීමෙන් යට තට්ටුවේ සිට උඩතට්ටුවට වාතය ගමන් කිරීම සිදුවේ. යතුරු එබීමෙන් යතුරේ කෙළවර එසවෙන අතර එතැන පිහිටා ඇති සිදුරුවලින් වාතය පිටතට ගමන් කරයි. එම මාර්ගය තුළ පිහිටා ඇති නළා සුළඟ වැදීමෙන් කම්පනය වන අතර එයින් නාදයක් නොහොත් නියමිත ස්වරය නිපදවේ.

## සර්පිනා වාදන ශිල්ප ක්‍රම

හැන්ඩ් බැලෝ ස්ර්පිනා තනි අතින් ද, ෆුට් බැලෝ සර්පිනා දෑතින් ද, වාදනය කෙරේ. හැන්ඩ් බැලෝ වාදනය සඳහා දකුණත භාවිත කළ අතර පැරණි ශිල්පීහු බොහෝ දෙනෙක් වමත ද භාවිත කළෝය.

## සර්පිනාවේ භාවිතය

ඉන්දීය ගසල් ගායනයේ ප්‍රධානතම වාද්‍ය භාණ්ඩයකි. ශාස්ත්‍රීය රාගධාරී වාදන සර්පිනාවෙන් ඉදිරිපත් කෙරේ. නූර්ති සංගීතයේ ද ප්‍රධාන වාද්‍ය භාණ්ඩයකි. වත්මන් ''පැදුරු සාජ්ජ'' හා වෙනත් සංගීත වාදනවලදී ද, සර්පිනාව බහුල ව භාවිත වේ.

සර්පිනාව භාවිතයේ දී එය ගුණාත්මකව හා ආරක්ෂාකාරීව භාවිතය සඳහා

- බැලෝ එක ලොක් කිරීමේ දී යතුරු ඔබමින් පිරී ඇති සුළං පිටතට විසිරෙන පරිදි ලොක් කිරීමට සැලකිලිමත් වීම.
- ස්ටෝපර්ස් නැවත ඇතුළට යොමු කිරීම. උඩ ලී ආවරණය යථා පරිදි ස්ථාන ගත කිරීම.
- ශ්‍රැති ස්වරය පවත්වා ගැනීම සඳහා යතුරු සම්බන්ධ ටෙන්ෂන් කම්බි නැවීම හෝ දිගහැරීම නොකිරීම.
- අත්‍යවශ්‍යම කාරණයක දී හැර උඩ ලී ආවරණය ඉවත් නොකිරීම.

## ඇමුණුම් 2 කාර්ය පත්‍රිකාව

පහත සඳහන් පින්තූර සටහන් පරීක්ෂා කර එම පින්තූරවලින් කෙරෙන කාර්යය නැතහොත් එහි උපයෝගීතාව පිළිබඳ ව සරල ව පින්තූරය ඉදිරියෙන් ලියන්න.



බැලෝ එක




ස්ටොපර්ස්



නලා සෙට්

ස්ප්‍රින් ______________________





ඇතුළත
පෙට්ටියේ වා
කවුලු



බැලෝ වා
කවුලු

**ක්‍රියාකාරකම 24**

## විවිධ ස්වර ස්ථාන ශ්‍රැති කර ගනිමින් ස්වර පුවරුවෙන් ගීත වාදනය කරයි.

**නිපුණතාව 2.0** :- වාද්‍ය භාණ්ඩයේ ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.1** :- වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම 2.1** :- විවිධ ස්වර ස්ථාන ශ්‍රැති කර ගනිමින් ස්වර පුවරුවෙන් ගීත වාදනය කරයි.

**කාලච්ඡේද** :- 05

**ඉගෙනුම් පල** :-

- ම හා ප ශ්‍රැති කර ගත් විට ලැබෙන ස්වර අෂ්ටකය නම් කරයි.
- ම හා ප ශ්‍රැති කර ගනිමින් වාදනය කිරීම සඳහා විශේෂයෙන් අභ්‍යාස කළ යුතු බව දැන ගනියි.
- ම හ, ප ශ්‍රැති කර ගනිමින් බිලාවල් හා කාෆි යන රාගයනට අයත් ආරෝහණ අවරෝහණ හා ගීත වාදනය කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- ඇමුණුම 1 - 2
- සිසුන් සපයා ගත් ස්වර පුවරු වාද්‍ය භාණ්ඩ

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

ස්වර පුවරුවෙන් වාද්‍ය භාණ්ඩයක් මඟින් බිලාවල් හා කාෆි යන රාගයන්හි ආරෝහණ අවරෝහණ හා සරල ගීත කිහිපයක් (කාලය හා සිසුන්ගේ හැකියාව අනුව) මධ්‍යම භාවයෙන් හා පංචම භාවයෙන් වාදනය කිරීමේ හැකියාව ලබාදීම මෙයින් අපේක්ෂිත ය.

පළමුව ෂඩ්ජ භාවය (C Major Scale) වාදනය කරවා එහි ස්වර අන්තරයන් පිළිබඳ ව පූර්ණ අවබෝධයක් ලබා දිය යුතු යි. ඒ සඳහා ඇමුණුම 1 හෝ ඔබ විසින් සකසා ගන්නා ලද දෘශ්‍ය උපකරණයක් හෝ භාවිත කළ හැකිය. ෂඩ්ජ භාවයේ ස්වරයන් අතර පරතරය දෘශ්‍ය උපකරණය මඟින් ම අවබෝධ කර ගත් පසු ඒ අනුව යමින් මධ්‍යම භාවය (F Major Scale) හා පංචම භාවය (G Major Scale) ගොඩනැඟීම සඳහා සිසුන් පොලඹවන්න.

පළමු කාලච්ඡේද දෙක තුළ ස්වර අෂ්ටක ලියා එම අෂ්ටක ස්වර පුවරුවෙන් වාදනය කිරීමත් තෙවන කාලච්ඡේදය තුළ බිලාවල් හා කාෆි ආරෝහණ අවරෝහණ මධ්‍යමයෙන් හා පංචමයෙන් වාදනය කිරීමත් කළ යුතු වේ. සිවු වන හා පස් වන කාලච්ඡේද තුළ ගීතයක ස්වර ලියවා වාදනය කරවන්න.

**පාඩම සංවර්ධනය :-**

කාලච්ඡේද 1 හා 2

පියවර 01

- සිසුන් දන්නා ස්වර ස්ථාපන ගීතයක මුල් පාදය ස, ම, ප යන ස්වර ශ්‍රැති කොට ගෙන සිසුන් සමඟ ගයන්න.
- ගීතයේ හඬට සිදු වූ වෙනස සිසුනට දැනුණු අයුරු විමසමින් පාඩමට පිවිසෙන්න.

(මිනිත්තු 05)

පියවර 02

- ඇමුණුම 1 බෙදා දී එහි සඳහන් ක්‍රියාකාරකමෙහි සිසුන් යොදවන්න.

(මිනිත්තු 50)

පියවර 03

- මධ්‍යම භාවය හා පංචම භාවය වාදනය කිරීමට සලස්වන්න.
- සදොස් තැන් ඇතොත් නිදොස් කරන්න.

(මිනිත්තු 10)

කාලච්ඡේද 3 පියවර 01

- මධ්‍යම භාවය හා පංචම භාවය ෂඩ්ජ භාවය සමඟ සසඳමින් ස්වර පුවරුවෙන් වයා පෙන්වමින් පාඩමට පිවිසෙන්න.

(මිනිත්තු 05)

පියවර 02

- ඇමුණුම 2 බෙදා දී එහි ඇතුළත් ක්‍රියාකාරකමෙහි සිසුන් යොදවන්න.

(මිනිත්තු 20)

පියවර 03

- බිලාවල් හා කාෆි ආරෝහණ අවරෝහණ මධ්‍යමයෙන් හා පංචමයෙන් වාදනය කිරීමට සලස්වා ප්‍රතිපෝෂණය කරන්න.

(මිනිත්තු 10)

කාලච්ඡේද 4 හා 5 පියවර 01

- ස, ම, ප, ස්වරයන් හැර වෙනත් ස්වර කිහිපයක් ශ්‍රැති කර ආරෝහණ අවරෝහණ හා කුඩා ගීතයක් වාදනය කරමින් පිවිසෙන්න.

(මිනිත්තු 10)

පියවර 02

- මෙතෙක් සිසුන් ලත් අත්දැකීම් භාවිතයෙන් හා ඔබගේ අධීක්ෂණයෙන් කුඩා ගීත දෙකක් මධ්‍යම භාවයෙන් හා පංචම භාවයෙන් ලියවන්න. (එකට සතුටු සාගරේ.... / නිල් අහස් තලේ..../ දියගොඩ සැම තැන...)
- එය ස්වර පුවරුවෙන් වාදනය කිරීමට සලස්වා අවශ්‍ය උපදෙස් සපයන්න.

(මිනිත්තු 50)

පියවර 03

- තනි තනි ව වාදනය කරවා, අවශ්‍ය ප්‍රතිපෝෂණය ලබා දෙන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- මධ්‍යම පංචම භාවයෙන් ප්‍රස්තාර ලිවීම හා එය ස්වර පුවරුවෙන් නිවැරදි ව වැයීමේ හැකියාව මැනිය හැකි සේ සැකසූ ඇගයීමක් මඟින් අගයන්න.

**පසු අභ්‍යාස :-** වෙනත් ගීත ලියා වාදනයට සලස්වන්න.

**අතිරේක උදවු :-** බටහිර සංගීතය පිළිබඳ තොරතුරු ඇතුළත් පොතපත.

**ඇමුණුම 01**

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 |
| ස්වර 12 පිහිටීම → | ස | රි̲ | රි | ග̲ | ග | ම | ම´ | ප | ධ̲ | ධ | නි̲ | නි | ස |
| ෂඩ්ජභාවයෙන් අෂ්ටකය → | ස | | රි | | ග | ම | | ප | | ධ | | නි | ස̇ |
| | 1 | | 2 | | 3 | 4 | | 5 | | 6 | | 7 | 8 |

පහත වගුව අධ්‍යයනය කරන්න.

පහත කරුණු අවධානයෙන් නිරීක්ෂණය කරන්න.

- දෙවන තීරුවේ තිබෙනුයේ ඔබ පෙර උගත් ස්වර 12 පිහිටීම.
- තෙවන තීරුවේ ෂඩ්ජයෙන් පටන් ගත් ස්වර අෂ්ටකය ඇතුළත් ය. (C Major Scale)

  එහි

  - ස්වර අෂ්ටකයෙහි ස්වර අතර ඇති පරතරයන් නිරීක්ෂණය කරන්න.
  - තුන් වන හතර වන ස්වර අතර හා හත් වන අට වන යන ස්වර අතර පරතරයක් තිබේ ද?
  - මෙම ස්වර පිහිටීම ස්වර පුවරුවෙන් වයමින් අධ්‍යයනය කරන්න.

ෂඩ්ජ භාවය
C Major Scale
1 සිට 8 දක්වා අංක යෙදූ ස්වර

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 |
| ස | රි̲ | රි | ග̲ | ග | ම | ම´ | ප | ධ̲ | ධ | නි̲ | නි | ස |
| ස | | රි | | ග | ම | | ප | | ධ | | නි | ස̇ |
| 1 | | 2 | | 3 | 4 | | 5 | | 6 | | 7 | 8 |

මධ්‍යම භාවය
F Major Scale
1 සිට 8 තෙක් අංක යෙදූ ස්වර

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 | 2 | 3 | 4 | 5 | 6 |
| ම | ම´ | ප | ධ̲ | ධ | නි̲ | නි | ස | රි̲ | රි | ග̲ | ග | ම |
| ම | | ප | | ධ | නි̲ | | ස̇ | | රි | | ග | ම |
| 1 | | 2 | | 3 | 4 | | 5 | | 6 | | 7 | 8 |

පංචම භාවය
G Major Scale
1 සිට 8 තෙක් අංක යෙදූ ස්වර

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 8 | 9 | 10 | 11 | 12 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
| ප | ධ̲ | ධ | නි̲ | නි | ස̇ | රි̲̇ | රි̇ | ග̲̇ | ග̇ | ම̇ | ම̇´ | ප̇ |
| | | | | | | | | | | | | |
| 1 | | 2 | | 3 | 4 | | 5 | | 6 | | 7 | 8 |

- ෂඩ්ජ භාවය ඇසුරින් මධ්‍යම භාවයෙහි හා පංචම භාවයෙහි තුන් වන තීරුව පුරවන්න.
- වෙන වෙන ම ස්වර පුවරුවකින් වාදනය කර නිවැරදිතාව තහවුරු කර ගන්න.
- ගුරු සහාය ලබාදී නිවැරදි බව තහවුරු කර ගන්න.

**ඇමුණුම 2**

පහත දක්වා ඇත්තේ ෂඩ්ජ භාවයෙන් බිලාවල් හා කාෆි යන රාගයන්ගේ ආරෝහණ ය. එය හොඳින් අධ්‍යයනය කරන්න.

බිලාවල්

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 |
| ස | රි̲ | රි | ග̲ | ග | ම | ම´ | ප | ධ̲ | ධ | නි̲ | නි | ස |
| ස | | රි | | ග | ම | | ප | | ධ | | නි | ස̇ |
| 1 | | 2 | | 3 | 4 | | 5 | | 6 | | 7 | 8 |

කාෆි

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 |
| ස | රි̲ | රි | ග̲ | ග | ම | ම´ | ප | ධ̲ | ධ | නි̲ | නි | ස̇ |
| ස | | රි | ග̲ | | ම | | ප | | ධ | නි̲ | | ස̇ |
| 1 | | 2 | 3 | | 4 | | 5 | | 6 | 7 | | 8 |

- කාෆි රාගයේ ස්වරයන්හි අන්තරය පිළිබඳ ව අධ්‍යයනය කරන්න. එහි 2 හා 3 අතර හා 6 හා 7 අතර පරතරයක් නොමැති බව ප්‍රකට වනු ඇත.
- කාෆි රාගයේ ෂඩ්ජ භාවයේ පරතරයන් අනුගමනය කරමින් මධ්‍යම භාවයෙන් හා පංචම භාවයෙන් එහි ආරෝහණ අවරෝහණ ලියන්න.
- ලියූ ස්වර ගුරු තුමිය/තුමා පරීක්ෂා කොට බලා බිලාවල් හා කාෆි යන රාගයන්හි ආරෝහණ හා අවරෝහණ ස්වර පුවරුවෙන් වාදනය කරවන්න.

**ක්‍රියාකාරකම 25**

## විවිධ ස්වර ස්ථාන ශ්‍රැති කර ගනිමින් වාද්‍ය භාණ්ඩයෙන් ගීත වාදනය කරයි.

**නිපුණතාව 2.0** :- වාද්‍ය භාණ්ඩයේ ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.1** :- වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම 2.1** :- විවිධ ස්වර ස්ථාන ශ්‍රැති කර ගනිමින් වාද්‍ය භාණ්ඩයෙන් ගීත වාදනය කරයි.

**කාලච්ඡේද** :- 05

**ඉගෙනුම් පල** :-

- ෂඩ්ජ භාවයෙන් ලියැවුණු ස්වර ප්‍රස්තාරයක් මධ්‍යම භාවයෙන් හා පංචම භාවයෙන් ලිවීමට හැකියාව ලබයි.
- ශ්‍රැති මාරු කිරීමෙන් ගීතයේ රසය වෙනස් වන බව හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- ම හා, ප ශ්‍රැති කර ගනිමින් බිලාවල් හා කාෆි යන රාගයට අයත් ආරෝහණ අවරෝහණ හා ගීත වාදනය කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- සිසුන් විසින් සපයා ගැනුණු ස්වර වාද්‍ය භාණ්ඩ

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

සිසුන් තෝරා ගත් වාද්‍ය භාණ්ඩය මඟින් මධ්‍යම භාවයෙන් හා පංචම භාවයෙන් ස්වර අෂ්ටකය හා ගීත වාදනය කරවීම අපේක්ෂිත ය.

සිසුන් පෙර පාඩමේ දී ලත් අත්දැකීම් භාවිතයට ගනිමින් ස්වර ප්‍රස්තාර තනි ව මධ්‍යම භාවයෙන් හා පංචම භාවයෙන් ලියැවීම අපේක්ෂිත ය. අනතුරු ව එම ගීතය ස්වර වාද්‍ය භාණ්ඩයෙන් වාදනය කිරීම ද කළ යුතු ය.

පළමු කාලච්ඡේදයේ දී මධ්‍යම භාවයෙන් හා පංචම භාවයෙන් ස්වර අෂ්ටකය හා සරිග, රිගම වැනි ස්වර අභ්‍යාසයක් පුහුණු කරවන්න. දෙවන හා තෙවන කාලච්ඡේදයන්හි ෂඩ්ජ භාවයෙන් ඇති ගීත දෙකක හෝ තුනක ස්වර ප්‍රස්තාරය මධ්‍යම භාවයෙන් හා පංචම භාවයෙන් ලියවන්න.

මේ සඳහා පහත දැක්වෙන ගීත යොදා ගත හැකි ය.

- නිල් අහස් තලේ
- දියගොඩ සැම තැන
- 7/8/9 ශ්‍රේණිවල ඇති සරල ගී හෝ ඔබ විසින් තෝරා ගන්නා ලද ගීත. එම ගීත හතර වන හා පස් වන කාලච්ඡේදයන්හි වාදනයට හුරුකරවන්න.

**පාඩම සංවර්ධනය :-**

කාලච්ඡේද 1 පියවර 01

- සිසුන් දන්නා ස්වර ස්ථාපන ගීතයක මුල් පාදය ස, ම, ප යන ස්වර ශ්‍රැති කොට ගෙන සිසුන් සමඟ ගයන්න.
- ගීතයේ හඬට සිදු වූ වෙනස සිසුනට දැනුණු අයුරු විමසමින් පාඩමට පිවිසෙන්න.

(මිනිත්තු 05)

පියවර 02

- ෂඩ්ජභාවය හා සසඳමින් මධ්‍යම භාවයෙන් හා පංචම භාවයෙන් ස්වර අෂ්ටකය වාදනය කිරීමට සලස්වන්න.

- මධ්‍යම භාවයෙන් හා පංචම භාවයෙන් ස්වර අභ්‍යාසයක් වාදනය කරවන්න.

(මිනිත්තු 25)

පියවර 03

- මධ්‍යම භාවය හා පංචම භාවය වාදනය කිරීමට සලස්වන්න.
- සදොස් තැන් ඇතොත් නිදොස් කරමින් අගයන්න.

(මිනිත්තු 10)

2 හා 3 කාලච්ඡේද.පියවර 01

- ෂඩ්ජ භාවයෙන් මධ්‍යම භාවයෙන් හා පංචම භාවයෙන් ලියූ ස්වර ප්‍රස්තාර පෙන්වමින් ඒවා සිසුනට හඳුනා ගැනීමට සලස්වන්න.
- එම ප්‍රස්තාරයන්හි විශේෂතා පිළිබඳ ව සාකච්ඡා කරමින් පිවිසෙන්න.

(මිනිත්තු 10)

පියවර 02

- ඔබ තෝරා ගත් ගීතයන්හි ස්වර ලිපි මධ්‍යම භාවයෙන් හා පංචම භාවයෙන් ලියවන්න.

(මිනිත්තු 60)

පියවර 03

- ලියූ ප්‍රස්තාර පරීක්ෂා කර සදොස් තැන් නිදොස් කරන්න.

(මිනිත්තු 10)

4 හා 5 කාලච්ඡේද.පියවර 01

- ෂඩ්ජ භාවයෙන් ලියූ ස්වර ප්‍රස්තාරයක් දී එය මධ්‍යම භාවයෙන් හා පංචම භාවයෙන් වැයීමට සිසුනට ඇති හැකියාව පිරික්සමින් පාඩමට පිවිසෙන්න.

(මිනිත්තු 10)

පියවර 02

- සිසුන් විසින් ලියන ලද ප්‍රස්තාර වාදනය කරවන්න.

(මිනිත්තු 50)

පියවර 03

- තනි තනි ව වාදනය කරවා අවශ්‍ය ප්‍රතිපෝෂණය ලබා දෙන්න.

(මිනිත්තු 20)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- මධ්‍යම පංචම භාවයෙන් වාදනය කිරීමේ දී නිවැරදිතාව මැනීමට හැකි සේ සැකසූ ඇගයීමක් මඟින් අගයන්න.

**පසු අභ්‍යාස :-** වෙනත් ගීත ලියා වාදනයට සලස්වන්න.

**අතිරේක උදවු :-** ගීත ප්‍රස්තාර ශතකය.

**ක්‍රියාකාරකම 26**

## අපරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණය

**නිපුණතාව 7.0** : සංගීත නිර්මාණ කාර්යයයේ අත්හදා බැලීම් කරයි.

**නිපුණතා මට්ටම 7.2** : අපරදිග තූර්යවාදක භාණ්ඩ වර්ගීකරණය.

**කාලච්ඡේද සංඛ්‍යාව** : කාලඡේද 02

**ඉගෙනුම් පල** :
- අපරදිග සංගීත භාණ්ඩ නම් කරයි.
- ඒවා වර්ග කරයි.
- බටහිර සංගීත භාණ්ඩ රාශියක් ඇති බව පිළිගනියි.
- භාණ්ඩ වෙන් කිරීමේ කුසලතාව ලබයි.

**ගුණාත්මක යෙදවුම්**
- ඇමුණුමේ දැක්වෙන විස්තර ඇතුළත් දෘශ්‍ය උපකරණ
- සංගීත භාණ්ඩ රූප සටහන්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

බටහිර සංගීත භාණ්ඩ අතරින් පාසල් පද්ධතියේ භාවිත වන භාණ්ඩ රාශියක් පාසල් තූර්යවාදක කණ්ඩායම්වල භාවිත වේ. පෙරදිග සංගීතය හැදෑරුව ද සිසුන් ඒවා හඳුනාගැනීම ඵලදායි වේ. ඇමුණුමේ දැක්වෙන රූප සටහන් හෝ මිල දී ගත් රූප සටහන් හෝ පාඩම සංවර්ධනයේ දී යොදා ගත හැකි ය. වර්ණ පින්තූර යොදා ගැනීම වඩාත් වාසිදායක ය. මීට පෙර පාඩමේ දී අධ්‍යයනය කළ අපරදිග තූර්යවාදක භාණ්ඩ වර්ගීකරණය පාඩම හා සම්බන්ධ කරගන්න.

**පාඩම සංවර්ධනය**

**පියවර 01 :**
- අපරදිග තූර්යවාදක භාණ්ඩවල නම් පිළිබඳ සිසුන් විමසන්න.

(විනාඩි 05)

**පියවර 02 :**
- ඇමුණුමේ දැක්වෙන වගුව ප්‍රදර්ශනය කරන්න. එක් එක් භාණ්ඩ වර්ගය පිළිබඳ විස්තර සාකච්ඡා කරන්න.

(විනාඩි 30)

**පියවර 03 :**
- ගැලීම් සටහනක් මඟින් වර්ගීකරණය දක්වන්න.

(විනාඩි 35 )


**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- රූප සටහන් ඇතුළත් කර අපරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණය සකසා අගයන්න.

(විනාඩි 10)

**පසු අභ්‍යාස** :
- පාසලේ මෙම භාණ්ඩ ඇත්නම් නිදහස් කාලවල දී ශුද්ධ ස්වර සප්තකය වාදනය හුරු වීමට යොමු කරන්න.

**අතිරේක උදවු** : **අපරදිග තූර්ය වාදක භාණ්ඩ වර්ගීකරණයට අනුව රූප සටහන් අලවා සැකසූ පොත් පිංචක් පන්තියට ඉදිරිපත් කරන්න.**

අපරදිග තූර්ය වාදක භාණ්ඩ තන්ත්‍රීය ( String ) ශුෂිර ( Wind ) සමාඝාත ( Percusion ) යනුවෙන් ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදේ. ඒවා පසු ව නැවත අනු කොටස්වලට බෙදේ.




පහත දැක්වෙන භාණ්ඩ එක් එක් කොටසට බෙදා දක්වන්න.

| | | | |
|---|---|---|---|
| Violin | Viola | Cello | Double Bass |
| Guitar | Mandolin | | Banjo Mandolin |
| Saxphone | Clarinet | Trombone | Oboe |
| Eupohinium | Tuba | Trumpet | Cornet |
| Feench Horn | Corangali | | |
| GlockenSpiel | Vibrophone | | Xylophone |
| Bass Drum | Tenor Drum | | Side Drum |
| Timpony Drum | | | |

**ක්‍රියාකාරකම 27**

## අපරදිග සංගීත භාණ්ඩ

**නිපුණතාව 7.0** : සංගීත නිර්මාණ කාර්යයයේ අත්හදා බැලීම් කරයි.

**නිපුණතා මට්ටම 7.2** : පාසල්පද්ධතිය තුළ භාවිත වන අපරදිග තූර්යවාදක භාණ්ඩ පිළිබඳ විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : කාලඡේද 02

**ඉගෙනුම් පල** :
- පාසල් පද්ධතියේ භාවිත වන අපරදිග සංගීත භාණ්ඩ නම් කරයි.
- ඒවායේ සම නිෂමකම් දක්වයි.
- බටහිර සංගීත භාණ්ඩ රාශියක් ඇති බව පිළිගනියි.
- රූප සටහන් වෙන් කිරීමේ කුසලතාව ලබයි.

**ගුණාත්මක යෙදවුම්**
- ඇමුණුමේ දැක්වෙන රූප සටහන් ඇතුළත් දෘශ්‍ය උපකරණ
- වැල්ව් තුනක් සහිත භාණ්ඩවල ශුද්ධ ස්වර පිහිටන අයුරු දැක්වෙන ගැලීම් සටහනක්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

බටහිර සංගීත භාණ්ඩ අතරින් පාසල් පද්ධතියේ භාවිත වන භාණ්ඩ රාශියක් පාසල් තූර්යවාදක කණ්ඩායම් වල භාවිත වේ. පෙරදිග සංගීතය හැදෑරුව ද සිසුන් ඒවා හඳුනාගැනීම ඵලදායී වේ. ඇමුණුමේ දැක්වෙන රූප සටහන් හෝ මිල දී ගත් රූප සටහන් හෝ පාඩම සංවර්ධනයේ දී යොදා ගත හැකි ය. වර්ණ පින්තූර යොදා ගැනීම වඩාත් වාසිදායක ය. මීට පෙර පාඩමේ දී අධ්‍යයනය කළ අපරදිග තූර්යවාදක භාණ්ඩ වර්ගීකරණය පාඩම හා සම්බන්ධ කරගන්න. බටහිර තූර්ය වාදක භාණ්ඩවල මුද්‍රිත පිටපත් කිහිපයක් පන්තියට රැගෙන ඒමට මුලින් සිසුන් දැනුම්වත් කරන්න.

**පාඩම සංවර්ධනය**

**පියවර 01 :**
- අපරදිග තූර්යවාදක භාණ්ඩ වර්ගීකරණය පිළිබඳ ව සිසුන් නැවත විමසන්න. බටහිර තූර්යවාදක කණ්ඩායමක භාවිත වන සිසුන් දන්නා භාණ්ඩ පිළිබඳ ව විමසන්න.

(මිනිත්තු 05)

**පියවර 02 :**
- ඇමුණුමේ දැක්වෙන රූප සටහන් ප්‍රදර්ශනය කරන්න. එක් එක් භාණ්ඩය පිළිබඳ ව විස්තර සාකච්ඡා කරන්න. Bass Drum, Side Drum or Snare Drum, Tenor Drum ආදි අවනද්ධ වාද්‍ය භාණ්ඩ පිළිබඳව ද සාකච්ඡා කරන්න.

(මිනිත්තු 30)

**පියවර 03 :**
- එක් එක් භාණ්ඩයේ නාද නිකුත් වන අයුරු සහ ස්වර වාදනය කරන ආකාරය අනුව සමාන අසමාන කම් සාකච්ඡා කරන්න. වැල්ව් තුනක් සහිත සංගීතභාණ්ඩවල ශුද්ධ ස්වර පිහිටන අයුරු වගුවක් මගින් දක්වන්න.

(මිනිත්තු 35)


**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- රූප සටහන් ඇතුළත් කර අපරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණය සකසා අගයන්න.

(මිනිත්තු 10)

**පසු අභ්‍යාස** :
- පාසලේ මෙම භාණ්ඩ ඇත්නම් නිදහස් කාල වලදී ශුද්ධ ස්වර සප්තකය වාදනය හුරුවීමට යොමු කරවන්න.

**අතිරේක උදවු** :
- මුද්‍රිත වර්ණ සංගීත භාණ්ඩ වල පින්තූර.

Brasswind Instrur


















Woodwind Instruments






Oboe
ඕබෝ



## BassDrum




## Side Drum Or Snare Drum




## Tenor Drum



**ක්‍රියාකාරකම 28**

# Sharps, Flat, Natural Marks

**නිපුණතාව 8.0** : සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත් දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි.

**නිපුණතා මට්ටම 8.1** : බටහිර සංගීත ප්‍රස්තාරකරණයේ කුසලතා ලබයි.

**කාලච්ඡේද** : 01

**ඉගෙනුම් පල** :
- බටහිර සංගීත ප්‍රස්තාරයක භාවිත වන සංකේත කිහිපයක් පැහැදිලි කරයි.
- එම සංකේත ලියා දක්වයි.
- බටහිර ක්‍රමයට ප්‍රස්තාර කිරීමේ අවශ්‍යතාව පිළිගනියි.
- බටහිර ක්‍රමයට ප්‍රස්තාර කිරීමේ කුසලතාව ලබයි.

**ගුණාත්මක යෙදවුම්**
- ඇමුණුමේ දැක්වෙන සංකේත ඇතුළත් දෘශ්‍ය උපකරණ
- බටහිර ක්‍රමයට සැකසූ ස්වර ප්‍රස්තාරයක් දෘශ්‍ය උපකරණයක් ලෙස.
- ස්වර වාද්‍ය භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

බටහිර ක්‍රමයට සංගීත ප්‍රස්තාර කිරීමේ කුසලතාවය පෙරදිග සංගීත විෂය හදාරන දරුවන්ට ද අවශ්‍ය ය. අන්තර්ජාලය තුළ ඇති විවිධ සංගීතාංග ප්‍රස්තාර කර ඇත්තේ බටහිර ක්‍රමයට ය. භාරතීය රාගධාරී සංගීතයට අයත් ගීත සහ සංගීතාංග ද ඉංග්‍රීසි බසින් හා බටහිර ප්‍රස්තාර ක්‍රමයට ලියා අන්තර්ජාලයට මුසු කර ඇත. ඒවා ඉගෙනුමට සියලු ම සිසුන්ට බටහිර ක්‍රමයට ප්‍රස්තාර කිරීමේ හැකියාව තිබිය යුතු ය. ඒ අපේක්ෂාවෙන් මෙම පාඩම් මාලාව ක්‍රියාත්මක කෙරේ. බටහිර සංගීත ප්‍රස්තාර ක්‍රමයට අයත් පාඩම් මාලාව ඉගැන්වීම ආරම්භයේ දී ම, පිටු 120ක පමණ Manuscript Book නම් බටහිර ප්‍රස්තාර ලියා දක්වන අභ්‍යාස පොතක් රැගෙන ඒමට සිසුන් දැනුම්වත් කරන්න. එම පොත බටහිර ප්‍රස්තාර ක්‍රමයට අදාළ ස්වර ප්‍රස්තාර කිරීමටත්, විවිධ ස්වර සංකේත ලියා පුහුණු වීමටත් 11 තෙක් දක්වා භාවිත කිරීමට මඟ පෙන්වන්න.

**පාඩම සංවර්ධනය**

**පියවර 01 :**
- බටහිර ක්‍රමයට ප්‍රස්තාර කළ දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කරන්න. ඒ පිළිබඳ ව සිසුන් විමසන්න.

(විනාඩි 05)

**පියවර 02 :**
- සංකේත ඇතුළත් දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කර හෝ ඇමුණුමේ දැක්වෙන තොරතුරු සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

(විනාඩි 15)

**පියවර 03 :**
- Manuscript Book එකක කඩදාසි භාවිත කර එම සංකේත ඇඳීමට හුරු කරන්න.

(විනාඩි 15 )

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- අදාළ සංකේත ඇතුළත් කර බටහිර ප්‍රස්තාර කොටසක් සකස් කර අගයන්න.


(විනාඩි 05)

**පසු අභ්‍යාස** :
- නිදහස් කාලවල දී සංකේත හුරු කිරීමට යොමු කරන්න.

**අතිරේක උදවු :**
- 

ඇමුණුම.

- බටහිර ප්‍රස්තාර ක්‍රමයේ සංකේත රාශියක් භාවිත වන අතර ඒවා වරින් වර අධ්‍යයනය කිරීමට ඉඩ සැලසේ. ඒ එක් එක් සංකේතයෙන් විවිධ අදහස් මතුවේ. පහත දැක්වෙන ප්‍රස්තාරයේ ශුද්ධ ස්වර පමණක් ඇතුළත් ව ඇත.





- ශුද්ධ, කෝමල සහ තීව්‍ර වශයෙන් වෙන් වෙන් ව ස්වර සංකේත යෙදේ.
- ඒවා Sharp, Flat, Natural ආදි වශයෙන් නම් කෙරේ.

Flat Mark. :- පෙරදිග ක්‍රමයට කෝමල ස්වරයක් ලකුණු කිරීමේ දී ස්වරයට යටින් ඉරක් අඳිනු ලැබුව ද, බටහිර සංගීතයේ දී ස්වරයට ඉදිරියෙන් බෝ කොළ අර්ධයක් ලෙස දැක්වෙන සංකේතයක් භාවිත කෙරේ.

Sharp Mark. :- පෙරදිග ක්‍රමයට තීව්‍ර ස්වරය ලකුණු කිරීමේ දී ස්වරයට පසු පසින් ඇල ඉරක් අඳිනු ලැබුව ද, බටහිර සංගීතයේ දී ස්වරයට ඉදිරියෙන් කොටුවක් ලෙස දැක්වෙන සංකේතයක් භාවිත කෙරේ.




Flat Mark
කෝමල ලකුණ



Sharp Mark
තීව්‍ර ලකුණ

Natural Mark. :- රේඛා මණ්ඩලයක ස්වර පිහිටන අයුරු මීට පෙර අධ්‍යයනය කර ඇත. ඒ අනුව රේඛාවක් මත Line සහ රේඛා දෙකක් අතරත Space වශයෙන් රේඛා මණ්ඩලයේ එක් එක් ස්වරයට හිමි ස්ථාන වෙන් කර ඇත. යම් ස්වර ප්‍රස්තාරයක කෝමල ස්වරයක් දිගින් දිගට ම යෙදේ නම් රේඛා මණ්ඩලයේ මුල දී ම එම ස්වරයට හිමි රේඛාව හෝ අතරත හෝ Flat Mark යොදනු ලැබීම සාමාන්‍ය සිරිත යි. එවැනි ස්වර ප්‍රස්තාරයක යෙදී ඇති කෝමල ස්වරය හිටි හැටියේ ශුද්ධ ස්වරයක් බවට පරිවර්තනය වන අවස්ථා ඇත. නිදසුනක් ලෙස කාෆි රාගයේ කෝමල ග, නි, ස්වර යෙදේ. එහෙත් ඉඳහිට ශුද්ධ ග, නි, ස්වර ද යෙදේ. එවන් අවස්ථාවක එසේ ශුද්ධ බවට පත් වූ ස්වරය දැක්වීමට Natural Mark නම් සංකේතය යොදනු ලැබේ.



Natural Mark
ශුද්ධ ලකුණ

**ක්‍රියාකාරකම 29**

# Clef', Rest Mark, Tie

**නිපුණතාව 8.0** : සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත් දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි.

**නිපුණතා මට්ටම 8.1** : බටහිර සංගීත ප්‍රස්තාරකරණයේ කුසලතා ලබයි.

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :
- බටහිර සංගීත ප්‍රස්තාරයක භාවිත වන සංකේත කිහිපයක් පැහැදිලි කරයි.
- එම සංකේත ලියා දක්වයි.
- බටහිර ක්‍රමයට ප්‍රස්තාර කිරීමේ සංකේත රාශියක් ඇති බව පිළිගනියි.
- බටහිර ක්‍රමයට ප්‍රස්තාර කිරීමේ කුසලතාව ලබයි.

**ගුණාත්මක යෙදවුම්**
- ඇමුණුමේ දැක්වෙන සංකේත ඇතුළත් දෘශ්‍ය උපකරණ
- බටහිර ක්‍රමයට සැකසූ ස්වර ප්‍රස්තාරයක් දෘශ්‍ය උපකරණයක් ලෙස.
- ස්වර වාද්‍ය භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

බටහිර සංගීත ප්‍රස්තාර ක්‍රමයට අයත් පාඩම් ඉගැන්වීම ආරම්භයේ දී ම, Manuscript Book පොතක් රැගෙන ඒමට සිසුන් දැනුම්වත් කර ඇත. මෙම පාඩමේ දී ද එම පොත භාවිත කරන්න. මෙම පාඩම් මාලාවට අයත් විවිධ සංකේත පියකරු ව, නිවැරදි ව, හා නියමිත ප්‍රමාණයට අනුව ලිවීම හුරු කිරීමට ගුරු භවතුන් අවධානය යොමු කළ යුතු වේ. ඒ නිසා එක් සංකේතයක් අවම වශයෙන් Manuscript Book පොතේ එක් පිටුවක් පුරා ඇඳ හුරු වීමට යොමු කරන්න.

**පාඩම සංවර්ධනය**

**පියවර 01 :**
- මීට පෙර පාඩමේ අධ්‍යයනය කළ Flat, Sharp, Natural ආදි ස්වර සංකේත පිළිබඳ කෙටි විමසුමක් කර පාඩමට පිවිසෙන්න.

(මිනිත්තු 05)

**පියවර 02 :**
- Great Staff , Treble Clef, Bass Clef සංකේත ඇතුළත් දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කර ඇමුණුමේ දැක්වෙන තොරතුරු සිසුන් සමඟ සාකච්ඡා කරන්න. Manuscript Book පොත භාවිත කර එම සංකේත ඇඳීමට හුරු කරන්න.

(මිනිත්තු 30)

**පියවර 03 :**
- Rest Mark, Tie සංකේත ඇතුළත් දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කර ඇමුණුමේ දැක්වෙන තොරතුරු සිසුන් සමඟ සාකච්ඡා කරන්න. Manuscript Book එකක කඩදාසි භාවිත කර එම සංකේත ඇඳීමට හුරු කරන්න.

(මිනිත්තු 35)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :
- අදාළ සංකේත ඇතුළත් කර බටහිර ප්‍රස්තාර කොටසක් සකස් කර අගයන්න.


(මිනිත්තු 05)

**පසු අභ්‍යාස** :
- නිදහස් කාලවල දී සංකේත හුරු කිරීමට යොමු කරන්න.

**අතිරේක උදවු** :









ඇමුණුම

Great Staff , Treble Clef, Bass Clef සංකේත ඇත.





බටහිර ප්‍රස්තාර කඩදාසියක ඇඳීමට යොමු කරන්න. එම රේඛා මණ්ඩලයේ ස්වර පිහිටන අයුරු විස්තර කරන්න.


Rest marks පෙරදිග සංගීත ප්‍රස්තාරවල යම්කිසි මාත්‍රා සංඛ්‍යාවක් නිශ්ශබ්ද බව දැක්වීමට එම මාත්‍රා ගණනට අනුරූප වන සේ + ලකුණු යොදනු ලැබේ. මාත්‍රා දෙකක් නිශ්ශබ්ද වන්නේ නම් + + ලකුණු දෙකක් යෙදීම ආදි වශයෙන් ය. බටහිර සංගීතයේ දී නිශ්ශබ්ද මාත්‍රා සංඛ්‍යාවක් හඟවන සංකේත Rest marks ලෙස නම් කරනු ලැබේ. බටහිර සංගීතයේ දී නිශ්ශබ්ද ව සිටිය යුතු එක් එක් මාත්‍රා සංඛ්‍යාවන් දැක්වීමට වෙන වෙන ම සංකේත ඇත.


| | | | | | |
|---|---|---|---|---|---|
|  | Semi Breeve Rest | මාත්‍රා 4ක් නිශ්ශබ්ද බව දැක්වීම |  | Dotted Semi Breeve Rest | මාත්‍රා 6ක් නිශ්ශබ්ද බව දැක්වීමට පසුපසින් තිතක් තබනු ලැබේ. |
|  | Minim Rest | මාත්‍රා 2ක් නිශ්ශබ්ද බව දැක්වීම |  | Dotted Minim Rest | මාත්‍රා 3ක් නිශ්ශබ්ද බව දැක්වීමට පසුපසින් තිතක් තබනු ලැබේ. |
|  | Crotchet Rest | මාත්‍රා 1ක් නිශ්ශබ්ද බව දැක්වීම |  | Dotted Crotchet Rest | මාත්‍රා 1½ක් නිශ්ශබ්ද බව දැක්වීමට පසුපසින් තිතක් තබනු ලැබේ. |
|  | Quaver Rest | මාත්‍රා භාගයක් නිශ්ශබ්ද බව දැක්වීම |  | Dotted Quaver Rest | මාත්‍රා ¾ක් නිශ්ශබ්ද බව දැක්වීමට පසුපසින් තිතක් තබනු ලැබේ. |

ප්‍රස්තාරයක යෙදෙන අයුරු.



Tie Mark ඇඳීමේ ලකුණ (පෙරදිග ප්‍රස්තාරයක කිසියම් මාත්‍රා සංඛ්‍යාවක් ඇදෙන තැනක දී එම මාත්‍රා සංඛ්‍යාවට අනුරූප ව කඩ ඉරි යොදනු ලැබේ. මාත්‍රා 4 ක් ඇදෙන්නේ නම් '' ස--- '' ආදි වශයෙනි. බටහිර
සංගීතයේ දී මෙවැනි මාත්‍රා සංඛ්‍යාවන් ඇදෙන බව දැක්වීමට වෙන වෙන ම සංකේත භාවිත කෙරේ. එවැනි අවස්ථාවක දී ඊළඟ විභාගයේ හෝ සංකේතයේ හෝ මාත්‍රා සංඛ්‍යාවක් එක් කරගැනීමට අවශ්‍ය නම් Tie ලකුණ යොදනු ලැබේ.)



**ක්‍රියාකාරකම 30**

# C,G,F, $B^b$ Scale

**නිපුණතාව 8.0** : සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත් දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි.

**නිපුණතා මට්ටම 8.1** : බටහිර සංගීත ප්‍රස්තාරකරණයේ කුසලතා ලබයි.

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :

'' ''

- ''ස්කේල'' යන්න පැහැදිලි කරයි.
- C, G, F, $B^b$ Major & Minor Scale 'ස්කේලවලට' අයත් ස්වර නම් කරයි.
- බටහිර ක්‍රමයට 'ස්කේල' රාශියක් ඇති බව පිළිගනියි.
- 'ස්කේල' බටහිර ක්‍රමයට ප්‍රස්තාර කිරීමේ කුසලතාව ලබයි.

**ගුණාත්මක යෙදවුම්**

- ඇමුණුමේ දක්වෙන වගුව ඇතුළත් දෘශ්‍ය උපකරණ
- ස්වර වාද්‍ය භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

C, G, F, $B^b$ Major & Minor Scale (ස්කේල) ආරෝහණ සහ අවරෝහණ වශයෙන් බටහිර ක්‍රමයට ලිවීම හුරු කිරීම මෙම පාඩමින් අපේක්ෂිත ය. පළමුවෙන් පෙරදිග ක්‍රමයට පෙරළා ලිවීමට හුරු කරන්න. පසුව Manuscript Book පොතේ එක් පිටුවක් පුරා ඇඳ හුරු වීමට යොමු කරවන්න. මේ සඳහා ඇමුණුමේ දක්වෙන වගුව භාවිත කළ හැකි ය.

**පාඩම සංවර්ධනය**

**පියවර 01 :**

- එක ම ගීතයක් තෝරා ගෙන එය C, G, F, B Flat, යන 'ස්කේලවලින්' වයා වෙනස පැහැදිලි කරමින් පාඩමට පිවිසෙන්න.

(මිනිත්තු 05)

**පියවර 02 :**

- C, G, F, $B^b$ Major 'ස්කේලයන්ට' අදාළ ස්වර ඇතුළත් දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කරන්න. ඇමුණුමේ දක්වෙන වගුව භාවිත කර සිසුන් සමඟ එක් එක් 'ස්කේලයට' අයත් ස්වර සාකච්ඡා කරන්න. Manuscript Book භාවිත කර එම ස්වර ආරෝහණ වශයෙන් ලිවීමට හුරු කරන්න.

(මිනිත්තු 30)

**පියවර 03 :**

- C,G,F, $B^b$ Minor 'ස්කේලයන්ට' අදාළ ස්වර ඇතුළත් දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කරන්න. ඇමුණුමේ දක්වෙන වගුව භාවිත කර සිසුන් සමඟ එක් එක් 'ස්කේලයට' අයත් ස්වර සාකච්ඡා කරන්න. Manuscript Book භාවිත කර එම ස්වර ආරෝහණ වශයෙන් ලිවීමට හුරු කරන්න.

(මිනිත්තු 35)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**


- අදාළ 'ස්කේල' ඇතුළත් කර බටහිර ප්‍රස්තාර කොටසක් සකස්කර අගයන්න.


(මිනිත්තු 10)

**පසු අභ්‍යාස** :

- නිදහස් කාලච්ඡේදවල දී 'ස්කේල' පරිවර්තනයට හුරු කිරීමට යොමු කරන්න.

අතිරේක උදවු :




## Major Scale

| C මේජර් ස්කේල් | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 |
| ස | | රි | | ග | ම | | ප | | ධ | | නි | ස |

| F මේජර් ස්කේල් | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 |
| ම | | ප | | ධ | නි | | ස | | රි | | ග | ම |

| G මේජර් ස්කේල් | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 |
| ප | | ධ | | නි | ස | | රි | | ග | | ම´ | ප |

| $B^b$ මේජර් ස්කේල් | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 |
| නි | | ස | | රි | ග | | ම | | ප | | ධ | නි |

## Minor Scale

| C මයිනර් ස්කේල් | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 |
| ස | | රි | ග | | ම | | ප | ධ | | නි | | ස |

| F මයිනර් ස්කේල් | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 |
| ම | | ප | ධ | | නි | | ස | රි | | ග | | ම |

| G මයිනර් ස්කේල් | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 |
| ප | | ධ | නි | | ස | | රි | ග | | ම | | ප |

| $B^b$ මේජර් ස්කේල් | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 |
| නි | | ස | රි | | ග | | ම | ම´ | | ධ | | නි |

**ක්‍රියාකාරකම 31**

# Key Signature

**නිපුණතාව 8.0** : සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත් දේශිය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි.

**නිපුණතා මට්ටම 8.1** : බටහිර සංගීත ප්‍රස්තාරකරණයේ කුසලතා ලබයි.

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :

- Key Signature යන්න පැහැදිලි කරයි.
- එක් එක් ස්කේලයන් හැඟවීමට Key Signature භාවිත කරන බව දැන ගනියි.
- එක ම ගීතයක් විවිධ ස්වර ශ්‍රැති කරගනිමින් ඉදිරිපත් කළ හැකි බව පිළිගනියි.
- බටහිර ප්‍රස්තාරයක Key Signature ලකුණු කිරීමේ කුසලතාව ලබයි.

**ගුණාත්මක යෙදවුම්**

- ඇමුණුමේ දැක්වෙන තොරතුරු ඇතුළත් කර සැකසූ දෘශ්‍ය උපකරණ
- ස්වර වාද්‍ය භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

බටහිර ස්වර ප්‍රස්තාරයක ස්කේලය හඟවන සංකේතය Key Signature නමින් හැඳින්වේ. මෙහි දී පසුගිය පාඩමින් අධ්‍යයනය කළ ස්කේලයන්ට අදාළ Key Signature පමණක් යොදා ගැනීම ප්‍රමාණවත් ය. එක් එක් ස්කේලය ට අනුව කෝමල ස්වර තීව්‍ර ස්වරය වෙනස් වන අයුරු පිළිබඳ ව මෙම ශ්‍රේණියෙ දී සංකීර්ණ නොවන සේ සිසුන්ට පහදා දෙන්න. පසුව Manuscript Book පොතේ ඇඳ හුරු වීමට යොමු කරන්න. මේ සඳහා ඇමුණුමේ දැක්වෙන තොරතුරු භාවිත කළ හැකි ය.

**පාඩම සංවර්ධනය**

**පියවර 01 :**

- ජාතික ගීතයේ කොටසක් හෝ වෙනත් ශුද්ධ ස්වර සහිත ගීතයක කොටසක් හෝ ''ස'' ස්වරය ශ්‍රැති කරගෙන සහ ''ම'' ස්වරය ශ්‍රැති කරගෙන වයා පෙන්වන්න. හැකි නම් සර්පිනාවේ ස්වර පුවරුව සිසුන්ට පෙනෙන සේ වයා පෙන්වන්න. ශුද්ධ මධ්‍යමය වෙනුවට කෝමල නිෂාදය එක්වන අයුරු පැහැදිලි කරන්න. ඒ අනුව මධ්‍යමය ශ්‍රැති කරගත් විට කෝමල නිෂාදය දිගින් දිගට ම එකතු වන බව පැහැදිලි කරන්න. ස්වර ප්‍රස්තාරයේ මධ්‍යමය යෙදෙන සැම තැනටම Flat Mark ලකුණ ලියනු වෙනුවට ප්‍රස්තාරයේ මුලින් ම මධ්‍යමයට හිමි රේඛා අතරත එය යොදන බව පහදා දෙන්න. එක් එක් ස්කේලයට අදාළ ස්වර එකිනෙක වෙනස් වන බව පහදා දෙන්න.

(මිනිත්තු 10)

**පියවර 02 :**

- Key Signature ඇතුළත් දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කරන්න. ඇමුණුමේ දැක්වෙන තොරතුරු සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10)

**පියවර 03 :**

- එක් එක් ස්කේලයට ගැළපෙන ලෙස ස්වර ගොඬ නැගීම පුහුණු කරන්න. Manuscript Book පොත භාවිත කර එම ස්කේලවලට අදාළ ව ස්වර ප්‍රස්තාර ලිවීමට හුරු කරන්න.

(මිනිත්තු 35)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**


- අදාළ ස්කේලවලට ගැළපෙන බටහිර ප්‍රස්තාර කොටසක් සකස් කර අගයන්න. (මිනිත්තු 15)


**පසු අභ්‍යාස :**


- නිදහස් කාලවල දී එක් එක් ස්කේලයට ගැළපෙන විවිධ ස්වර රටා ලිවීම ට හුරු වීමට යොමු කරවන්න.

අතිරේක උදවු. :

ඇමුණුම:-





**C Major** කිසි ම ලකුණක් නැත


**F Major** කෝමල නි යෙදේ


**G Major** තීව්‍ර ම් යෙදේ


**Bb Major** කෝමල නි සහ ග යෙදේ

**ක්‍රියාකාරකම 32**

# Time Signature

**නිපුණතාව 8.0** : සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත් දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි.

**නිපුණතා මට්ටම 8.1** : බටහිර සංගීත ප්‍රස්තාරකරණයේ කුසලතා ලබයි.

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :
- Time Signature යන්න පැහැදිලි කරයි.
- දාදරා, කෙහෙර්වා, බෙම්ටෝ යන තාලවලට අදාළ බටහිර තාල නම් කරයි.
- බටහිර ක්‍රමයට ද තාල රාශියක් ඇති බව පිළිගනියි.
- බටහිර ප්‍රස්තාරයක Time Signature ලකුණු කිරීමේ කුසලතාව ලබයි.

**ගුණාත්මක යෙදවුම්**
- ඇමුණුමේ දැක්වෙන වගුව ඇතුළත් දෘශ්‍ය උපකරණ
- ස්වර වාද්‍ය භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

බටහිර ස්වර ප්‍රස්තාරයක තාලය හඟවන සංකේතය Time Signature නමින් හැඳින්වේ. මෙහිදී දාදාරා, කෙහෙර්වා, බෙම්ටෝ, යන තාලවලට අදාළ Time Signature පමණක් යොදා ගැනීම ප්‍රමාණවත් ය. මෙම සංකේතය සංඛ්‍යා දෙකකින් සමන්විත වන බව පැහැදිලි කරන්න. යට සංඛ්‍යාවෙන් හා උඩ සංඛ්‍යාවෙන් හැඟවෙන Quality, Quantity යන තත්ත්වයන් පිළිබඳ ව මෙම ශ්‍රේණියේ දී සංකීර්ණ නොවන සේ සිසුන්ට පහදා දෙන්න. පසු ව Manuscript Book හි ඇඳ හුරු වීමට යොමු කරන්න. මේ සඳහා ඇමුණුමේ දැක්වෙන තොරතුරු භාවිත කළ හැකි ය.

**පාඩම සංවර්ධනය**

**පියවර 01 :**
- තාල දෙකකට අයත් ගී දෙකක් ගයා/වයා පාඩමට පිවිසෙන්න. එම තාල එකිනෙක වෙනස් වන බව පහදා දෙන්න

(මිනිත්තු 05)

**පියවර 02 :**
- Time Signature ඇතුළත් දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කරන්න. ඇමුණුමේ දැක්වෙන තොරතුරු සිසුන් සමඟ සාකච්ඡා කරන්න. Manuscript Book පොත භාවිත කර එම සංකේත ලිවීමට හුරු කරන්න.

(මිනිත්තු 30)

**පියවර 03 :**
- එක් එක් තාලයට ගැළපෙන ලෙස විවිධ ස්වර රටා ගොඩ නැගීම පුහුණු කරන්න. Manuscript Book භාවිත කර එම ස්වර රටා ලිවීමට හුරු කරන්න.

(මිනිත්තු 35)




**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- අදාළ තාලරූපයන්ට ගැළපෙන බටහිර ප්‍රස්තාර කොටසක් සකස්කර අගයන්න.

(මිනිත්තු 10)

**පසු අභ්‍යාස** :
- නිදහස් කාලච්ඡේදවල දී එක් එක් තාල රූපයට ගැළපෙන විවිධ ස්වර රටා ලිවීම ට හුරු වීමට යොමු කරවන්න.

**අතිරේක උදවු** :

ඉහතින් ඇති බටහිර ස්වර ප්‍රස්තාරය නැවත බලන්න. එහි ''කී සිග්නේචරය ට'' පසු ව ඉහළින් සහ පහළින් වශයෙන් අංක දෙකක් යෙදී ඇති අයුරු බලන්න. එය එම ප්‍රස්තාරයේ තාලය හඟවන සංකේතය යි. එය නම් කරනුයේ Time Signature යනුවෙනි. පහත දැක්වෙන වගුවෙන් සරල තාල කිහිපයක Time Signature හඳුනාගත හැකි වේ.

| Time Signature නම | සරල ප්‍රස්තාර කොටසක් | Time Signature සහිත බටහිර ප්‍රස්තාර ක්‍රමය |
|---|---|---|
| Four , Four Time | ස-ස-/ග-සග/ප-ගප/ස්-ස්-/ |  |
| Three , Four Time | පපග/මමරි /ගගස/රි/ |  |
| Two , Four Time | සරි/සරි/ප-/ප-/ |  |
| Six Eight Time | ගමප පප- / ගමප පප- / |  |

08.ඉහත වගුවේ දැක්වෙන සරල ප්‍රස්තාර කොටස් Time Signature සහිත ව ඔබ සපයා ගත් බටහිර ප්‍රස්තාර කඩදාසියේ ප්‍රස්තාර කරන්න.
එක් එක් තාල රූපවලට ගැළපෙන ස්වර රටා කිහිපයක් පහත දැක්වේ.



**ක්‍රියාකාරකම 33**

## නාට්‍ය ගීත

**නිපුණතාව 6.0** :- රංග සම්ප්‍රදායන් හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 6.1** :- නව නාට්‍ය ශෛලියේ ස්වභාවය සහ සංගීතය විමසයි.

**ක්‍රියාකාරකම** :- නාට්‍ය ගීත ගායනය

**කාලච්ඡේද** :- කාලඡේද 02 යි.

**ඉගෙනුම් පල** :-

- වත්මන් නාට්‍යයන්හි යෙදෙන නව නාට්‍ය ගීත පිළිබඳ ව විමසයි.
- එම ගීත ගායනයේ උනන්දු වේ.
- නාට්‍ය ගීත ගයයි.

**ගුණාත්මක යෙදවුම්**:-

- ලැයිස්තුවේ දක්වා ඇති නාට්‍ය ගීතයන්හි පද මාලා සහ ස්වර රචනා
- ස්වර පුවරු සංගීත භාණ්ඩයක්
- තාල වාද්‍ය භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :-

පාඩම සඳහා නියම කර ඇති ගීත ව්‍යවහාරයේ පැවතීම පාඩමේ සාර්ථකත්වයට හේතුවේ. මෙයට ප්‍රථම තූර්ති ගීත, නව නාට්‍ය ගීත ගායනා කර ඇති හෙයින් මෙම ගීත සිසුන් ලවා ගායනය කරවීම අපහසු කාරණයක් නොවනු ඇත. සංගීතය හදාරන සිසු-සිසුවියන්ට වත්මන් නාට්‍ය ගීත ගායනය සඳහා යොමු කර ගැනීමට මෙම පාඩම යොදා ගත හැකිය. පහත දැක්වෙන ලැයිස්තුවේ ගීත අතරින් තෝරා ගත් ගීත දෙකක් අවශ්‍ය පරිදි යොදා ගන්න. පෙර සූදානමකින් යුතු ව ස්වර පුවරුවක් යොදා ගනිමින් ගීත පුහුණු කරවන්න.

- **හුනුවටය** - හෙළ ගැඹුරුයි පුත නොබලන්
- **නරිබෑනා** - කුමටද සොබනියේ
- **තාරාවෝ ඉගිලෙති** - සෝබාව දේ/කඩේට පලයන් චූංචෑං
- **බෙරහඬ** - හනික වරෙව් කොල්ලනේ
- **නල දමයන්ති** - ඈත කඳුකර හිමව් අරණේ

**පාඩම සංවර්ධනය**:-

පියවර 01

- ඉහත ගීත ලැයිස්තුවෙන් ගුරුවරයාගේ අභිමතය පරිදි නාට්‍ය ගීතයක් තෝරා ගන්න.
- එම ගීතය ස්වර පුවරුවක ආධාරයෙන් ගායනය කර පෙන්වන්න.
- තෝරා ගත් එම ගීතය අයත් නාට්‍ය පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡාවක යෙදෙන්න.
- ගීත ලැයිස්තුවේ වෙනත් ගීත පිළිබඳ ව දන්නා සිසුන් විමසන්න

(මිනිත්තු 10)

පියවර 02

- ඔබ තෝරා ගත් දෙවන ගීතයේ පද මාලාව පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- එම ගීතය පේළියෙන් පේළිය ගයා පෙන්වමින් නිවැරදි නාද මාලාවට ගැයීමට සිසුන් පුහුණු කරන්න.
- ගීතයේ සියුම් රසවත් තැන් පිළිබඳ ව සිසුන් ප්‍රායෝගික ව හුරු කරවන්න.
- වාදන හැකියා ඇති සිසුන් වාදනයට හවුල් කරගෙන ගීතය සිසුන් සමඟ ගායනය කරන්න.

(මිනිත්තු 30)



පියවර 03

- පන්තියේ සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදන්න.
- කණ්ඩායම් වශයෙන් හෝ තනි තනි ව හෝ ගායනයට අවස්ථාව සලසන්න.
- ගීතය ප්‍රාසංගික ව ඉදිරිපත් කළ හැකි සිසුන්ට ඒ සඳහා අවස්ථාව දෙන්න.

(මිනිත්තු 30)

ඇගයීම හා තක්සේරුකරණයඃ-

- ගීතය රසවත් ව හා නිවැරදි ව ඉදිරිපත් කළ කණ්ඩායම ඉදිරියට ගෙන අගයන්න.
- ඒකල ව ගීතය ගැයූ සිසුන් පන්තිය ඉදිරියේ අගය කරන්න.

(මිනිත්තු 10)

අතිරේක උදවුඃ-

- අන්තර්ජාලය- You tube පිරික්සන්න.

**ක්‍රියාකාරකම 34**

## නාට්‍ය ගීත

**නිපුණතාව 6.0** :- රංග සම්ප්‍රදායන් හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 6.1** :- නව නාට්‍ය ශෛලියේ ස්වභාවය සහ සංගීතය විමසයි.

**ක්‍රියාකාරකම** :- නාට්‍ය ගීත ගායනය

**කාලච්ඡේද** :- 02 යි

**ඉගෙනුම් පල** :-

- වත්මන් නාට්‍යයන්හි යෙදෙන නව නාට්‍ය ගීත පිළිබඳ ව විමසයි.
- එම ගීත ගායනයේ උනන්දු වෙයි.
- නාට්‍ය ගීත ගයයි.

**ගුණාත්මක යෙදවුම්**:-

- ලැයිස්තුවේ දක්වා ඇති නාට්‍ය ගීතයන්හි පද මාලා සහ ස්වර රචනා,
- ස්වර පුවරු සංගීත භාණ්ඩයක්.
- තාල වාද්‍ය භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :-

මේ පාඩම සඳහා නියම කර ඇති මෙම ගීත ද, නිතර ම ව්‍යවහාරයේ පවතින ගීත වීම මේ පාඩමේ සාර්ථකත්වයට ඉවහල් වන්නකි. මෙයට ප්‍රථමයෙන් නූර්ති ගීත, නව නාට්‍ය ගීත ගායනා කර ඇති හෙයින් මෙම ගීත සිසුන් ලවා ගායනය කරවීම අපහසු කාරණයක් නොවනු ඇත. සංගීතය හදාරන සිසු-සිසුවියන්ට වත්මන් ගීත නාට්‍ය ගීත ගායනය සඳහා යොමු කර ගැනීමට මෙම පාඩම යොදා ගත හැකිය. පහත දක්වෙන ලැයිස්තුවේ ගීත අතරින් ඔබ තෝරා ගත් ගීත දෙකක් මේ සඳහා අවශ්‍ය ආකාරයට යොදා ගන්න. පෙර සූදානමකින් ස්වර පුවරුවක් යොදා ගනිමින් ගීත පුහුණු කරන්න.

- **දෙපානෝ** - තව තව කට මැත දොඩවා
- **පේමතෝ ජායති**- ඇදුරුතුමා වන්න මගේ

**පාඩම සංවර්ධනය**:-

**පියවර 01**

- ඉහත ගීත ලැයිස්තුවෙන් ගුරුවරයාට අභිමත නාට්‍ය ගීතයක් තෝරා ගන්න.
- එම ගීතය ස්වර පුවරුවක ආධාරයෙන් ගයා පෙන්වන්න.
- තෝරා ගත් එම ගීතය අයත් නාට්‍ය පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡාවක යෙදෙන්න.
- ගීත ලැයිස්තුවේ වෙනත් ගීත පිළිබඳ ව තොරතුරු දන්නා සිසුන් විමසන්න

(මිනිත්තු 10)

**පියවර 02**

- ඔබ තෝරා ගත් දෙවන ගීතයේ පද මාලාව පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- එම ගීතය පේළියෙන් පේළිය ගයා පෙන්වමින් නිවැරදි නාද මාලාවට ගැයීමට සිසුන් පුහුණු කරන්න.
- ගීතයේ සියුම් රසවත් තැන් පිළිබඳ ව සිසුන් ප්‍රායෝගික ව හුරු කරවන්න.
- වාදන හැකියා ඇති සිසුන් වාදනය සමඟ හවුල් කරගෙන ගීතය සිසුන් සමඟ ගායනය කරන්න.

(මිනිත්තු 30)

**පියවර 03**

- පන්තියේ සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදන්න.
- කණ්ඩායම් වශයෙන් හෝ තනි තනි ව හෝ ගායනයට අවස්ථාව සලසන්න.
- ගීතය ප්‍රාසංගික ව ඉදිරිපත් කළ හැකි සිසුන්ට ඒ සඳහා අවස්ථාව දෙන්න.

(මිනිත්තු 30)

.

ඇගයීම හා තක්සේරුකරණයඃ-

- ගීතය රසවත්ව හා නිවැරදි ව ඉදිරිපත් කළ කණ්ඩායම ඉදිරියට ගෙන අගයන්න.
- ඒකල ව ගීතය ගැයූ සිසුන් පන්තිය ඉදිරියේ අගය කරන්න.

(මිනිත්තු 10)

**අතිරේක උදවුඃ-**

- අන්තර්ජාලය You tube පිරික්සන්න.

**ක්‍රියාකාරකම 35**

## නූර්ති ගීත ගායනය/වාදනය කරයි

**නිපුණතාව 6.0** : රංග සම්ප්‍රදායන් හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 6.1** : නූර්ති ගී ගායනයේ කුසලතා ලබයි.

**ක්‍රියාකාරකම 2.1.1** : නූර්ති ගීතයක් ගායනය

**කාලච්ඡේද** : 01

**ඉගෙනුම් පල** :
- නූර්ති ගීතය අයත් නාට්‍ය නම් කරයි.
- නූර්ති ගීතවල තනු ආකර්ෂණීය බව පිළිගනියි.
- නූර්ති ගීතයක් ගායනය/වාදනය කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ඇමුණුම අංක 1 :- ආරන්ණේ ඉන්නා ගීතය ලියූ දෘශ්‍යාධාරය
- සර්පිනාවක්, තබ්ලා ජෝඩුවක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**
- නූර්ති ගීතයක් ගායනයට/වාදනයට පුහුණුවක් ලබා දීම මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ.
- එම ගීතය ශ්‍රවණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- එම ගීතයේ තනුව පිළිබඳ ව සිසුන් හා සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10)

පියවර 02
- තෝරාගත් ගීතය ඇතුළත් දෘශ්‍යාධාරය පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- සර්පිනාව වයමින් තෝරා ගත් ගීතය රසවත් ව ගායනය කර පෙන්වන්න.
- නාදමාලාව තහවුරු වන පරිදි ගීතය කොටසින් කොටස ගායනය කරමින් පුහුණු කරවන්න.

(මිනිත්තු 15)

පියවර 03

කණ්ඩායම් වශයෙන් ගායනය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 10)

**ඇගයීම් සහ තක්සේරුකරණය සඳහා උපදෙස් :-**
- නූර්ති ගීතය නිවැරදි ශ්‍රැතියට හා ලයට අනුගත ව නිවැරදි නාද මාලාවට ගැයූ සිසු-සිසුවියන් තෝරා අගයන්න.

(මිනිත්තු 05)

**පැවරුම**

නූර්ති ගීත ඇතුළත් පොත් පිංචක් සකස් කිරීමට උපදෙස් දෙන්න.

**ක්‍රියාකාරකම 37**

## කාෆි රාගයේ සර්ගම්

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම 1.1.1** : කාෆි රාගයේ සර්ගම්

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගෙනුම් පල** :
- සර්ගම් ගීතය අධ්‍යයනය කරයි.
- සර්ගම් ගීතය නිවැරදි ව ගායනය/වාදනය කරයි.
- සර්ගම් ගීතය මඟින් රාගයේ ස්වර වින්දනාත්මක ව හුරුවිය හැකි බව අවබෝධ කොටගෙන ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්**
- සර්පිනාව වාදනය කරන සිසුන්ගේ වාද්‍ය භාණ්ඩ
- සර්ගම් ගීතය ලියූ දෘශ්‍යාධාරය

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

කාෆි රාග අංග පිළිබඳ අවබෝධය ඇති කරමින් සර්ගම් ගීතය ගායනයට හුරු කරවීම අත්‍යවශ්‍ය ය. නිවැරදි ස්වර සාධනය පිළිබඳ ව ද අවධානය යොමු කරන්න. මීට පෙර සර්ගම් පාඩම්වල දී මෙන් මෙම පාඩමේ දී ද අවධානය යොමු කරන්න.

**පාඩම සංවර්ධනය :-**

පියවර 01
- ස්වර අභ්‍යාස පාඩමේ පුහුණුව පිරික්සමින් පාඩමට පිවිසෙන්න.
- සර්ගම් පුහුණු වීමෙන් රාග අංග අධ්‍යයනය කරමින් රාග ගායනය / වාදනය දියුණු කර ගත යුතු අයුරු පහදමින් සර්ගම් පුහුණුවේ වැදගත්කම සාකච්ඡා කරන්න.

(මිනිත්තු 05)

පියවර 02
- කාෆි සර්ගම් ගීතයේ ස්වර ප්‍රස්තාරය ප්‍රදර්ශනය කරන්න..
- අනුකරණාත්මක ක්‍රමවේදය ඇසුරින් ගායනය/වාදනය අනුව හුරු කරවන්න.

(මිනිත්තු 20)

පියවර 03
- තනි තනි ව ගැයීමට සලස්වා සදොස් තැන් නිදොස් කරන්න.
- සිසු කුසලතා අගයමින් දිරි ගන්වන්න.
- සර්ගම් ගීතය සටහන් පොතේ ලියා ගැනීමට සලස්වන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- නිවැරදි ගායනය හා රාග අංග පිළිබඳ දැනුම පිරික්සමින් අගයන්න.

(මිනිත්තු 05)

**අතිරේක උදවු :-**

නිදහස් කාලවල දී වැඩි දුර පුහුණුවට මඟ පෙන්වන්න.

ඇමුණුම 01

පසුගිය 11 පොතේ 17 පිටේ - කාෆි සර්ගමය ද , යොදා ගත හැකි ය.

**රාගය - කාෆි - සර්ගම් ගීතය**

**(ත්‍රිතාල් මධ්‍යලය)**

ස්ථායි

| 0 | | | | 3 | | | | × | | | | 2 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස | ස | රි | රි | ග | ග | ම | ම | ප | - | - | ම | ප | ධ | නි | ස් |
| නි | ධ | ප | ම | ග | ග | රි | රි | රි | ප | ම | ප | ම | ග | රි | ස |

අන්තරා

| 0 | | | | 3 | | | | × | | | | 2 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ම | ම | ප | ධ | නි | නි | ස් | - | රි̇ | ග̇ | රි̇ | ස් | නි | ධ | නි | - |
| ධ | ධ | ප | ප | ප | ධ | ප | ම | ප | - | - | ම | ප | ධ | නි | ස් |
| නි | ධ | ප | ම | ග | ග | රි | රි | රි | ප | ම | ප | ම | ග | රි | ස |

**රාගය - කාෆි සර්ගම් ගීත**

**තාලය (ඣප්තාල් (මධ්‍ය)**

ස්ථායි

| | | | |
|---|---|---|---|
| නි ධ ම | ප ග රි | ස රි ග | ම ප - |
| ප ධ ම | ප ස් නි | ධ ප ම | ග රි ස |

අන්තරා

| | | | |
|---|---|---|---|
| ප ධ ම | ප ධ නි | ස් රි̇ ග̇ | රි̇ ස් - |
| ධ නි ස් | රි̇ ග̇ රි̇ | ස් රි̇ නි | ධ ප - |
| ප ධ ම | ප ස් නි | ධ ප ම | ප ග රි |
| ස ස රි | රි ග ග | ම ම ප | ධ ම ප |

**ක්‍රියාකාරකම 38**

## කාෆි රාගයේ මධ්‍යලය ගීතය

**නිපුණතාව 3.0** :- සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** :- ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම 1.1.1** :- කාෆි රාගයේ මධ්‍ය ලය ගීතය

**කාලච්ඡේද** :- 02

**ඉගෙනුම් පල** :-

- කාෆි රාගය ගන්ධාරය හා නිෂාදය කෝමලව යෙදෙන සම්පූර්ණ ජාති රාගයක් බව වටහා ගනියි.
- කාෆි රාගයේ මධ්‍ය ලය ගීත ගැයීමට කැමැත්ත ප්‍රකාශ කරයි.
- මධ්‍ය ලය ගීතය නිවැරදි ව ගායනය කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- සර්පිනාවක්, ගීතය ලියූ දෘශ්‍යාධාරයක්, වයන සිසුන්ගේ වාද්‍ය භාණ්ඩ

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

ඛ්‍යාල් ගායන ශෛලිය පිළිබඳ ව අවබෝධයක් ලැබෙන සේ ඉගැන්වීම සංවිධානය කරගත යුතු ය. මෙයින් අදහස් වනුයේ ඛ්‍යාල් පිළිබඳ වූ ලිඛිත විස්තර නොව, ඛ්‍යාල් ගීත ගායනය/වාදනය සිදුවන ආකාරය සිසුනට අවබෝධ කරවීම ය.

ඛ්‍යාල් ගීතය උගන්වන අතරතුර එම ගීතයේ ඇතුළත් රාග අංග පිළිබඳ ව සිසු අවධානයට යොමු කරන්න.

**පාඩම සංවර්ධනය :-**

පියවර 01

- කෝමල ග, නි, යෙදෙන සරල ගීත කොටසක් ගායනය කරමින් පාඩමට පිවිසෙන්න.

(මිනිත්තු 05)

පියවර 02

- ඉගැන්වීමට අපේක්ෂිත මධ්‍ය ලය ගීතයේ ගීත ස්වර ප්‍රස්තාරය ප්‍රදර්ශනය කර රසවත් ව ඉදිරිපත් කරන්න.
- කොටසින් කොටස පාදයෙන් පාදය ගායනය හුරු කරවන්න.
- දෙවනු ව ස්වර ප්‍රස්තාරය ද ගායනයට හුරු කරවන්න.

(මිනිත්තු 40)

පියවර 03

- කණ්ඩායම් වශයෙන් ගායනය කරවා සදොස් තැන් නිදොස් කරන්න.
- ඒකල ව ගායනයට සලසා අගයමින් අභිප්‍රේරණය කරන්න.

(මිනිත්තු 20)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- ස්වර තාල රාග යන කරුණු පිළිබඳ ව මැනෙන අයුරින් ඇගයීම සකසා ගන්න.

(මිනිත්තු 10)

**අතිරේක උදවු :-** අන්තර්ජාලයේ ඇතුළත් ගායන/වාදන පරිශීලනය.

**ඇමුණුම 01**

පසුගිය 8 පොතේ 31 - 32 පිටුවල කාෆි රාගයේ ගීතය ද මේ සඳහා යොදා ගත හැකි ය.

රාගය - කාෆි - තාලය ත්‍රිතාල් (මධ්‍යලය)

ස්ථායි

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 0 | | | | 3 | | | | × | | | | 2 | | ස | නි̲ |
| | | | | | | | | | | | | | | ර | හි |
| ස | රි | - | ග̲ | ම | ම | ප | - | ධ | ප | ම | ග̲ | රි | ස | රි | නි̲ |
| හෙ | කෙ | ऽ | සෙ | බි | ජු | රී | ऽ | ච | ම | ක | බ | ම | ක | ර | හි |
| ස | රි | - | ග | ම | ම | ප | - | | | | | | | | |
| හෙ | කෙ | ऽ | සෙ | බි | ජු | රී | ऽ | | | | | | | | |

අන්තරා

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 0 | | | | 3 | | | | × | | | | 2 | | | |
| ම | ම | ම | ප | නි | නි | නි | නි | ස්̇ | ස්̇ | රි̇ | නි | ස්̇ | - | ස්̇ | - |
| ග | ර | ජ | ග | ර | ජ | බා | දල් | බ | ර | ස | න | ලා | ऽ | ගේ | ऽ |
| ප | රි̇ | ස්̇ | රි̇ | නි | ස්̇ | නි̲ | ධ | නි̲ | ධ | නි̲ | ප | ධ | ප | ම | ග̲ |
| ක | ද | ර | ක | ර | ත | මො | රා | ජී | යා | ධ | ක | ධ | ත | ර | හි |
| ම | රි | - | ග̲ | ම | ම | ප | - | | | | | | | | |
| හෙ | කෙ | ऽ | සෙ | බි | ජු | රී | ऽ | | | | | | | | |

නිර්දේශිත ගීතඃ-

- සැපරිසි දී නෙක
- සඳවති හිනහෙනවා.
- ප්‍රභූ තෙරිදයා හෙ අපා
- සඳරැස් ගලා යේ බොහෝ සේ
- චංඩො චංඩෝ චෙලා මෝරි හෙයා
- සුරපති කන්ද කුමාර ස්වාමි.
- අහසේ මිණි බැබළේ

**ක්‍රියාකාරකම 39**

## කාෆි රාගයට අයත් රාගාංග ඇතුළත් කෙටි ස්වර ඛණ්ඩ ගායනය

**නිපුණතාව 3.0** :- සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** :- ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම 1.1.1** :- කාෆි රාගයට අයත් රාගාංග අයත් කෙටි ස්වර ඛණ්ඩ ගායනය

**කාලච්ඡේද** :- 01

**ඉගෙනුම් ල** :-

- රාගයක් යනු ස්වර සංගති කිහිපයක එකතුවක් බව අවබෝධ කර ගනියි.
- රාගාංග ශ්‍රවණය වීමෙන් රාග හඳුනා ගැනීමේ හැකියාව ලබයි.
- කෙටි ස්වර ඛණ්ඩ ගායනය/වාදනය කරයි.
- රාග අධ්‍යයනයේ ප්‍රධාන කාර්යය සංගති අවබෝධ කර ගැනීමෙන් ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- සර්පිනාව, රාගාංග ලියූ දෘශ්‍යාධාරයක්

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

රාගයක් අධ්‍යයනය කිරීම යනු ඊට අයත් ස්වර සංගති අවබෝධ කොට ගෙන ගායනය/වාදනය කිරීම ය. රාග ආලාප, ඛ්‍යාල් ගායනය තානාලංකාර වැනි සියලු දේ සිදුවනුයේ සංගති ඇසුරෙනි. එහෙයින් මෙම පාඩම පිළිබඳ ව ඔබගේ දැඩි අවධානය යොමු කරමින් ඉගැන්වීමේ කටයුතු සිදු කිරීම වඩාත් ප්‍රතිඵලදායක ය.

සිසුන් ගායනය/වාදනය කරනවාත් සමග ම ඔබ විසින් එම ඛණ්ඩ අකාරයෙන් ගැයීමේ දී එහි ස්වර හඳුනා ගැනීමේ හැකියාව ද වර්ධනය කළ හැකි ය. ඇමුණුම 01 ඇසුරින් දෘශ්‍යාධාරය ගොඩ නගා ගන්න.

**පාඩම සංවර්ධනය :-**

පියවර 01

- කාෆි රාගයේ සර්ගම් ගීතය රසවත් ව ඉදිරිපත් කරන්න. එහි ඇති විශේෂ ස්වර ඛණ්ඩ වෙන ම ගයා වයා පෙන්වන්න. ඒවා රාග සංගති බව සාකච්ඡා කරන්න.
- රාගයක ස්වර සංගති හඳුනා ගැනීමෙන් ඇති ප්‍රයෝජනය පිළිබඳ ව පහදමින් පිවිසෙන්න.

(මිනිත්තු 05)

පියවර 02

- රාගාංග ලියූ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න.
- එහි සඳහන් ස්වර ඛණ්ඩ ගායනයට හුරු කරවන්න.
- නැවත නැවත ගායනයට/ වාදනයට හුරු කරවන්න.
- ඔබ අ කාරයෙන් ගයා එහි ස්වර හඳුනා ගැනීමට සලස්වන්න.

(මිනිත්තු 20)

පියවර 03

- ස්වර ඛණ්ඩ කිහිපයක් අ කාරයෙන් ගයා ස්වර හඳුනා ගැනීමට යොමු කරන්න.

- පෙර පුහුණු වූ ස්වර ඛණ්ඩ තනි තනි ව ගායනයට/වාදනයට සලස්වා සදොස් තැන් නිදොස් කරන්න.
- පොතේ සටහන් තබාගැනීමට උපදෙස් දෙන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- කැමති ස්වර ඛණ්ඩයක් ගායනය/වාදනය කරවා අගයන්න.

(මිනිත්තු 10)

**අතිරේක උදවු :-**

තෝරාගත් ස්වර ඛණ්ඩවල තාලානුකූල ස්වර පාද කිහිපයක් නිර්මාණය කරවා ඒවා ගයා වයා පෙන්වන්න.

**ඇමුණුම 01**

(1) ස රි ගු රි, රි ගු රි ම ගු රි

(2) ස රි ගු, ස , රි ප,

(3) ධ̣ නි̣ ස රි ගු - --රි, ප - මප ගු - රි ---,

(4) රි නි ධ නි ප ධ ම ප, ම ග ( ශුද්ධ ග ) ම ප ම ---- , ගුරි සගු රි ම ගු,

මෙහි ශුද්ධ ගන්ධාරය විවාදී ස්වරයකි. එය යෙදෙන අයුරු සිසුනට අවබෝධ කරවන්න.

(5) රිගු රිගු -, සරි සරි -, නි̣ නි̣ ස රි ස -

(6) ස රි ගු, මප, ප ධ, ම ප ගු - රි -

(7) ම ප නි ධ ප, ධමප, ගු - රි -

(8) ම ප නි - --- ( ශුද්ධ නි ) ස -

ශුද්ධ නි ස්වරය ද විවාදී ස්වරයකි. එය යෙදෙන අයුරු සිසුනට අවබෝධ කරවන්න.

**ක්‍රියාකාරකම 40**

## කාෆි රාගයට අයත් ලක්ෂණ ගීත ගායනය කරමින් රාග ලක්ෂණ විමසීම

**නිපුණතාව 3.0** :- සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** :- ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම 1.1.1** :- කාෆි රාගයට අයත් ලක්ෂණ ගීත ගායනය කරමින් රාග ලක්ෂණ විමසීම

**කාලච්ඡේද** :- 02

**ඉගෙනුම් පල** :-

- ලක්ෂණ ගීත පිළිබඳ ව දැන ගනියි.
- ලක්ෂණ ගීත ගායනය කරයි.
- රාග විස්තර ඉගෙනගත හැකි සරල හා වින්දනාත්මක මඟ ලක්ෂණ ගී බව අවබෝධ කරගෙන පවසයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- සර්පිනාවක්, ලක්ෂණ ගී ලියූ දෘශ්‍යාධාරයක්

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

ලක්ෂණ ගීත යනු කුමක් ද යන්න පළමු වාරය තුළ දී අධ්‍යයනය කොට තිබේ. ලක්ෂණ ගීතයක් ඇසුරින් රාග ලක්ෂණ ඉගෙන ගැනීමට සිසුන් පෙලඹවීම අපේක්ෂිත ය.

ගීතය ගායනයට පුහුණු වන අතරතුර රාග ලක්ෂණ මතු කරමින් සාකච්ඡා කළ යුතු ය. එමෙන් ම එහි නාද මාලාවේ ඇතුළත් ස්වර සංගති පිළිබඳ ව ද සිසු අවධානය යොමු කරන්න.

**පාඩම සංවර්ධනය :-**

පියවර 01
- නිර්මාණාත්මක ප්‍රවේශයකින් පාඩමට පිවිසෙන්න.
- ලක්ෂණ ගීතයේ වැදගත්කම පිළිබඳ ව සාකච්ඡා කරන්න.

(මිනිත්තු 05)

පියවර 02
- දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කොට ලක්ෂණ ගීතය ගායනයට/වාදනයට හුරු කරවන්න.
- ගයන/වයන අතර රාගයේ ලක්ෂණ හා රාග අංග ප්‍රායෝගික ව මතු කර දක්වන්න.

(මිනිත්තු 40)

පියවර 03
- තනි තනි ව ගයවා/වයවා සදොස් තැන් නිදොස් කරන්න.
- වාචික ප්‍රශ්න මඟින් රාග විස්තර පිළිබඳ ව මතකය පිරික්සන්න.

(මිනිත්තු 20)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- ගායන කුසලතාව හා රාග විස්තර පිළිබඳ ව අවබෝධය මැනෙන සේ ඇගයීම සිදු කරන්න.

(මිනිත්තු 10)

**අතිරේක උදවු :-**

ගීතයේ ඇතුළත් රාග ලක්ෂණ වාක්‍ය ලෙස සටහන් පොතේ ගොඩ නංවන්න.

**ඇමුණුම 01**

**පසුගිය 11 පොතේ 21 පිටේ කාෆි රාගයේ ලක්ෂණ ගීත යොදාගන්න.**

**රාගය - කාෆි. ලක්ෂණ ගීත ත්‍රිතාල් (මධ්‍ය ලය)**

ස්ථායි

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 0 | | | | 3 | | | | × | | | | 2 | | | |
| ස | ස | රි | රි | ග | රි | ස | රි | ප | මප | ධ | ප | මග | - | රි | ගරි |
| සැ | ම | ප්‍රි | ය | ක | ර | නා | S | ඉ | මීS | හි | රි | කා | S | Sෆි | SS |
| රි | ම | ප | ධ | ම | ප | ග | රි | රි | ග | රි | ම | ග | රි | ස | ස |
| රා | S | ග | යෙ | ජා | S | ති | ය | පූ | S | ර | ණ | වෙ | S | නි | ති |
| ධ | නි | රි | - | රිග | මග | රිස | රි | රි | නි | ධ | නි | ධ | ප | මග | රිග |
| සු | ගැ | යේ | S | රාS | SS | ත්‍රිS | S | ම | S | ධ්‍යා | ම | යා | S | මේS | SS |

අන්තරා

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 0 | | | | 3 | | | | × | | | | 2 | | | |
| ප | - | ප | ම | පධ | නිධ | ප | ධ | නි | - | ස් | රි් | ග් | රි් | ස් | - |
| ප | ං | ච | ම | වාS | SS | දී | S | සා | S | ස | ං | වා | S | දී | S |
| නි | ධ | ස් | රි | ග් | ග් | රි | රි | ස් | රි් | ග් | ම් | ග් | රි් | ස් | ස් |
| කා | S | ෆි | S | මේ | S | ල | යෙ | උ | ප | දි | න | මෙ | හි | නි | ති |
| ග | රි් | නි | ස් | නි | ධ | ප | ම | ප | ම | ප | ධ | ම | ප | ග | රි |
| ග | S | නී | S | කෝ | S | ම | ල | සෙ | සු | ස්වු | ර | ශු | ද් | ධ | ය |
| රි | ප | ම | - | ග | රි | ස | රි | සරි | ගම | පධ | නිස | නිධ | පම | ගරි | ස- |
| නැ | ග | යේ | S | බැ | ස | යේ | S | සරි | ගම | පධ | නිස | නිධ | පම | ගරි | ස- |

මෙම ගීත ද යොදා ගත හැකි ය.

- රාගය කාෆි වේය සුමධුර
- ගුනි ගාවත කාෆි රාග (හින්දි)

**ක්‍රියාකාරකම 41**

## ජන ගී ආශ්‍රිත සරල ගී

**නිපුණතාව 3.0** :- සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසිකත්වයන් ළඟා කර ගැනීමට හුරු වෙයි.

**නිපුණතා මට්ටම 3.1** :- ජන සංගීතය ආශ්‍රයයෙන් නිර්මාණය කළ ගීත විමසයි.

**කාලච්ඡේද** :- 02

**ඉගෙනුම් පල** :-

- ජන ගී තනු ආශ්‍රිත ව නිර්මාණය වූ සරල ගීත නම් කරයි.
- ජන ගී තනු ආශ්‍රිත ව නිර්මාණය වූ සරල ගීත අගය කරයි.
- ජන ගී තනු ආශ්‍රිත ව නිර්මාණය වූ සරල ගීත ගායනය කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- ගීත තුන ලියූ දෘශ්‍යාධාර
- සර්පිනාව, තබ්ලාව, වයලීනය, බටනළාව

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

ඇමුණුම I හි ඇතුළත් ඉගැන්වීමට යෝජිත ගීත තුන පිළිබඳ ව වෙන් වෙන් ව කෙටි විස්තරයක් කරන්න.

- දෑතට වළලු - නීලා වික්‍රමසිංහ සමඟ ටී එම් ජයරත්න.

  සංගීත නිර්මාණය - සී. ද එස්. කුලතිලක
- වන්නම් සවුදම් ගායන - ලයනල් රන්වල
- මල්සරා බැල්ම හෙලා - රෝහණ බැද්දගේ

ගීත ගායනය ඉගැන්වීමේ දී රාගධාරී සංගීතයේ මෙන් කොටසින් කොටස පාදයෙන් පාදය ඉගැන්වීමක් අපේක්ෂා නොකෙර්. ගීතය රසවත් ව ගායනය/වාදනය කර ශ්‍රවණය කිරීමට සලසා සිසුන් සමඟ ගායනයේ යෙදෙන්න. ගායනය අතරතුර රසාස්වාදනයේ යෙදන්න. අවශ්‍ය විෂය කරුණු මතු කරන්න.

- ''දෑතට වළලු ගීතය ට'' සී. ද එස්. කුලතිලක පද රචනය හා තනු නිර්මාණය කර ඇත. මුලින්ම මේ ගීතය ගායනා කරන ලද්දේ ටී. එම්. ජයරත්න සමග නීලා වික්‍රමසිංහ විසිනි. පසු ව නීලා වික්‍රමසිංහ තනි ව ගායනා කළාය. ගීතය නිර්මාණය සඳහා පාදක වී ඇත්තේ නෙළුම් ගීතයි. උදා :- තෙල් ගාලා හිස පීරන් නෑනෝ... මේ බව සිසුන්ට පහදා දෙන්න.
- ලයනල් රන්වල සූරීන්ගේ ''වන්නම් සවුදම් ගායන'' ගීතයේ පද රචනය කර ඇත්තේ ආචාර්ය අජන්තා රණසිංහ ය. තනුව නිර්මාණය ලයනල් රන්වලයන්ගෙනි. මෙම ගීතය නිර්මාණය සඳහා පාදක වී ඇත්තේ මොනරාගල දිස්ත්‍රික්කයේ එන ''ඇඹුන් කවි'' (ඇඹීමේ කවි) නාද මාලාව ය.
- රෝහණ බැද්දගේ ''මල්සරා බැල්ම හෙළා'' ගීතයේ පදරචනය හා තනුව නිර්මාණය කර ඇත. ජනකවි කිහිපයක් පදනම් කරගෙන

නිර්මාණය වූ සරල ගීතයකි. ගීතයට පාදක වූ රිද්මය පහතරට සම්ප්‍රදායයේ එන ''දෝංතකට'' යන රබන් පදයේ පෙරළුම් පදයේ තාල රූපයයි. අත් රබන් ශාන්තිකර්මයන්හි එන තොවිල් කවි, කවි නාඩගම්, මල්වාරම් ගීවල විරිත හා තිසරා වන්නම ද නිර්මාණය සඳහා දායක වී ඇත. ක්‍රියාකාරකම සැලසුම් කිරීමේ දී මෙම කරුණු ගැන අවධානය යොමු කරමින් ගීත ඉගැන්වීම අපේක්ෂා කෙරේ.

**පාඩම සංවර්ධනය :-**

පියවර 01

- ජන සංගීතය පාදක කරගෙන නිර්මාණය වූ වෙනත් සරල ගීතයක් ගායනය කරමින් පාඩමට ප්‍රවේශ වන්න.
- ගීතය ශ්‍රවණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් සමඟ සාකච්ඡාවක් මෙහෙයවන්න.

(මිනිත්තු 10)

පියවර 02

- ඉගැන්වීමට යෝජිත ගීත තුනෙන් එක් එක් ගීත ප්‍රදර්ශනය කරමින් ගායනය කරන්න.
- ගීතය පිළිබඳ ව කෙටි සාකච්ඡාවක් කරන්න.
- නාද මාලාව තහවුරු වන තෙක් සිසුන් සමඟ ගායනය කරන්න.
- දෙවන ගීතය ඉගැන්වීමට ඉහත ක්‍රමය ම අනුගමනය කරන්න.

(මිනිත්තු 30)

පියවර 03

- තුන්වන ගීතය ද ඉගැන්වීමට ඉහත ක්‍රමයම අනුගමනය කරන්න.
- විවිධ ක්‍රම ශිල්ප යොදා ගනිමින් ගායනය කරවන්න. (කණ්ඩායම් වශයෙන්, කණ්ඩායම් මාරු කරමින්, කේවල ව ආදි වශයෙන්)
- ගීත තුන ම කණ්ඩායම් වශයෙන්, මාරු කරමින් ගායනය කරවන්න.
- කණ්ඩායම් වශයෙන් ගීත තුන ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- කේවල ව ගායනයට ද අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 35)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- නිවැරැදි ශ්‍රැතිය, ස්වර හා තාලය අනුව මිහිරි ව ගායනය කළ සිසුන් කණ්ඩායම් වශයෙන් හෝ කේවල ව හෝ අගයන්න.

(මිනිත්තු 05)

**පැවරුම** :-

නිදහස් කාලච්ඡේදයන්හි ජන සංගීතය ආශ්‍රයෙන් නිර්මාණ වූ පහත දක්වෙන සරල ගීත ශ්‍රවණයට හා ගායනයට යොමු කරන්න.

- රැක් අත්තන මල මුදුනේ. - ගායනය නන්දා මාලිනී. (උකුසා වන්නම ආශ්‍රිත)
- සැඳෑ කළුවර කුරගගා විත් - ගායනය නන්දා මාලිනී. (කුවේණි අස්න ආශ්‍රිත)
- තෙල්ගාලා හිස පීරන් නෑනෝ - ගායනය සුනිල් සාන්ත (නෙළුම් කවි ආශ්‍රිත)
- කඳුළු හෙළා නැඹිලියට සහල් ගරන අම්මා - දීපිකා ප්‍රියදර්ශනී (රනේ රුව සෙ මව)

**ගීත අංක 01**

දෑතට වළලු මල් මුතුවැල් මාල පොටයි
යායට එළලූ පුන් කුසුමන් සේ බැබළෙයි
ගී රස කනලූ වන් සැණෙකින් මන් පිනවයි
ලාලිත රුසිරු සුන්දර සන්සුන් ගමනයි

උදයට පේළිය සෑදිලා
එන හැටි රූබර අඟනෝ
කරවට ගෝමර මල් පිපිලා
ළැම පිට පවලම් පලඳා

බඳේ වැටෙන හිරු තාපය නොදනෙ ද
ළඳේ නුඹට තුරු සෙවණැලි උරණ ද

දෑතට....

හිසවට සේලය දවටාලා
ඉණවට ඔසරිය ඇඳලා
කුඹුරට සීරුවෙ බැසලා
තරගෙට සීපද රැව්දීලා

අගේ වඩන රුසිරෙන් සැදි නෙළුමට
රඟේ බලන් සැරසෙන සැටි කදිමට

**පද රචනය හා තනුව - සී. ද එස්. කුලතිලක**
**ගායනය - නීලා වික්‍රමසිංහ**
**මුල් ගායනය - ටී.එම්. ජයරත්න**
**නීලා වික්‍රමසිංහ**

**ගීත අංක 02**

වන්නම් සවුදම් ගායන සූරිය මණ්ඩල සේමා
ගයමුව යාළුව මා හා

ඉහලු ගමින් කෝ - හොයි - වරෙල්ලා - වරෙල්ලා යාළුවනේ
පේරුස් මුදුවේ - හොයි - වළල්ලා - වළල්ලා දිස්නෙ නගෝ

මහාබඹා මැවූ රන් පබාවතී ළඳ දෝ//

වන්නම් රන්..........

කනට දෙමික්කන් - පයට පදක්කම් මං දෙඥ්ඤාං//
ආලවන්තයා මං පහක් දියං නංගෝ//

වන්නම්....

නැගෙනහිරට රන් කරල් නැමෙන්නේ පිනට නුඹේ//
ආලවන්තයා මං - පහක් දියං නගෝ//

**පද රචනය : අජන්තා රණසිංහ**

**තනු නිර්මාණය : ලයනල් රන්වල**

**ගීත අංක 03**

මල්සරා බැල්ම හෙළා - මගේ හිතට කොඳුරනවා
රන්මලී දැක්ක ගමන් මල් වාරම් කියවෙනවා
හිත බැන්ද සෙනේ මම් පවසන්නෙම් ද කොයි ලෙසින්
රන්මලී....

තිස්සෙ ම ගම සුවඳ කරන් පිපුණා කිණිහිරිය මලී
විස්තර දුටුව ද බඹරුනි පිපිලා දොඹ මුතු කැකුළී
ලස්සණ හුරු බුහුටිකමට දිලෙනා දැතින් ළකලී
ඉස්සර කළ පිනට මගේ පිපුණා බල ළඳ කොමලී

ලස්සණ ගුණ කනක බරණ සවන් පැළඳි පුල්ලිමලී
ඇස් නිලුපුල් පෙති ගෝමර ගෙලවට දිලි රුවන්මලී
කොස් උයනේ මගේ පැලට එළිය දෙන්ට පිපුණු මලී
වැස්ස ළඟ යි බක් මාසේ මා සනසාපන් කොමළී

**පද රචනය හා තනු නිර්මාණය - රෝහණ බැද්දගේ**

**ක්‍රියාකාරකම 42**

## වන්නම්, ප්‍රශස්ති සහ හටන් ගී පිළිබඳ සංස්කෘතික තොරතුරු

**නිපුණතාව 4.0** :- දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින්, සංස්කෘතික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම 4.1** :- මහනුවර යුගය හා සම්බන්ධ ගී පිළිබඳ විචාරාත්මක අදහස් දක්වමින් ගායනය කරයි.

**ක්‍රියාකාරකම 4.1** :- වන්නම්, ප්‍රශස්ති සහ හටන් ගී පිළිබඳ සංස්කෘතික තොරතුරු

**කාලච්ඡේද** :- 02

**ඉගෙනුම් පල** :-

- සේ ගී වශයෙන් සැලකෙන වන්නම්, ප්‍රශස්ති, හටන් ගී නිර්වචනය කරයි.
- වන්නම් වල, ප්‍රශස්ති වල හා හටන් ගීවල සංස්කෘතික පසුබිම අගය කරයි.
- වන්නම් වල, ප්‍රශස්ති වල හා හටන් ගීවල බස, රිද්මය, ගී තනු හා සුවිශේෂ ලක්ෂණ සොයා ගනියි.

**ගුණාත්මක යෙදවුම් :-**

- කියවීම් පත්‍රිකාවේ පිටපත්
- කාර්ය පත්‍රිකාවේ පිටපත්
- සර්පිනාවක්

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

මහනුවර යුගය සංස්කෘතික වශයෙන් වෙනස්කම් රාශියකට භාජනය වූ යුගයක් ලෙස හැඳින්විය හැකිය. රජවාසලේ කවිකාර කේන්ද්‍ර කොටගෙන වන්නම්, ප්‍රශස්ති, හටන් යන ගී වර්ග බිහිවූ බව පෙනේ. සිසුන් ක්‍රියාකාරකමෙහි යෙදවීම සඳහා පහත දැක්වෙන ශීර්ෂ අනුව කියවීම් පත්‍රිකාවක් ඔබ විසින් සකස් කර ගන්න.

- වන්නම්, ප්‍රශස්ති, හටන් යන්න නිර්වචනය කිරීම.
- ගීත වර්ගයන්ගේ ආරම්භය හා අවසානය.
- කවිකාර මඩුවෙහි සම්බන්ධය හා ව්‍යාප්තිය.
- බිහි වූ ග්‍රන්ථ
- භාවිත කළ සංගීත භාණ්ඩ
- ලබා ඇති සංගීත ආභාසය
- නාදමාලා, පදමාලා, භාෂාව හා රිද්මය
- ගීත වර්ගවල සුවිශේෂ ලක්ෂණ

**පාඩම සංවර්ධනය :-**

පියවර 01

- වන්නම්, ප්‍රශස්ති, හටන් යන වර්ගවලින් ගීත 3 ක් ගුරුවරයා ගායනය කර සිසුන්ට ශ්‍රවණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඒ පිළිබඳ ව කෙටි සාකච්ඡාවක් මෙහෙයවන්න.

(මිනිත්තු 10)

පියවර 02

- කියවීම් පත්‍රිකා පිටපත් සිසුන්ට ලබා දෙන්න.
- කියවීම් පත්‍රිකාවේ ඇතුළත් තොරතුරු සාකච්ඡා කරන්න.
- ගවේෂණ පත්‍රිකාවේ පිටපත් ලබා දී කණ්ඩායමක් වශයෙන් ක්‍රියාකාරකමේ යොදවන්න.

(මිනිත්තු 30)

පියවර 03

- කියවීම් පත්‍රිකා අනුව ගවේෂණ පත්‍රිකාවේ ඇතුළත් තොරතුරු ආකෘතිය සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න.
- කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- නිවැරදි ව පිළිතුරු සැපයූ සිසුන් තෝරා ඇගයීමක් කරන්න.

(මිනිත්තු 10)

**පැවරුම :-**

වන්නම් වල, ප්‍රශස්ති වල, හටන් ගීවල ස්වභාවය හා සුවිශේෂ ලක්ෂණ පිළිබඳ ව අභ්‍යාස පොතේ සටහනක් ගොඩනැඟීමට යොමු කරන්න.

**ගවේෂණ පත්‍රිකා තොරතුරු ආකෘතිය**

| අදාළ ශීර්ෂ | වන්නම් | ප්‍රශස්ති | හටන් |
|---|---|---|---|
| ගීත වර්ග සඳහා නිර්වචනයක් | | | |
| ආරම්භය හා ව්‍යාප්තිය | | | |
| සංගීතඥයන්ගේ දායකත්වය | | | |
| ගීත ගායනා කළ ස්ථානය | | | |
| දායක වූ සංගීත ආභාසය | | | |
| භාවිත කළ සංගීත භාණ්ඩ | | | |
| නිර්මාණය වූ ග්‍රන්ථ | | | |
| ගීත වර්ගවල සුවිශේෂ ලක්ෂණ | 1.<br>2.<br>3.<br>4.<br>5. | 1.<br>2.<br>3.<br>4.<br>5. | 1.<br>2.<br>3.<br>4.<br>5. |

ක්‍රියාකාරකම 43

## උකුසා වන්නම ගායනය

**නිපුණතාව 3.0** :- දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින්, සංස්කෘතික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම 4.1** :- මහනුවර යුගය හා සම්බන්ධ ගී පිළිබඳ විචාරාත්මක අදහස් දක්වමින් ගායනය කරයි.

**ක්‍රියාකාරකම 3.1** :- උකුසා වන්නම ගායනය

**කාලච්ඡේද** :- 02

**ඉගෙනුම් පල** :-

- උකුසා වන්නමේ විශේෂ ලක්ෂණ හඳුනා ගනිමින් විස්තර කරයි.
- විශේෂ අවස්ථාවන්හි දී ප්‍රසංගාත්මක ව නර්තනය සමඟ ගායනය කිරීමට කැමැත්ත පළ කරයි.
- උකුසා වන්නම ගායනය කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- ඇමුණුම අංක 01 හි ඇතුළත් විශාරද නන්දා මාලිනියගේ රුක් අත්තන මල මුදුනේ ගීතය ලියන ලද දෘශ්‍ය උපකරණය
- උකුසා වන්නම ලියන ලද දෘශ්‍ය උපකරණය
- සර්පිනාව, ගැටබෙරය, තාලම්පොට

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

ජන සංගීතයේ ආභාසය ලබමින්, සරල ගීවල තනු නිර්මාණය වී ඇති බව ප්‍රායෝගික ව පැහැදිලි කර දී, උකුසා වන්නම ගායනය කිරීමට ඉගැන්වීම මින් අපේක්ෂා කෙරේ.

**පාඩම සංවර්ධනය :-**

පියවර 01

- විශාරද නන්දා මාලිනියගේ රුක් අත්තන මල මුදුනේ ගීතය ගායනය කර ශ්‍රවණයට සලස්වන්න.
- එම ගීතයේ තනුව පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡාවක් මෙහෙයවන්න.

(මිනිත්තු 10)

පියවර 02

- උකුසා වන්නම ලියූ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න.
- උකුසා වන්නමේ තානම ගායනය කර සිසුන්ට ශ්‍රවණයට සලස්වන්න.
- තානම ගැයීම පුහුණු කරන්න. .
- තානමේ නාද මාලාව තහවුරු වන තෙක් කිහි පවරක් ගායනය කරවන්න.
- තානමේ ස්වර ප්‍රස්තාරය ද ගායනය කර පෙන්වන්න.
- තානමේ නාද මාලාව අනුව කවි ගායනය කිරීමට අවස්ථාව ලබාදෙමින් නාද මාලාව තහවුරු වන තෙක් විවිධ ක්‍රම ශිල්ප යොදා ගනිමින් ගායනය පුහුණු කරවන්න.

(මිනිත්තු 30)

පියවර 03

- කේවල ව හා සාමූහික ව උකුසා වන්නම ස්වර ප්‍රස්තාරය සමඟ ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- උකුසා වන්නමේ තානම හා කවිය ශ්‍රැතිය ස්වර හා තිත පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව ගායනය කළ සිසුන් අගයන්න.

(මිනිත්තු 10)

**පැවරුම :-**

- උකුසා වන්නමේ තානම සහ කවි ප්‍රස්තාර කිරීමට යොමු කරන්න.

**අතිරේක උදවු :-** 2010 8 ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශය (පිටු අංක 109-110)

හෙළ ගී මඟ - ඩබ්.බී.මකුලොලුව -

මුදියන්සේ දිසානායක- සිංහල නර්තන කලාව

## උකුසා වන්නම

තානම- තානා තනෙන තනම් //
තානත් තනෙනත් තම්දෙන තානත් //
තානා තනෙන තනම්

කවිය- මෝරා බීජයෙනා //
කලපත් දෙකඩත් කරසාත් තුටුවෙත් //
දෙන්නා අදර තොසා

නෑරා තටු පතිනා //
ලෙලවත් සොලවත් පියඹත් නදදෙත් //
යන්නා පවන රැසා

සාරා බොජුනයෙනා //
අයිරන් පෙතියොත් තුඩගත් බුදිසිත් //
පැන්නා එජල රැසා

බේරා ඉසිහු දූනා //
පවසත් මෙපවත් දූනසත් ලොවටත් //
වන්නා නම් උකුසා

බෙර පදය :- | දොදොම් දො | මිත දොම් | දොම්කිත | කිතදොම් |

**ක්‍රියාකාරකම 44**

## ප්‍රශස්ති සහ හටන් ගී ගායනය

**නිපුණතාව 3.0** :- දේශීය ජන සංගීතය පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම** :- මහනුවර යුගය හා සම්බන්ධ ගී පිළිබඳ විචාරාත්මක අදහස් දක්වමින් ගායනය කරයි.

**කාලච්ඡේද** :- 02

**ඉගෙනුම් පල** :-

- ප්‍රශස්ති වල හා හටන් ගීවල විශේෂ ලක්ෂණ වෙන් වෙන්ව විස්තර කරයි.
- ප්‍රශස්ති හා හටන් ගී ගායනය කිරීමට යෝජනා කරයි.
- ප්‍රශස්ති හා හටන් ගී ගායනය කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- ඇමුණුම අංක (1) ලක්ෂ්මී බුජවාසා ගීතය ලියූ දෘශ්‍යාධාරය
- ඇමුණුම අංක (2) නොමඳින් විකුම් පාලා ගීතය ලියූ දෘශ්‍යාධාරය
- සර්පිනා, ගැටබෙරය, තම්මැට්ටම, තාලම්පොට

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

ප්‍රශස්ති ගීයක් හා හටන් ගීයක් ගායනය කිරීමට ඉගැන්වීම මෙම ක්‍රියාකාරකමින් අපේක්ෂා කෙරේ. මහනුවර යුගයේ ප්‍රචලිත වූ ගීත විශේෂ දෙකක් බවත්, රජවාසල ආශ්‍රිත ව බිහිවූ බව, කර්ණාටක සංගීතාභාසය, අලංකාර තනු රටා ආදි තොරතුරු මෙම පාඩම සමඟ සාකච්ඡා කිරීම ඵලදායී වේ. පහත දැක්වෙන ගීත මේ සඳහා නිර්දේශිත ය.

- ප්‍රශස්ති ගීත - ලක්ෂ්මී බුජවාසා
- හටන් ගී - නොමඳින් විකුම් පාලා

ගීත වර්ග දෙක අතර බස, නාද මාලාව, නිර්මාණය වූ යුගය සහ ප්‍රාසංගික බව ආදි කරුණු පිළිබඳ අවධානය යොමු වන අයුරින් පාඩම සංවර්ධනය කරන අතරතුර සිසුන් සමඟ සංවාදයේ යෙදීම ඉතාමත් ම සුදුසු ය.

**පාඩම සංවර්ධනය :-** 8 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ පිටු අංක 115 සිට 121 දක්වා ඇති පිටුවල විෂය කරුණු ද මේ සඳහා එක් කර ගත හැකි ය.

පියවර 01

- එඩ්වඩ් ජයකොඩි ගයන ''තෙදිනි විරාජ'' ගීතය ශ්‍රව්‍ය තැටි වාදනයකින් හෝ ගුරුවරයාගේ ගායනයෙන් හෝ වාදනයෙන් හෝ සිසුන්ට ශ්‍රවණයට සලස්වන්න. එම ගීතයේ නාද රටාවේ ආභාසය සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- නිර්දේශිත ප්‍රශස්ති ගීතය ගයා වයා පෙන්වන්න.

(මිනිත්තු 10)

පියවර 02

- 'ලක්ෂ්මී බුජවාසා' ගීතය ලියූ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න.
- ගීතය ගායනා කර පෙන්වන්න.

- පාද වශයෙන් ගීතයේ පදමාලාව ගායනය කරවන්න.

(මිනිත්තු 30)

පියවර 03

- 'නොමඳින් විකුම් පාලා' ගීතය ලියූ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න.
- ගීතය ගායනා කර, සිසුන්ට ශ්‍රවණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සුදුසු ශිල්පක්‍රමයක් යොදා ගනිමින් ගායනය හුරු කරවන්න.
- කණ්ඩායම් වශයෙන් නැවත නැවත ගායනයට යොමු කරන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

කණ්ඩායම් වශයෙන් හෝ ඒකල ව හෝ සිසුන් යොදා ගනිමින් ගීත වර්ග දෙක ම ගායනයට සලස්වා සිසුන් අගයන්න.

(මිනිත්තු 10)

**පැවරුම :-**

ප්‍රශස්ති හා හටන් ගීත එකතුවක් කරමින් එම ගීත වර්ග දෙක පිළිබඳ සමාන-අසමානතා පෙළ ගසන්න.

**ප්‍රශස්ති ගීතය**

ලක්ෂ්මී බුජවාසා - සතතු ජය
වීර විජය ලක්ෂ්මී ශිවකාමී
නෑර බාහු ශිඛරය විසු ප්‍රේමී
සාරවතිත ගරු වචනැති සෝමී
වීර නරේන්ද්‍ර සිංහ ස්වාමී

සත්‍ය වචන හරිස්චන්ද්‍රව තාරා
නිත්‍ය ලෝල සංගීත සුබෝජා
මත්ත වීර හරි හතවර තේජා
පෘථිවි පාල කුල බන්දු සරෝජා

ශෘංගාධර සුර නිවසේ මුහුදා
තුංගා කර දස දිග සුවිබෝධා
ශෘංගානේ නව නාට්‍ය විනෝදා
ලංකාපති වර රාජ වරෝජා

මන්දයි ප්‍රතිකාල් ද්‍රවිඩ ලන්දේසි
බන් එජටා ලාඩය සන්නාසී
නන් දෙස වල මේ භාෂා විශේෂී
පින්වත් අප හිමි දූන නෙක විලසී

**හටන් ගීතය**

(1) නොමඳින් වික්‍රම් පාලා - සැදෙමින් යුදට ජය ලන්දෙසින්

සමඟින් එජනරාලා

සමිඳුන්ගෙ භූමිපාලා - සියසේ අතින් මියෙමින් ගියෝ

යුදයෙන් ඇනුම් කාලා

(2) පන්නා එලන්දේසී - වන්නා මෙලෙස පෙන්නා බලය

පන්නාලීය සීසි

ගෙන්නාල ඉංග්‍රීසී - දන්නා ඔවුන් ගෙන්නා බැඳල

සෙන්නා අයට දාසී

(3) දුරලා සතුරු වියවුල් - කරලා දිගඹු බබළා වැජඹී

නිමලා එකින් එක දුල්

ලකළා මෙ අප මිහිපල් - සකලා සිරිත් විකලා නොකර

වැඩලා නැසී වියවුල්

**ක්‍රියාකාරකම 45**

## පංචතූර්ය වාදනය දවුල, තම්මැට්ටම, ගැටබෙරය, පහතරට බෙරය, උඩැක්කිය යන අවනද්ධ භාණ්ඩ හඳුනා ගැනීම

**නිපුණතාව 4.0** :- දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින්, සංස්කෘතික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම 4.1** :- දේශීය අවනද්ධ වාද්‍ය භාණ්ඩවල විශේෂතා සාකච්ඡා කරමින් අගය කරයි.

**කාලච්ඡේද** :- 03

**ඉගෙනුම් පල** :-

- පංචතූර්ය වාදනය හා ඊට අයත් වන භාණ්ඩ හඳුන්වා දෙයි.
- සංගීත විෂයයේ දී යොදා ගත හැකි අවනද්ධ භාණ්ඩ පිළිබඳ දැනගැනීමට කැමැත්ත පළ කරයි.
- පංචතූර්ය වාදනය පිළිබඳ තොරතුරු වගු ගත කරයි.
- සංගීතයට ගැළපෙන අයුරින් භාණ්ඩ වාදනයට හුරු වෙයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- පංචතූර්ය වාදන භාණ්ඩවල පින්තූර ඇතුළත් දෘශ්‍යාධාරයක් .
- දවුල, තම්මැට්ටම, ගැටබෙරය, යක්බෙරය යන භාණ්ඩවල කොටස් නම් කර සැකසූ දෘශ්‍යාධාරයක්.
- වාද්‍ය භාණ්ඩවල තොරතුරු ඇතුළත් කියවීම් පත්‍රිකා
- ඇමුණුම අංක I වගු සටහනේ ඡායා පිටපත්.

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

දේශීය භාණ්ඩ වර්ගීකරණය අනුව පංචතූර්ය වාදනය ආතත, විතත, විතතාතත, ඝන, ශුෂිර වශයෙන් කොටස් පහකට වර්ග කළ හැකි බවත්, ඒවාට උදාහරණ දක්වමින්, ක්‍රියාකාරකම සැලසුම් කරගන්න. ගැටබෙරය, පහතරට බෙරය, දවුල, තම්මැට්ටම පිළිබඳ ව තොරතුරු දැනගැනීමට පහත දැක්වෙන ශීර්ෂ ඔස්සේ කියවීම් පත්‍රිකා සකස් කරන්න.

- භාණ්ඩ සකස් කර ඇති දැව වර්ග
- පංචතූර්ය වාදන භාණ්ඩ වර්ගීකරණය අනුව ගැටබෙරය, පහතරට බෙරය, දවුල, තම්මැට්ටම යන භාණ්ඩ වර්ග වන අයුරු.
- වාද්‍ය භාණ්ඩයන්හි රූප සටහන් හා ඒවායේ කොටස් නම් කිරීම.
- මෙම වාද්‍ය භාණ්ඩ යොදා ගන්නා විශේෂ අවස්ථා
- එක් එක් වාද්‍ය භාණ්ඩයන්ගේ විශේෂතා.

කියවීම් පත්‍රිකා සකස් කිරීමේ දී 2010 - 9 ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශයේ 84 පිටුවේ සිට 90 තෙක් පිටුවල ඇති විස්තර පාදක කර ගත හැකි ය.

**පාඩම සංවර්ධනය :-**

පියවර 01

- අනුරාධපුර යුගයේ දී පංචතූර්ය වාදනය භාවිත වූ අයුරු රසවත් කතාවක් ලෙස ඉදිරිපත් කරන්න.
- භාණ්ඩ ඇතුළත් දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කරන්න. එම භාණ්ඩ පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10)

පියවර 02

- දෘශ්‍ය උපකරණයේ ඇතුළත් සංගීත භාණ්ඩවල දළ රූප සටහන් සිසු අභ්‍යාස පොතේ ඇඳ, කොටස් නම් කිරීමට යොමු කරන්න.

(මිනිත්තු 30)

- කියවීම් පත්‍රිකා අධ්‍යයනය කර, ඇමුණුම අංක (01) වගුවට අදාළ තොරතුරු සම්පූර්ණ කිරීමට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 40)

පියවර 03

- සිසු අභ්‍යාස පොතේ අඳින ලද පංචතූර්ය වාදන භාණ්ඩවල පින්තූර හා තොරතුරු ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 10)

- කියවීම් පත්‍රිකාවට අදාළ ව සම්පූර්ණ කළ වගු සටහන ඉදිරිපත් කිරීමට සිසුනට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 20)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- අදාළ තොරතුරු ඉදිරිපත් කිරීම් අගය කරන්න.

(මිනිත්තු 10)

**පැවරුම :-**

ගැටබෙරය, පහතරට බෙරය, දවුල, තම්මැට්ටම යන අවනද්ධ වාද්‍ය භාණ්ඩවල රූප සටහන් ඇඳ කොටස් නම් කිරීමට පවරන්න. ඉහත භාණ්ඩ යුගල වශයෙන් ගෙන සම-විෂමතා ලිවීමට පවරන්න

**ඇමුණුම අංක 01**

| අවනද්ධ වාද්‍ය භාණ්ඩ | අයත් වන නර්තන සම්ප්‍රදායය | භාණ්ඩය සකස් කර ඇති දැව වර්ග | වාද්‍ය භාණ්ඩය අයත් වන භාණ්ඩ වර්ගීකරණය | වාද්‍ය භාණ්ඩය යොදාගන්නා අවස්ථා | වාද්‍ය භාණ්ඩයේ සුවිශේෂ ලක්ෂණ |
|---|---|---|---|---|---|
| ගැටබෙරය | | | | | |
| පහතරට | | | | | |
| උඩැක්කිය | | | | | |
| දවුල | | | | | |
| තම්මැට්ටම | | | | | |

**ක්‍රියාකාරකම 46**

# I have a Dream (ABBA) යන ගීතය ගායනය

**නිපුණතාව 5.0** :- සරල සංගීතය හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබති.

**නිපුණතා මට්ටම 5.1** :- ඉංග්‍රීසි බසින් රචිත ගීතයක් ගායනය.

**කාලච්ඡේද** :- 02

**ඉගෙනුම් පල** :-

- ඉංග්‍රීසි ගීතයක පද හා තේරුම පවසයි.
- ඉංග්‍රීසි ගීතයක් රස විඳියි.
- ඉංග්‍රීසි ගීතයක් ගායනයේ හුරුව ලබයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- I have a dream ගීතයේ පිටපතක් හා වාදන යන්ත්‍රයක්.
- ගීතයේ පද මාලාව දෘශ්‍යාධාරයක්

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

මෙම ගීතය ලෝක ප්‍රසිද්ධ ABBA සංගීත කණ්ඩායම ගැයූ ගීයකි. එය මෙම සංගීත කණ්ඩායමේ හයවැනි ඇල්බමයේ එන ගීයකි. 1979 දෙසැම්බර් මස දී එළිදැක්විණි. Benny Andersson සහ Bjorn Ulvacus විසින් රචනා කරන ලදි. 1999 දී Westlife සංගීත කණ්ඩායම විසින් මෙම ගීතයේ cover version එකක් එළිදක්වන ලදි. අවුරුදු 20කට පසුවත් එය ද ලොව පුරා ඉතා ජනප්‍රිය විය.



**පාඩම සංවර්ධනය :-**

පියවර 01

- ABBA සංගීත කණ්ඩායමේ I have a dream ගීතය සිසුන්ට ශ්‍රවණයට සලස්වන්න.
- එම ගීතය පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- මෙම සංගීත කණ්ඩායම හා ගීතය පිළිබඳ විස්තර ඉදිරිපත් කරන්න.

(මිනිත්තු 10 )

පියවර 02

- ගීතය ලියා ගත් දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න.
- නැවත වරක් ගීතය ශ්‍රවණයට සලස්වන්න.
- ඔබ මෙම ගීතය ගායනය කරමින් සිසුන් ගායනයේ හුරු කරවන්න.

(මිනිත්තු 30 )

- ගීතයේ අදහස සිසුනට පවසන්න.
- එම ගීතයේ තේරුම පිළිබඳ ව සිසුන්ගේ අදහස් විමසන්න.
- නැවත නැවත සිසුන් ගායනයේ පොලඹවන්න.

(මිනිත්තු 20)

පියවර 03

- ගීතයේ අදහසට ගැළපෙන අයුරින් මුහුණේ ඉරියවු මතුකරමින් බටහිර ගීතයක උච්චාරණ ස්වරූපය අනුව මුඛය හසුරුවමින් , හා හඬ පාලනය කරමින් කණ්ඩායම් වශයෙන් ප්‍රාසංගික ස්වරූපයෙන් සිසුන් ගායනයට යොමු කරන්න. (මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- තනි තනි ව ගායනා කරවා ඇගයීම් කරන්න.

(මිනිත්තු 10)

**පැවරුම :-**

තව තවත් ඉංග්‍රීසි ගීත රසවිඳිමින් පදමාලා එකතු කිරීමට යොමු කරන්න.

දෘශ්‍යාධාරය (1)

I have a dream

I have a dream, a song to sing
To help me cope with anything
If you see the wonder - of a fairy tale
You can take the future - even if you fail
I believe in angels
Somthing good in everyting I see
I believe in angels, when I know the
time is right for me
I'll cross the stream, I have a dream

I have a dream, a fantasy
To help me through reality
And my destination makes
it worth the while
Pushing through the darkness still
another mile
I believe in angelsSomthing good in everyting I see
I believe in angels, when I know the
time is right for me
I'll cross the stream, I have a dream
To help me copewith anything
If you see the wonder - of a fairy tale
You can take the future - even if you fail

**මගෙ සිහිනය (මට සිහිනයක් තියෙනවා)**
මට හීනයක් තියෙනවා, එක ගීයක් ගයන්න
ඔබට සුරංගනා කතාවක ආශ්චර්යය බලන්න නම්,
මට මෙය සාර්ථක ව කිරීමට උදවු වන්න
මගේ අනාගතය සාර්ථක වන්නත් පුළුවන් නැති වන්නත් පුළුවන්
මා සුරංගනාවන් විශ්වාස කරනවා
මා දකින සෑම දෙයකින් ම මොනවා හරි හොඳක් තියෙනවා
මා දන්නවා මට හරියන කාලය මොකක් ද කියලා
ඒ කාලයේ දී මේ මගේ සිහිනය නමැති
කුණාටුව තරණය කරනවා
මට මනඃකල්පිත හීනයක් තියෙනවා
එය මට උදවු කරනවා මගේ ගමනාන්තය යථාර්ථයක් කිරීමට
මා දිරිමත් කරන්න අඳුර හරහා ඉදිරි
සැතපුම තරණය කිරීමට

ක්‍රියාකාරකම 47

## මයික්‍රෆෝනය ඇම්ප්ලිෆයරය, බෆල් මික්සර්

**නිපුණතාව** :- සංගීතයේ තාක්ෂණික මෙවලම් සහ භෞතික විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර ප්‍රශංසාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි.

**නිපුණතා මට්ටම** :- සංගීත ප්‍රසංගයක අත්‍යවශ්‍ය තාක්ෂණික මෙවලම් හසුරුවන ආකාරය පිළිබඳ සොයා බලයි.

**කාලච්ඡේද** :- 04

**ඉගෙනුම් පල** :-

- සංගීත ප්‍රසංගයක දී යොදා ගන්නා අත්‍යවශ්‍ය තාක්ෂණික මෙවලම් කිහිපයක් පිළිබඳ විස්තර කරයි.
- තාක්ෂණික මෙවලම් ක්‍රියාකාරිත්වය පැහැදිලි කරයි.
- පාසලේ පවත්වන සංගීත ප්‍රසංගයක ගුණාත්මක බව රඳවා ගැනීමට තාක්‍ෂණික උපකරණ බලපාන බව පිළිගනියි.
- තාක්ෂණික මෙවලම් පිළිබඳ නිවැරදි භාවිත හුරුව ලබයි.

**ගුණාත්මක යෙදවුම්** :-

- තාක්ෂණික මෙවලම්වල රූප සටහන් ඇතුළත් පත්‍රිකාව
- මයික්‍රෆෝනයක් හා අදාළ උපකරණ (පාසලේ උපකරණ කට්ටලයක් ඇත්නම් ඒවා භාවිත කිරීමෙන් පාඩම සජීව කර ගත හැකි ය.)

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස්** :-

කලාව හා තාක්ෂණය යනු වෙන් කළ නොහැකි දෙයකි. සංගීතයටත් තාක්ෂණය හා සබඳතාව එසේ ම ය. ඕනෑ ම සංගීත කෘතියක් එළිදක්වීමට තාක්ෂණය අවශ්‍ය ම ය. පටිගත කිරීම්වල දී ද සජීව ඉදිරිපත් කිරීමක දී ද තාක්ෂණය එක සේ වැදගත් වේ. විශේෂයෙන් ම සජීව ප්‍රසංගයක දී තාක්ෂණය හා සම්බන්ධ මූලික දැනුම නිර්මාණකරුවකුට නැතහොත් සංගීත ශිල්පියකුට අත්‍යවශ්‍ය වේ. තම සංගීත නිර්මාණයේ ස්වභාවය එයයි. ශ්‍රාවකයා වෙත මුදාහැරීම යන අංග දෙක ම පිළිබඳ ව මනා දැනුමක් අවශ්‍ය වේ. කෙතරම් ඉහළ නිර්මාණ අගයක් ඇතිව සකස් කළත්, පාසලක පැවැත්වෙන සංගීත ප්‍රසංගයක ගුණාත්මක බව අඩු කරලීමට තාක්‍ෂණික උපකරණ ඌණතාව විශාල වශයෙන් බලපායි. උපකරණ පිළිබඳ ව සංගීත ගුරු භවතුන් දැනගෙන තිබීමෙන් තම ප්‍රසංගය සාර්ථක ව ඉටු කරගැනීමට තාක්‍ෂණික ශිල්පියා නිවැරදි ව හසුරුවා ගැනීමට හැකි වනු ඇත. සංගීත ප්‍රසංගයක දී භාවිත වන තාක්ෂණික මෙවලම් රාශියක් එයින් දැනගත යුතු අත්‍යවශ්‍ය ම මෙවලම් කීපයක් ගැන සාකච්ඡා කිරීම මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ. මෙවලම් හඳුනා ගැනීම, ඒවායේ ස්වභාවය, ඒවායේ භාවිතය හා ගුණාත්මක තාක්ෂණය යන කරුණු පිළිබඳ ව මෙහි දී සාකච්ඡා කෙරේ.

**පාඩම සංවර්ධනය** :-

පියවර 01

- සංගීත ප්‍රසංගයක භාවිත වන විවිධ විද්‍යුත් උපකරණ සිසුන්ගෙන් විමසන්න. ඒවා කළුලෑල්ලේ ලියමින් පාඩමට පිවිසෙන්න.

(මිනිත්තු 10)

පියවර 02

- ඇමුණුම 01හි සඳහන් තාක්ෂණික මෙවලම් ලැයිස්තුව හා පින්තූර සටහන ද ප්‍රදර්ශනය කරන්න. දළ රූපසටහන් ඇඳීමට යොමු කරන්න. අත්‍යවශ්‍ය කොටස් හා කෙවෙණි නම් කරන්න.

(මිනිත්තු 30)

- සපයා ගත හැකි නම් මින් එකක් හෝ කිහිපයක් හෝ සිසුන් අතට දී ඒවා නිරීක්ෂණය කිරීමට අවස්ථාව දෙන්න.

(මිනිත්තු 80)

පියවර 03

- ඇමුණුම 01හි සඳහන් පින්තූර සටහන් ඡායා පිටපත් කර ගෙන වෙන් කර කපා ගන්න. ඒවා එකිනෙක නිවැරදි ව සම්බන්ධ කරන අයුරු ක්‍රියාකාරකමක් මඟින් පැහැදිලි කරන්න. (පාසලේ මෙම උපකරණ කට්ටල ඇත්නම් ඒවා භාර ගුරුවරයා සමඟ එකිනෙක කොටස් අමුණන්න. වැරදියට ඇමිණීමෙන් ඇති වන හානි සාකච්ඡා කරන්න.)
- ඇමුණුම 02හි සඳහන් තොරතුරු අදාළ වන උපකරණය එම තොරතුරු ඉදිරියෙන් ලියා දක්වන්න.

(කාලච්ඡේද 02)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- එක් එක් උපකරණය පිළිබඳ ව තොරතුරු ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

**පැවරුම :-**

සජීව සංගීත ප්‍රසංගයක් පැවැත්වෙන අවස්ථාවක් හෝ වීඩියෝවක් හෝ නරඹා එහි ඇති තාක්ෂණික උපකරණ පිළිබඳ ලැයිස්තුවක් පිළියෙළ කරන්න.

**ඇමුණුම අංක 01**

සංගීත ප්‍රසංගයක දී භාවිත වන තාක්ෂණික මෙවලම්

**මික්සර්**





**බෆල්**



**ඇම්පිලිෆයර්**



**මයික්‍රෆෝන්**

**ක්‍රියාකාරකම 48**

## වාර්ෂික විවිධ ප්‍රසංගය

**නිපුණතාව 3.0** : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන වාදන හා ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 3.2** : ලබා ගත් සංගීතමය අත්දැකීම් ප්‍රාසංගික ව ඉදිරිපත් කරමින් සතුට ලබයි.

**කාලච්ඡේද** : 06

**ගුණාත්මක යෙදවුම්:**

- එක් එක් ප්‍රසංග අංකයට ගැළපෙන ලෙස සකස් කර ගත් ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ
- වාද්‍ය භාණ්ඩ

**ඉගෙනුම් පල:**

- ප්‍රාසංගික අත්දැකීම් ලබමින් සතුටු වෙයි.
- සංගීත විෂයය ඉගෙනීමෙන් තෘප්තිමත් වෙයි.
- වේදිකාව පරිහරණය පිළිබඳ අත්දැකීම් ලබයි.
- විවිධ පෞරුෂ ගුණාංග වර්ධනය කර ගනියි.
- ගායන වාදන තනි ව ඉදිරිපත් කිරීමට පෙලඹෙයි.
- මෙතෙක් උගත් ගායන වාදන හැකියා ප්‍රාසංගික ව ප්‍රදර්ශනය කරයි.
- ඉදිරිපත් වීම, සංවිධානය හා මෙහෙයවීම වැනි ගුණාංග ප්‍රගුණ කරයි.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

පාසල් වේදිකාවේ ප්‍රාසංගික අවස්ථාවකට සහභාගි වීමට සිසුහු කැමැත්තක් දක්වති. එයින් ඔවුන් තුළ පෞරුෂ ගුණාංග රාශියක් වර්ධනය වනු ඇත. එබැවින් සැම විට ම විශේෂ තෝරා ගැනීමක් නොකර සියලු ම සිසුන්ට ද සහභාගි වීමට අවස්ථාව ලැබෙන පරිදි පාසල් විවිධ ප්‍රසංගය සැලසුම් කර ගැනීම ගුරුවරයාගේ වගකීමකි. පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ සටහනට ගැළපෙන ලෙස කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස ලකුණු පිරිනැමීමක් ද කළ හැකි ය. මෙහි දී මහා පරිමාණයේ විවිධ ප්‍රසංගයක් පැවැත්වීම ම අරමුණු කර නැත. එබැවින් පහත දැක්වෙන කරුණු ඔබට මේ සඳහා උපකාර වනු ඇත.

- මෙතෙක් 09 වන ශ්‍රේණිය තෙක් පෙරදිග සංගීතය විෂය නිර්දේශයෙහි උගත් ක්‍රියාකාරකම් ඇසුරෙන් විවිධ ප්‍රසංගයට සුදුසු ප්‍රසංග අංක පුහුණු කළ හැකි ය.

- ශ්‍රේණි මට්ටමින් වෙන වෙන ම විවිධ ප්‍රසංගය පැවැත්වීම හෝ සියලු පන්ති සහභාගි කර ගනිමින් එක් විවිධ ප්‍රසංගයක් පාසල තුළ පැවැත්වීම.

- වේදිකාවේ ප්‍රාසංගික අත්දැකීම් ලැබෙන පරිදි අවම වශයෙන් පාසල් නිල ඇඳුමෙන් හෝ ගායන, වාදන, රංගන අයිතමවලට සිසුන්ට ඉදිරිපත් වීමට අවස්ථාව ලබාදීම.

- කාලය, ඉඩකඩ, පහසුකම් ප්‍රමාණවත් පරිදි වර්ෂය තුළ ලබාගත නොහැකි වූයේ නම් පාසල තුළ ඉඩකඩ ඇති ස්ථානයක අනෙක් ගුරු භවතුන් සහ දෙමාපියන් ඉදිරියේ කේවල සහ සාමූහික ප්‍රසංග ලෙස කෙටි සන්දර්ශනයක් පවත්වා සිසුන් අගය කිරීම සහ ධෛර්යවත් කිරීම කළ හැකි ය. සුදුසු පරිදි ළමයින් ප්‍රාසංගික අත්දැකීම් ලබන අයුරින් මෙම විවිධ ප්‍රසංගය සැලසුම් කිරීමට උත්සාහ කරන්න.

- කාලච්ඡේද 6ක් යනු සති දෙකක කාලයකි. සිසුන් පන්ති කාමරයේ දී උගත් සංගීතමය ප්‍රායෝගික අංග ඇසුරින් කිසියම් තේමාවකට ගැළපෙන ලෙස කණ්ඩායම් වශයෙන් හෝ ඒකල ව හෝ වේදිකාවේ රඟ දැක්වීමට සුදුසු ගායන, වාදන, නාට්‍ය, අංග පුහුණු කර ගැනීමටත්, විවිධ ප්‍රසංගය සැලසුම් කිරීමටත් මෙම කාලච්ඡේද 06 යොදා ගැනේ. වැඩි පිරිසක් යොදා ගැනීම වඩාත් සුදුසු ය. පහත දැක්වෙන කරුණු පිළිබඳ ව ගුරුවරයා සැලකිලිමත් විය යුතු වේ.

- 6 ශ්‍රේණියේ සිට 09 ශ්‍රේණිය තෙක් සියලු ම පන්ති එක් දිනක දී යොදා ගන්නේ නම් උපරිම අන්දමින් පැ දෙක හමාරක පමණ කාලයකට ගැළපෙන ලෙස ප්‍රසංගය සඳහා ප්‍රසංග අංක ලැයිස්තුවක් පිළියෙල කිරීමට සිසුන් දායක කර ගැනීම.

- එක් එක් ශ්‍රේණිවල සිසුන්ට වැඩ බෙදා දීම.

- පොදු වාදක මණ්ඩලයක් සෑම ප්‍රසංග අංකයක් සඳහා ම යොදා ගැනීම හා ගුරුභවතුන්ගේ සහාය ලබා ගැනීම.

- පන්ති කාමරයේ අධ්‍යයනය කළ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලට මුල් තැනක් ලබා දීම.

- බාහිර සම්පත් පුද්ගලයන් සහභාගි කර නොගෙන පාසලේ සිසු - ගුරු සම්පත්වලින් පමණක් සරල ව ප්‍රසංගය පැවැත්වීම.

- සරල ප්‍රසංග අංකවලින් ආරම්භ කිරීම.

- පාසල් වේදිකාව භාවිත කරන්නේ නම් ඒ සඳහා සුදුසු සැලසුමක් පිළියෙළ කර වේදිකා පරිපාලනයට කණ්ඩායමක් යෙදවීම.

- ප්‍රේක්ෂක පිරිස පිළිබඳ අවධානය යොමු කරමින් අසුන් පැනවීම.

- පිළිගැනීම වැනි කාර්යයන් සඳහා ද සිසුන් යොමු කිරීම.

එක් එක් ශ්‍රේණියට ගැළපෙන ලෙස පන්ති කාමරයේ අධ්‍යයනය කළ කොටස් ඇසුරින් ප්‍රසංග අංක සැකසීම යන කාරණය පිළිබඳ වැටහීමක් ලබා ගැනීමට පහත දැක්වෙන ක්‍රියාකාරකම් ඔබට මඟ පෙන්වනු ඇත.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පියවර 01**
- විවිධ ප්‍රසංගයකට ඉදිරිපත් වීමෙන් ශිෂ්‍යයාට ලැබෙන වාසි පිළිබඳ ව සාකච්ඡා කරන්න. (මිනිත්තු 10)

**පියවර 02**
- තෝරාගත් ප්‍රසංග අංක පුහුණු කරන්න. (මිනිත්තු 30)
- තෝරාගත් ප්‍රසංග අංක පුහුණු කරන්න. (මිනිත්තු 40)

**පියවර 03**
- කණ්ඩායම් වශයෙන් හෝ කේවල ව හෝ වේදිකාවේ හෝ පන්ති කාමරයේ හෝ සලස්වන්න. (මිනිත්තු 40)
- ස්වර නියමිත නාදස්ථාන අනුව ගායනයට යොමු කරන්න. සුදුසු අංග චලන ප්‍රාසංගික ව යොදා ගන්න. (මිනිත්තු 40)
- මෙම පන්තියට යෝජිත කොටසේ සමස්ත නිමාව ඉදිරිපත් කර අගයන්න.

(මිනිත්තු 30)

**ඇගයීම් හා තක්සේරුකරණය :**

- කණ්ඩායම් ලෙස හෝ තනි තනි ව හෝ අගය කර ලකුණු ප්‍රදානය කරන්න.

(මිනිත්තු 10)

**පසු වැඩ :**

- විවිධ ප්‍රසංගයක දී ඉටු කළ යුතු වැඩ කොටස් ලැයිස්තුවක් සිසුන් ලවා පිළියෙළ කරවන්න.
- මෙවැනි ප්‍රසංගයක් සාර්ථක ව ඉදිරිපත් කිරීමට තව දුරටත් කළ යුතු සංවිධානාත්මක වැඩ කණ්ඩායම් වශයෙන් සාකච්ඡා කරන්න.

**අතිරේක උදවු :**

- 9 වන ශ්‍රේණියට නියමිත නව නාට්‍ය ගී ඇතුළත් DVD තැටි.